# බස්නාහිර පළාතේ පළාත් සභාව

## மேல் மாகாண மாகாண சபை

## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2015 අප්‍රේල් 28** වන අඟහරුවාදා
2015 சித்திரை 28 செவ்வாய்க் கிழமை
Thuesday 28th April 2015

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.32 ට පළාත් සභාව රැස් විය.**
*மு.ப. 09.32* ***க்கு சபை கூடியது***
*The Provincial Council met at 09.32 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [Sunil Wijerathne] in the Chair*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබ සැමට සුභ උදෑසනක් වේවා. මම මුලින්ම 2015 ලැබුවා වූ සිංහල - හින්දු අලුත් අවුරුද්ද ලක්වාසී ඔබ සැමටම සුභ අලුත් අවුරුද්දක් වේවා! කියලා ප්‍රාර්ථනා කරනවා.

ඒ වාගේම විශේෂයෙන්ම පසුගියදා නේපාලයේ සිදු වූ ඒ දරුණු භූමිකම්පාව තුළින් එම රටේ ජනතාවට විශාල හානියක් සිදු වුණා. මේ වන විට 4000 කට ආසන්න සංඛ්‍යාවක් මරණයට පත් වෙලා තිබෙනවා. තවත් පිරිසක් විවිධ ආබාධවලට ලක් වෙලා තිබෙනවා. ඒ නිසා මේ වන විට අපේ රජය සහ අනිකුත් සියලුම සංවිධාන ඒ සඳහා උදව් උපකාර කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විටත් සිදු කරමින් පවතිනවා.

මම මේ අවස්ථාවේදී බස්නාහිර පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු සියලුම අමාත්‍යවරුන්ගේත්, සියලුම මන්ත්‍රීවරුන්ගේත් ශෝකය එම රටේ ජනතාවට පළ කර සිටිනවා. මම ඒ පිළිබඳව අපේ ලේකම්තුමාට උපදෙස් දෙනවා, අපේ බස්නාහිර පළාත් සභාවේ ශෝක පණිවුඩය අදාළ තානාපති කාර්යාලය හරහා එම රටට දැනුම් දෙන ලෙසට.

# සභාපතිවරයාගේ නිවේදන

## ANNOUNCEMENTS OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

*"පසුගිය 2015.04.08 වන දින සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී, 2015.05.05 දිනට නියමිත සභා රැස්වීම එදින නොපවත්වා 2015.05.12 දින පැවැත්වීමටත්,*

*2015.05.19 දිනට නියමිත සභා රැස්වීම එදින නොපවත්වා, 2015.05.26 දින පැවැත්වීමටත් සුදුසු බවට එකඟතාවයට පැමිණ තිබෙනවා. ඒ පිළිබඳව අද දින න්‍යාය පත්‍රයේ ඇතුළත් සභාවේ රැස්වීම පිළිබඳ යෝජනාවලදී ඔබතුමන්ලාගේ නිශ්චිත තීරණයක් අපේක්ෂා කරන බවද මෙලෙස මම පූර්ව දැනුම් දීමක් වශයෙන් සභාවට ඉදිරිපත් කරනවා"*

*ii*

*"2015.03.03 දින සභා සම්මත වූ අසාධාරණයට පත් නීති සිසුන්ට සාධාරණයක් ඉටු කරමින් නීති විද්‍යාලයේ අර්බුදය විසඳන මෙන් රජය වෙත යෝජනා කෙරෙන පෞද්ගලික මන්ත්‍රී යෝජනාව සුදුසු පියවර ගැනීම සඳහා අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කර තිබෙන බවත්,*

*2015.03.17 දින සභා සම්මත වූ ඉදිරි පාර්ලිමේන්තු මැතිවරණය අනුමත කර ගැනීමට නියමිත නව මැතිවරණ ක්‍රමය අනුව පවත්වන මෙන් රජය වෙත යෝජනා කෙරෙන පෞද්ගලික මන්ත්‍රී යෝජනාව සුදුසු පියවර ගැනීම සඳහා ජනාධිපති ලේකම් වෙත යොමු කර තිබෙන බවත් කාරුණිකව දැනුම් දෙනවා."*

*iii*

*"මහජන පෙත්සම් කාරක සභාවේ සාමාජිකාවක් වශයෙන් කටයුතු කරමින් සිටි සන්ධ්‍යා සිරිවර්ධන ගරු මන්ත්‍රීතුමිය වෙනුවට උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා අද දින සිට නම් කළ බව දැනුම් දෙනවා."*

# කාරක සභා වාර්තා
COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පහත සඳහන් කාරක සභා වාර්තා මම ගරු මන්ත්‍රීතුමන්ලා වෙත පිළිගන්වනවා.

i. 2015.03.13 වන දින පැවති පෙත්සම් කාරක සභා රැස්වීම් වාර්තාව

ii. 2015.04.08 වන දින පැවැති සභා කටයුතු කාරක සභා රැස්වීම් වාර්තාව සහ ගෘහ කාරක සභා රැස්වීම් වාර්තාව

***අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***

*The Hon. Chairman declared that the copies of the relevant reports are placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
PETITIONS

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, මීවනපාලන, 100 A හි පදිංචි එච්.ඩී. සිරිසේන යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, පාදුක්ක, මාවතගම, අංක 36/A 1 හි පදිංචි ඩබ්ලිව්. ප්‍රියන්ති රේණුකා යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ගරු සභාපතිතුමනි, කඩවත, රම්මුතුගල. රම්මුතුගල පාර, 488/3 හි පදිංචි එල්.ඒ. රූපා යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***

*Petitions Presented, ordered to refer to the Petitions committee*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම විශේෂයෙන්ම පෙත්සම් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කරනවා. සමහර පෙත්සම් නියමිත ලෙසට පෙත්සම් කාරක සභාවට ලැබෙන්නේ නැහැ. ඒ නිසා පෙත්සම ඉදිරිපත් කිරීමට පෙර පෙත්සම්කරුගේ අත්සන සහතික කරලා ඒ අදාළ ගරු මන්ත්‍රීතුමා මේ සභාවට ඉදිරිපත් කරන ලෙසට ඉතාමත්ම කාරුණිකව මතක් කර සිටිනවා. මොකද, ඊයේත් පෙත්සම් කාරක සභාවේදී ඒ වාගේ විධිමත් ආකාරයට ඉදිරිපත් නොකරපු පෙත්සම් හය හතක්ම තිබුණා.

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
ORAL ANSWERS TO QUESTIONS

***[සභාගත කරන ලද පිළිතුර]***
*[Tabled Answer]*

**01.**

**ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජලසම්පාදන හා ජලාපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/VI(1)/15/07)**

අ. ගරු නිමල් ලාන්සා අමාත්‍යතුමා V වන පළාත් සභා කාලය තුළ දරන ලද විෂයයන් භාර අමාත්‍යවරයා වශයෙන් තම ධූරයේ කටයුතු සඳහා විදේශ ගත වූ අවස්ථා ගණන කීයද?

ආ. විදේශ ගත වූ රට, කුමන දිනවලද? ඒ අනුව විදේශ ගතව සිටි දින ගණන කවරේද?

ඇ. එකී දිනයන්හි සහභාගි වූ වැඩ සටහන් කවරේද?

ඈ. අමාත්‍යවරයා සමඟ විදේශ සංචාර වෙනුවෙන් සහභාගී වූ අනෙකුත් අය කවුරුන්ද?

ඉ. ඒ ඒ සංචාර සඳහා වැය කළ මුදල කොපමණද?

ඊ. සංචාරයන් සඳහා වැය කළ මුළු මුදල කොපමණද?

උ. ඒ ඒ සංචාර මගින් පළාත් සභාව වෙත ලැබුණු ප්‍රතිලාභ කවරේද?

ඌ. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු උපාලි කොඩිකාර** (විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජල සම්පාදන හා ජලාපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යතුමා)

Hon. Upali Kodikara (Minister of Electricity and Power, Provincial Roads, Housing and Constructions, Water Supply and Drainage, Social Welfare, Urban and Estate Infractructure Facilities)

අ. අවස්ථා 11 කි.

ආ.

| අනු අංකය | විදේශගත වූ රට | කුමන දිනවලද? | දින ගණන | සහභාගී වූ වැඩ සටහන | වැය කළ මුදල |
|---|---|---|---|---|---|
| 1. | ජර්මනිය | 2010.02.11 සිට 2010.02.17 | දින 07 | ජර්මනියේ පැවැත් වූ කොලොන් ස්ට්‍රීට් කානිවල් වැඩ සටහනට සහභාගිවීම. | ගුවන් ටිකට්පත්, අනියම් හා යැපීම් දීමනා - 224,100/05 |
| 2. | ජර්මනිය | 2010.07.10 සිට 2010.07.20 | දින 10 | ජර්මනියේ පැවැත් වූ විශාලතම වෙළඳ ප්‍රදර්ශනයක් වන ESSEN FAIR සඳහා බස්නාහිර පළාත් සංචාරක ක්ෂේත්‍රයේ නියැලෙන්නන් සහභාගි කරවීම හා ආයෝජන අවස්ථා ලබා ගැනීම සම්බන්ධව සාකච්ඡා කිරීම | ගුවන් ටිකට්පත්, අනියම් හා යැපීම් දීමනා - 276,826/98 |
| 3. | ජපානය | 2010.09.12 සිට 2010.09.20 | දින 08 | ශ්‍රී ලංකාවේ ප්‍රයෝජනයට ගත හැකි අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ යන්ත්‍රයක ක්‍රියාකාරීත්වය අධ්‍යයනය කිරීම. ජපානයේ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කරන වැඩ සටහනකට සහභාගි වීම | ගුවන් ටිකට්පත්, අනියම් හා යැපීම් දීමනා - 340,353/12 |

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**

Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, සභාවේ කාලය ඉතිරි කර ගැනීම සඳහා පිළිතුර සභාගත කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, පිළිතුර සභාගත කරන්න.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

බොහොම ස්තුතියි. සභාගත කරනවා.

***[සභාගත කරන ලද පිළිතුර]**
*[Tabled Answer]*

| | | | | | |
|---|---|---|---|---|---|
| 4. | ජර්මනිය | 2011.03.19 සිට 2011.03.25 | දින 07 | වාර්ෂික සූපවේදීන් හුවමාරු වැඩ සටහන් සම්බන්ධිත සාකච්ඡා සඳහා සහභාගි වීම.<br>මාධ්‍ය සාකච්ඡාවක් පැවැත්වීම. | ගුවන් ටිකට්පත්, අනියම් හා යැපීම් දීමනා - 339,749/- |
| 5. | කොරියාව | 2011.07.30 සිට 2011.08.08 | දින 10 | පළාත් රාජ්‍ය සේවක නිවාස යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබන සමාගමේ ඉදි කිරීම් හැකියාව සොයා බැලීම.<br>කොරියානු නිවාස යෝජනා ක්‍රම කිහිපයක් නිරීක්ෂණය කිරීම.<br>ජීව වායු ඒකකවල ක්‍රියාකාරීත්වය සොයා බැලීම. | ගුවන් ටිකට්පත්, අනියම් හා යැපීම් දීමනා - 349,500/- |
| 6. | ඔස්ට්‍රියාව හා ජර්මනිය | 2011.12.10 සිට 2011.12.25 | දින 15 | සූපවේදී හුවමාරු වැඩ සටහන ක්‍රියාත්මක විය යුතු ආකාරය හා වෙනත් කරුණු පිළිබඳ කොලොන් නුවර නගරාධිපති සමඟ සාකච්ඡාව | ගුවන් ටිකට්පත්, අනියම් හා යැපීම් දීමනා - 776,419/80 |
| 7. | සිංගප්පූරුව | 2012.03.20 සිට 2012.03.22 | දින 03 | උපදේශක කාරක සභා ගරු මන්ත්‍රීවරුන් සමඟ වන අධ්‍යයන චාරිකාව | ගුවන් ටිකට්පත්, අනියම් හා යැපීම් දීමනා - 240,850/- |
| 8. | ජර්මනිය | 2012.07.31 සිට 2012.08.10 | දින 10 | එසන් ෆෙයාර් සංචාරක ප්‍රදර්ශනය සඳහා බස්නාහිර පළාත් සංචාරක මණ්ඩලයේ සහභාගීත්වය පිළිබඳ සාකච්ඡා කිරීම. | ගුවන් ටිකට්පත්, අනියම් හා යැපීම් දීමනා - 626,830/- |
| 9. | ජර්මනිය | 2012.10.27 සිට 2012.11.04 | දින 06 | 2013 ජර්මනියේ පැවැත්වීමට අපේක්ෂිත ලිප්සිග් සංචාරක උළෙල පිළිබඳ සාකච්ඡා කිරීම හා අදාළ සංචාරක උළලේ ශ්‍රී ලංකා කුටිය අයෝජකයින්ට වැදගත් වන අයුරින් සකස් කිරීම පිළිබඳව අදහස් හවුමාරු කර ගැනීම. | ගුවන් ටිකට්පත්, අනියම් හා යැපීම් දීමනා - 687,780/- |
| 10. | ප්‍රංශය | 2013.06.19 සිට 2013.06.27 | දින 08 | බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් එම අමාත්‍යාංශයේ උපදේශක කාරක සභා මන්ත්‍රීවරු සඳහා සංවිධානය කරනු ලැබූ විදේශ අධ්‍යයන /නිරීක්ෂණ චාරිකාව සඳහා ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ උපදෙස් පරිදි සහභාගිවීම. | ගුවන් ටිකට්පත්, අනියම් හා යැපීම් දීමනා - 752,976/- |

| | | | | |
|---|---|---|---|---|
| *11.* | *ස්විට්සර්ලන්තය* | *2013.08.06 සිට 2013.08.16 දින 09* | *සංචාරක හෝටල් ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා සොයා බැලීම හා හෝටල් සංගම් සමඟ සාකච්ඡාව නිලධාරීන් සමග දෙරටට වැදගත් වේ යැයි අපේක්ෂා කරන කරුණු සොයා බැලීම සඳහා නිරීක්ෂණ චාරිකාවකට සහභාගිවීම.* | *ගුවන් ටිකට්පත්, අනියම් හා යැපීම් දීමනා - 857,900/-* |

*ඇ. (ආ පිළිතුර බලන්න.)*

*ඈ. අමාත්‍යතුමා තනිව සහභාගි වී ඇත.*

*ඉ. (ආ පිළිතුර බලන්න.)*

*ඊ. රු. 5,473,284.95 ක් පමණි.*

*උ. බස්නාහිර පළාතේ මාර්ග හා ගොඩනැගිලි ක්ෂේත්‍රයේ සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය සඳහා අවස්ථා ලබා ගැනීම, බස්නාහිර පළාත ප්‍රධානව ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රයේ දියුණුව හා සංචාරකයින්ගේ පැමිණීම වර්ධනය සඳහා මෙන්ම ශ්‍රී ලංකාව පිළිබඳ ජාත්‍යන්තර ප්‍රතිරූපය වර්ධනය කර ගැනීම සඳහා පිටිවහලක් වීම. සුපවේදීන් හුවමාරු වැඩ සටහන යටතේ මෙරට සුපවේදීන් කිහිප දෙනෙකුට යුරෝපීය ආහාර සැකසීම පිළිබඳ අවබෝධය ලබා ගැනීම හා ශ්‍රී ලංකාවේ හෝටල් සංගම් හා යුරෝපයේ හෝටල් සංගම් අතර මනා අවබෝධයක් ගොඩනැගීම තුළින් ශ්‍රී ලංකාවට සංචාරක ක්ෂේත්‍රයේ විවිධ වාසි සහගත තත්ත්වයන් උදාවීම.*

*ඌ. -*

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, මම වරප්‍රසාදය ප්‍රශ්නයක් හැටියට මීට ප්‍රථම මෙම සභාවේදී ඔබතුමාගෙන් ඉල්ලා සිටියා. මේ සෑම අමාත්‍යවරයෙකුගේම ප්‍රශ්නයට දෙන ලද උත්තරය අඩුම තරමින් ඒ ප්‍රශ්නය අසන ලද මන්ත්‍රීවරයාගේ අතට එදා උදේ ලැබීමට සලස්වන්න කියලා. මොකද, මෙවැනි තත්ත්වයක් ඇති වුණොත් අතුරු ප්‍රශ්නයක් ඇසීමට තිබෙන අයිතිය සැහෙන්න වැළකෙනවා. ඒ අනුව ගරු සභාපතිතුමනි, මීළඟ සභා වාරයේදීවත් අන්න ඒ ඉල්ලීම තමුන්නාන්සේ ඉෂ්ට කරන්නය කියලා මම ඉල්ලා සිටිනවා. එහෙම වුණොත් මේ අතුරු ප්‍රශ්න ගොඩක් බේරෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ඒ ඉල්ලීම පිළිබඳව අපි පසුගිය සභා කටයුතු කාරක සභාවකදී දීර්ඝව සාකච්ඡා කළා. අපි අදාළ අමාත්‍යාංශවලට උපදෙස් දෙනවා. අමාත්‍යාංශ ලේකම්තුමා ඒ ප්‍රශ්නය අහන මන්ත්‍රීතුමාට පිළිතුරේ පිටපතක් ලබා දෙන්න කියලා. අපි ඉදිරියේදී ඒ කටයුතු කරනවා. අපි දැනටම සාකච්ඡා කරලා තිබෙන්නේ.

දෙවන ප්‍රශ්නය. නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ප්‍රසන්න රණතුංග** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ඉංජිනේරු සේවා, ප්‍රවෘත්ති හා වෙළඳ අමාත්‍යතුමා)
Hon. Prasanna Ranathunga (Chief Minister and the Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Government and Provincial Administration, Manpower and Employment, Engineering Services, Trade Affairs and Information)

ගරු සභාපතිතුමනි, ඒකත් සභාගත කරන්න අවසර ඉල්ලා සිටිනවා. මොකද, ප්‍රශ්න කිහිපයකටම උත්තර දෙනවා. මෙහිදී ඇමුණුම් අංක 04 පිළිබඳව විතරක් පොඩි පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. මෙතැනදී පරිත්‍යාගය කරනුයේ කවුරුන්ද කියන එකේදී මේකේ තිබෙන්නේ කුමාර වෙල්ගම ඇමැතිතුමා කියලා. එතැනදී පැහැදිලිව කියන්න ඕනෑ. එතුමාගේ ඉල්ලීම පරිදි අසෝක් ලේලන්ඩ් සමාගම විසින් කරන ලද පරිත්‍යාගයක් කියන එක සටහන් කරලා, නැත්නම් මේක අදත් දෙන්න බැරිව යනවා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

කමක් නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

එහෙමනම් සභාගත කරනවා.

*** *[සභාගත කරන ලද පිළිතුර]***
*[Tabled Answer]*

**කළුතර දිස්ත්‍රික්කයේ ඇති පාසල් අතරින්,**

***ප්‍රශ්නය :***

*අ. පාසලේ සුභසාධන කටයුතු සඳහා 2015 මාර්තු 01 වන විට බස් රථ හිමිව ඇති පාසල් මොනවාද?*

***පිළිතුර :***

*අ.*

***කළුතර කලාපය***

*කළුතර ම.ම.වි*
*තිස්ස ම.ම.වි.*
*කළුතර බාලිකා ම.ම.වි.*
*ඥානෝදය ම.වි.*
*මිරිස්වත්ත ම.ම.වි.*
*පොතුවිල ම.වි.*
*පානදුර රාජකීය ම.වි.*
*පානදුර සුමංගල පි.ම.ම.වි.*
*පානදුර සුමංගල බා.ම.ම.වි.*

***මතුගම කලාපය***

*ශාන්ත මේරි ම.වි.*
*මිහිඳු ම.ම.වි.*
*ආනන්ද ශාස්ත්‍රාලය*
*කඹුරාවල ම.වි.*
*මෙරිල් කාරියවසම් ම.වි.*
*සී.ඩබ්.ඩබ්. කන්නන්ගර ම.ම.වි.*

***හොරණ කලාපය***

*තක්ෂිලා ම.වි.*
*රාජකීය ම.වි.*
*ශ්‍රීපාලි ම.වි*
*බණ්ඩාරගම ම.ම.වි.*
*බුලත්සිංහල ම.වි.*
*ඉංගිරිය සුමනජෝති ප්‍රා.වි*

***ප්‍රශ්නය :***

*ආ. ඒවා පාසලට ලැබී ඇත්තේ කවදාද?*

***පිළිතුර :***

*ආ.*

***කළුතර කලාපය***

| | | |
|---|---|---|
| *කළුතර ම.ම.වි* | - | *2011.03.18* |
| *තිස්ස ම.ම.වි.* | - | *2014.10.27* |
| *කළුතර බාලිකා ම.ම.වි.* | - | *2013.03.25* |
| *ඥානෝදය ම.වි.* | - | *2014.03.06* |
| *මිරිස්වත්ත ම.ම.වි.* | - | *2014.05.05* |
| *පොතුවිල ම.වි.* | - | *2014.06.26* |
| *පානදුර රාජකීය ම.වි.* | - | *2009.02.26* |
| *පානදුර සුමංගල පි.ම.ම.වි.* | - | *2014.11.26* |
| *පානදුර සුමංගල බා.ම.ම.වි.* | - | *2013.03.31* |

***මතුගම කලාපය***

| | | |
|---|---|---|
| *ශාන්ත මේරි ම.වි.* | - | *2013.01.26* |
| *මිහිඳු ම.ම.වි.* | - | *2013.03.08* |
| *ආනන්ද ශාස්ත්‍රාලය* | - | *2013.01.26* |
| *කඹුරාවල ම.වි.* | - | *2014.03.14* |
| *මෙරිල් කාරියවසම් ම.වි.* | - | *2013.03.15* |
| *සී.ඩබ්.ඩබ්. කන්නන්ගර ම.ම.වි.* | - | *2013.01.26* |

***හොරණ කලාපය***

| | | |
|---|---|---|
| *තක්ෂිලා ම.වි.* | - | *2010.11.12* |
| *රාජකීය ම.වි.* | - | *2007.07.05* |
| *ශ්‍රීපාලි ම.වි* | - | *2011.09.10* |
| *බණ්ඩාරගම ම.ම.වි.* | - | *2014.12.05* |
| *බුලත්සිංහල ම.වි.* | - | *2014.03.07* |
| *ඉංගිරිය සුමනජෝති ප්‍රා.වි* | - | *2014.11.15* |

***ප්‍රශ්නය :***

*ඇ. එම බස් රථ වර්ගය සහ ඒවායේ අංක මොනවාද?*

***පිළිතුර :***

*ඇ.*

***කළුතර කලාපය***

| | | |
|---|---|---|
| *කළුතර ම.ම.වි* | - | *ලංකා අසෝක් ලේලන්ඩ් NA - 9229* |
| *තිස්ස ම.ම.වි.* | - | *ලංකා අසෝක් ලේලන්ඩ් NC - 0653* |

| | | |
|---|---|---|
| කළුතර බාලිකා ම.ම.වි. | - | ලංකා අසෝක් ලේලන්ඩ් NB - 5575 |
| ඥානෝදය ම.වි. | - | ලංකා අසෝක් ලේලන්ඩ් NB - 6671 |
| මිරිස්වත්ත ම.ම.වි. | - | ලංකා අසෝක් ලේලන්ඩ් NB - 7752 |
| පොතුවිල ම.වි. | - | ලංකා අසෝක් ලේලන්ඩ් NB - 7967 |
| පානදුර රාජකීය ම.වි. | - | ලංකා අසෝක් ලේලන්ඩ් NA - 7250 |
| පානදුර සුමංගල පි.ම.ම.වි. | - | ලංකා අසෝක් ලේලන්ඩ් NC - 1746 |
| පානදුර සුමංගල බා.ම.ම.වි. | - | ලංකා අසෝක් ලේලන්ඩ් NB - 5561 |

**මතුගම කලාපය**

| | | |
|---|---|---|
| ශාන්ත මේරි ම.වි. | - | අසෝක් ලේලන්ඩ් (WP NB 6028) |
| මිහිඳු ම.ම.වි. | - | අසෝක් ලේලන්ඩ් (WP NB 6049) |
| ආනන්ද ශාස්ත්‍රාලය | - | අසෝක් ලේලන්ඩ් (WP NB 6051) |
| කඹුරාවල ම.වි. | - | අසෝක් ලේලන්ඩ් (WP NB 7751) |
| මෙරිල් කාරියවසම් ම.වි. | - | අසෝක් ලේලන්ඩ් (WP NB 6057) |
| සී.ඩබ්.ඩබ්. කන්නන්ගර ම.ම.වි. | - | අසෝක් ලේලන්ඩ් (WP NB 6067) |

**හොරණ කලාපය**

| | | |
|---|---|---|
| තක්ෂිලා ම.වි. | - | ටාටා WP NA 8290 |
| රාජකීය ම.වි. | - | ලංකා අසෝක් ලේලන්ඩ් WP JW 2869 |
| ශ්‍රීපාලි ම.වි | - | ලංකා අසෝක් ලේලන්ඩ් WP NA 9800 |
| බණ්ඩාරගම ම.ම.වි. | - | ලංකා අසෝක් ලේලන්ඩ්WP NC 2016 |
| බුලත්සිංහල ම.වි. | - | ලංකා අසෝක් ලේලන්ඩ් WP NB 7750 |
| ඉංගිරිය සුමනජෝති ප්‍රා.වි | - | ලංකා අසෝක් ලේලන්ඩ් WP NC 1307 |

**ප්‍රශ්නය :**

ඈ. එම බස් රථ පාසලට ලැබුණේ රජයෙන්ද ආදි ශිෂ්‍ය සංගම් අරමුදලෙන්ද නැත්නම් පෞද්ගලික ධන පරිත්‍යාගයෙන්ද යන්න වෙන් වෙන්ව දක්වන්නේද?



**පිළිතුර :**

ඈ.

**කළුතර කලාපය**

| | | |
|---|---|---|
| කළුතර ම.ම.වි | - | පාසල් සංවර්ධන සමිතිය |
| තිස්ස ම.ම.වි. | - | පෞද්ගලික |
| කළුතර බාලිකා ම.ම.වි. | - | පාසල් සංවර්ධන සමිතිය |
| ඥානෝදය ම.වි. | - | පෞද්ගලික |
| මිරිස්වත්ත ම.ම.වි. | - | පෞද්ගලික |
| පොතුවිල ම.වි. | - | පෞද්ගලික |
| පානදුර රාජකීය ම.වි. | - | ආදි ශිෂ්‍ය සංගමය |
| පානදුර සුමංගල පි.ම.ම.වි. | - | පෞද්ගලික |
| පානදුර සුමංගල බා.ම.ම.වි. | - | පාසල් සංවර්ධන සමිතිය |

**මතුගම කලාපය**

| | | |
|---|---|---|
| ශාන්ත මේරි ම.වි. | - | පෞද්ගලික ධන පරිත්‍යාගයකි. |
| මිහිඳු ම.ම.වි. | - | පෞද්ගලික ධන පරිත්‍යාගයකි. |
| ආනන්ද ශාස්ත්‍රාලය | - | පෞද්ගලික ධන පරිත්‍යාගයකි. |
| කඹුරාවල ම.වි. | - | පෞද්ගලික ධන පරිත්‍යාගයකි. |
| මෙරිල් කාරියවසම් ම.වි. | - | පෞද්ගලික ධන පරිත්‍යාගයකි. |
| සී.ඩබ්.ඩබ්. කන්නන්ගර ම.ම.වි. | - | පෞද්ගලික ධන පරිත්‍යාගයකි. |

**හොරණ කලාපය**

| | | |
|---|---|---|
| තක්ෂිලා ම.වි. | - | පාසල් සංවර්ධන සමිතිය |
| රාජකීය ම.වි. | - | පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු කුමාර වෙල්ගම මැතිතුමාගේ පරිත්‍යාගයකි. |
| ශ්‍රීපාලි ම.වි | - | ආදි ශිෂ්‍ය සංගම් අරමුදලේ පරිත්‍යාගයකි. |
| බණ්ඩාරගම ම.ම.වි. | - | පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු කුමාර වෙල්ගම මැතිතුමාගේ පරිත්‍යාගයකි. |
| බුලත්සිංහල ම.වි. | - | පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු කුමාර වෙල්ගම මැතිතුමාගේ පරිත්‍යාගයකි. |
| ඉංගිරිය සුමනජෝති ප්‍රා.වි | - | පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු කුමාර වෙල්ගම මැතිතුමාගේ පරිත්‍යාගයකි. |

**ප්‍රශ්නය :**

ඉ. පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් නම් ඒ පරිත්‍යාගශීලීන් කවුද යන්න පාසල්වලට අදාළව වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද?

පිළිතුර :

ඉ.

| | | |
|---|---|---|
| කළුතර ම.ම.වි | - | |
| තිස්ස ම.ම.වි. | - | හිටපු ප්‍රවාහන අමාත්‍ය, කුමාර වෙල්ගම මැතිතුමා |
| කළුතර බාලිකා ම.ම.වි. | - | |
| ඥානෝදය ම.වි. | - | හිටපු වරාය, මහා මාර්ග, ව්‍යාපෘති අමාත්‍ය රෝහිත අබේගුණවර්ධන මැතිතුමා |
| මිරිස්වත්ත ම.ම.වි. | - | හිටපු ප්‍රවාහන අමාත්‍ය, කුමාර වෙල්ගම මැතිතුමා |
| පොතුවිල ම.වි. | - | හිටපු ප්‍රවාහන අමාත්‍ය, කුමාර වෙල්ගම මැතිතුමා |
| පානදුර රාජකීය ම.වි. | - | |
| පානදුර සුමංගල පි.ම.ම.වි. | - | හිටපු ප්‍රවාහන අමාත්‍ය, කුමාර වෙල්ගම මැතිතුමා |
| පානදුර සුමංගල බා.ම.ම.වි. | - | |

**මතුගම කලාපය**

| | | |
|---|---|---|
| ශාන්ත මේරි ම.වි. | - | හිටපු ප්‍රවාහන අමාත්‍ය, කුමාර වෙල්ගම මැතිතුමා |
| මිහිඳු ම.ම.වි. | - | හිටපු ප්‍රවාහන අමාත්‍ය, කුමාර වෙල්ගම මැතිතුමා |
| ආනන්ද ශාස්ත්‍රාලය | - | හිටපු ප්‍රවාහන අමාත්‍ය, කුමාර වෙල්ගම මැතිතුමා |
| කඹුරාවල ම.වි. | - | හිටපු ප්‍රවාහන අමාත්‍ය, කුමාර වෙල්ගම මැතිතුමා |
| මෙරිල් කාරියවසම් ම.වි. | - | හිටපු ප්‍රවාහන අමාත්‍ය, කුමාර වෙල්ගම මැතිතුමා |
| සී.ඩබ්.ඩබ්. කන්නන්ගර ම.ම.වි. | - | හිටපු ප්‍රවාහන අමාත්‍ය, කුමාර වෙල්ගම මැතිතුමා |

**හොරණ කලාපය**

| | | |
|---|---|---|
| තක්ෂිලා ම.වි. | - | |
| රාජකීය ම.වි. | - | පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු කුමාර වෙල්ගම මැතිතුමාගේ පරිත්‍යාගයකි. |
| ශ්‍රීපාලි ම.වි | - | |
| බණ්ඩාරගම ම.ම.වි. | - | පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු කුමාර වෙල්ගම මැතිතුමාගේ පරිත්‍යාගයකි. |
| බුලත්සිංහල ම.වි. | - | පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු කුමාර වෙල්ගම මැතිතුමාගේ පරිත්‍යාගයකි. |
| ඉංගිරිය සුමනජෝති ප්‍රා.වි | - | පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු කුමාර වෙල්ගම මැතිතුමාගේ පරිත්‍යාගයකි. |

ප්‍රශ්නය :

ඊ. එම බස් රථ අතරින් කවර ඒවා ධාවන තත්ත්වයේ පවතීද?

පිළිතුර :

ඊ.

| | | |
|---|---|---|
| කළුතර ම.ම.වි | - | ධාවන තත්ත්වයේ පවතී. |
| තිස්ස ම.ම.වි. | - | ධාවන තත්ත්වයේ පවතී. |
| කළුතර බාලිකා ම.ම.වි. | - | ධාවන තත්ත්වයේ පවතී. |
| ඥානෝදය ම.වි. | - | ධාවන තත්ත්වයේ පවතී. |
| මිරිස්වත්ත ම.ම.වි. | - | ධාවන තත්ත්වයේ පවතී. |
| පොතුවිල ම.වි. | - | ධාවන තත්ත්වයේ පවතී. |
| පානදුර රාජකීය ම.වි. | - | ධාවන තත්ත්වයේ පවතී. |
| පානදුර සුමංගල පි.ම.ම.වි. | - | ධාවන තත්ත්වයේ පවතී. |
| පානදුර සුමංගල බා.ම.ම.වි. | - | ධාවන තත්ත්වයේ පවතී. |

**මතුගම කලාපය**

| | | |
|---|---|---|
| ශාන්ත මේරි ම.වි. | - | ධාවන තත්ත්වයේ ඇත. |
| මිහිඳු ම.ම.වි. | - | ධාවන තත්ත්වයේ ඇත. |
| ආනන්ද ශාස්ත්‍රාලය | - | ධාවන තත්ත්වයේ ඇත. |
| කඹුරාවල ම.වි. | - | ධාවන තත්ත්වයේ ඇත. |
| මෙරිල් කාරියවසම් ම.වි. | - | ධාවන තත්ත්වයේ ඇත. |
| සී.ඩබ්.ඩබ්. කන්නන්ගර ම.ම.වි. | - | ධාවන තත්ත්වයේ ඇත. |

**හොරණ කලාපය**

| | | |
|---|---|---|
| තක්ෂිලා ම.වි. | - | ධාවන තත්ත්වයේ පවතී. |
| රාජකීය ම.වි. | - | ධාවන තත්ත්වයේ පවතී. |
| ශ්‍රීපාලි ම.වි | - | ධාවන තත්ත්වයේ පවතී. |
| බණ්ඩාරගම ම.ම.වි. | - | ධාවන තත්ත්වයේ පවතී. |
| බුලත්සිංහල ම.වි. | - | ධාවන තත්ත්වයේ පවතී. |
| ඉංගිරිය සුමනජෝති ප්‍රා.වි | - | ධාවන තත්ත්වයේ පවතී. |

## 03.

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/VI(1)/15/11)**

අ. කොළඹ අධ්‍යාපන කලාපයේ දෙමටගොඩ අනුරුද්ධ බාලිකා විද්‍යාලයේ විදුහල්පතිනියගේ විෂමාචාර කටයුතු සහ අවිධිමත් විනය විරෝධී කටයුතු නිසා පාසලේ ගුරුවරුන් හා සිසුන් අතර අසමගිය හා භේද කිරීම ඇති කර ඇති බව ඔබතුමා දන්නවාද?

ආ. මේ නිසා පාසලේ පරිපාලනයත්, දරුවන්ගේ අධ්‍යාපනයත්, කඩා වැටී ඇති බව ඔබතුමා දන්නවාද?

ඇ. මෙම විදුහල්පතිනියගේ විෂමාචාර චෝදනා රාශියක් දීර්ඝ කාලයක් තිස්ස් දිගින් දිගටම තිබියදී ඒ පිළිබඳව ගත් ක්‍රියාමාර්ග මොනවාද?

ඈ. මෙම විදුහල්පතිනියට එරෙහිව ඉදිරිපත් කර ඇති විෂමාචාර චෝදනා පිළිබඳව ඉක්මනින් අදාළ පරීක්ෂණ සිදු කර විසඳුමක් ලබා දෙනවා වෙනුවට පාසලේ හොඳින් කටයුතු කරමින් සිටින ගුරුවරුන්ට එරෙහිව විමර්ශනයක් සිදු කරන්නේ මන්ද?

ඉ. මෙම විදුහල්පතිනියට එරෙහිව විෂමාචාර සම්බන්ධයෙන් චෝදනා ඉදිරිපත් කර සැලකිය යුතු කාලයක් ගත වී තිබියදීත් ඒ සම්බන්ධයෙන් විධිමත් විනය ක්‍රියාමාර්ගයක් මෙතෙක් නොගැනීමට හේතු මෙම සභාවට ඉදිරිපත් කරනවාද?

ඊ. එසේ නොමැති නම් ඒ මන්ද?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අ. දනිමි.

ආ. නැත. පරිපාලනමය ගැටලු නිසා අධ්‍යාපන කටයුතුවලට බාධා නොවන අයුරින් කටයුතු කළ යුතු බවට ගුරු මණ්ඩලය දැනුවත් කොට ඇත. ඒ අනුව පළමු පාසල් වාර විභාගය සාර්ථකව පැවැත් වූ බව විභාග අධීක්ෂණයේදී තහවුරු විය.

ඇ. දීර්ඝ කාලයක් තිස්සේ විෂමාචාර චෝදනා ඇති බවට දිගින් දිගටම වාර්තා වී නොමැත. පැමිණිලි වාර්තා වූ දිනම විමර්ශනයක් සිදු කිරීමට කටයුතු කර ඇත.

ඈ. ගුරුවරුන් සම්බන්ධවද වෙනම පැමිණිල්ලක් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකට ලැබී ඇති බැවින් ඒ පිළිබඳවද විමර්ශනයක් කරමින් පවතී.

ඉ. චෝදනාවන්ට අදාළ මූලික විමර්ශන කටයුතු මෙතෙක් අවසන් වී නොමැති බැවින් මෙතෙක් විනය ක්‍රියාමාර්ග ගෙන නැත.

ඊ. අදාළ නොවේ.

## 04.

**හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/VI(1)/15/11)**

අ. මහරගම විද්‍යාකර බාලිකා විදුහලේ (නීලම්මහර ප්‍රාථමික අංශයද ඇතුළත්ව) දැනට සේවය කරනු ලබන ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද?

ආ. එම ගුරුවරුන් අතරින් 2014.12.31 දිනට එම විදුහලේම අවුරුදු 10 ඉක්මවමින් සේවය කරනු ලබන ගුරුවරු සිටීද?

ඇ. එසේ නම් ඒ කොපමණද?

ඈ. එසේ සිටී නම් වසර 10 ක් එකම සේවා ස්ථානයේ සේවය කරනු ලබන ගුරුවරුන් මාරු කිරීමේ ප්‍රතිපත්තිය මත ඔවුන් වෙනත් පාසල්වලට ස්ථාන මාරු නොකළේ මන්ද?

ඉ. එම ගුරුවරුන් කඩිනමින් ස්ථාන මාරු කිරීමට කටයුතු කරන්නේද?

ඊ. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අ. 157 කි.

ආ. ඔව්.

ඇ. 10 කි.

ඈ. මෙම ගුරුවරුන් සම්බන්ධයෙන් ගුරු මාරු මණ්ඩලය පහත පරිදි කටයුතු කර ඇත.

i. වසර 10 ඉක්ම වූ ගුරුභවතුන් අතුරින් 5 දෙනෙකු අවුරුදු 55 ඉක්මවන ලද අය වෙති. එමෙන්ම මින් තිදෙනෙකු 1 හා 3 ශ්‍රේණි භාරව ද කටයුතු කරති.

ii. ගුරුභවතුන් තුන්දෙනෙකුට ස්ථාන මාරු නියෝග නිකුත් කර ඇත.

iii. ගුරුභවතුන් දෙදෙනෙකු ස්ථාන මාරු කිරීමට සමාන සුදුසුකම් සහිත අනුප්‍රාප්තිකයන් නොවූ බැවින් මාරු කර නැත. ඔවුන්ගෙන් එක් අයෙකු නැටුම් උපාධිධාරී ගුරුවරියක වන අතර, අනෙක් අය 12 සහ 13 වසර සඳහා භෞතික විද්‍යාව උගන්වන විද්‍යා උපාධිධාරී ගුරුවරියකි.

ඉ. සුදුසු අනුප්‍රාප්තිකයින් ලද වහාම ස්ථාන මාරු කිරීමට කටයුතු කරනු ඇත.

ඊ. අදාළ නොවේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, අතුරු ප්‍රශ්නයක්. අනුප්‍රාප්තිකයෙකු ලබාගෙන, අවුරුද්ද 10 ට ඉක්ම වූ ගුරුවරුන් කඩිනමින් ඔබතුමා මාරු කරන්නේද?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මෙහි පැහැදිලිවම කියලා තිබෙනවා. අනුප්‍රාප්තිකයෙකු ලබාගෙන කඩිනමින් ක්‍රියාත්මක කරනවා කියලා. මොකද, අපිත් පළාත් සභාවේ ප්‍රතිපත්තිමය තීන්දුවක් අරගෙන තිබෙනවා. දස අවුරුදුවලට වඩා ඉන්න ගුරුවරුන් මාරු කරන්න ඕනැය කියලා. ඒ වාගේම ගරු සභාපතිතුමනි, ඔබතුමා මාර්ගයෙන් ගරු මන්ත්‍රීතුමා දැනුවත් කරන්නේ. සමහර පාසල්වල 10 ට වැඩි ගුරුවරුන්ව විදුහල්පතිවරුන් හංගගෙන ඉන්නවා. ඒ සම්බන්ධවත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකව දැනුවත් කරලා තිබෙනවා. එහෙම හංග ගෙන ඉන්න ගුරුවරුන් ඉල්ලුම් කරලා නොතිබුණොත්, පුරප්පාඩු පවතින තැන්වලට පසුව හෝ මාරු කිරීමට කටයුතු කරන්නය කියලා. ඒක අපි උපදේශක කාරක සභාවේදීත් ඒ තීන්දුව අරගෙන ක්‍රියාත්මක කරන්න කියලා උපදෙස් දීලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. පොඩි පැහැදිලි කිරීමක් කරන්න සිද්ධ වෙලා තිබෙනවා. සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද වරප්‍රසාද ප්‍රශ්නය පිළිබඳව. 2015.03.18 වන දින පැවැති සභා කටයුතු කාරක සභාවේදී දීර්ඝ වශයෙන් අපි ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය පිළිබඳව සාකච්ඡා කළා. එදා අපි කාරක සභාවේදී තීරණය කළේ, රීතිවල සඳහන් කාරණා සම්බන්ධයෙන් අපට විධිමත් තීන්දුවක් ගන්න බැහැ. දැනට තිබෙන රීති අනුව. ඒ නිසා එදා කාරක සභාව තීරණය කළා, දෙපක්ෂයේම ගරු මන්ත්‍රීවරු ඒකට එකඟ වුණා. රීති කාරක සභාවට ඉදිරිපත් කරලා ඉදිරියේදී රීති සංශෝධනය කිරීමේදී එම කරුණු රීතිවල ඇතුළත් කිරීම පිළිබඳව විධිමත් ක්‍රියාමාර්ගයක් ගැනීමට තමයි තීන්දු කළේ. ඒ අනුව ඉදිරි කාලය තුළ ඒ කාරණාව සිද්ධ වෙනවා.

## අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

MINISTRIES' ANNOUCEMENTS/ MINISTERS' STATEMENTS

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, පසුගිය දිනක, මම හිතන්නේ ඊයේ දවසේ, අපේ පළාත් සභා මන්ත්‍රී මරික්කාර් ගරු මන්ත්‍රීතුමා, ඉරිදා දිනයේ දහම් පාසල් පැවැත්වෙන දිනයක් බැවින් ටියුෂන් පන්ති නවත්වන්න කියලා එතුමා යෝජනාවක් ගෙනාවා. ඒක ප්‍රධාන අමාත්‍යතුමා ලාච්චුවේ දාගෙන ඉන්නවා. ඒක ක්‍රියාත්මක කළේ නැහැයි කියලා ප්‍රකාශයක් මාධ්‍යයට නිකුත් කළා. මම ඔබතුමා හරහා එතුමාව දැනුවත් කරන්න බලාපොරොත්තු වෙනවා. ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මුලින්ම මේ සභාවට ගෙනාවේ අපේ ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා. ගරු සභාපතිතුමනි, ඒ ගෙනාපු අවස්ථාවේදී අපි කමිටුවක් දාලා ඒ පිළිබඳව ටියුෂන් ගුරුවරුන් හා ආගමික නායකයින් ගෙනැල්ලා සාකච්ඡාවක් පවත්වලා ඒ කමිටු වාර්තාවත් එක්ක යම්කිසි එකඟතාවයකට ඇවිල්ලා මේ වන කොට ප්‍රඥප්තියක් සකස් කරලා තිබෙනවා. සකස් කරපු ප්‍රඥප්තිය කැබිනට් එකට යොමු කළාට පස්සේ අපි මධ්‍යම රජයෙන් ඉල්ලීමක් කරලා තිබෙනවා, පළාත් සභා සියල්ලටම පොදු වන පරිදි ජාතික ප්‍රතිපත්තියක් සකස් විය යුතු නිසා ඒ පිළිබඳව මධ්‍යම රජයෙනුත් විමසීමක් කරන්න කටයුතු කරන්න කියලා ගරු සභාපතිතුමනි. එයට අමතරව ප්‍රඥප්තියක් හදලා අපි ප්‍රතිපත්තිමය වශයෙන් එකඟතාවයක් අරගෙන ක්‍රියාත්මක කරද්දී අපට තනි තීන්දුවක් මේ පළාත් සභාවේ ගන්න බැහැ.

ප්‍රඥප්තියක් නිසා ඒක අනුමත කරන්න අවසානයේදී පාර්ලිමේන්තුවට යන්න වෙනවා. ඒ නිසා අපි මේ වනකොට වර්තමාන ආණ්ඩුවටත් අපි යොමු කරන්න කටයුතු කරලා තිබෙනවා. මෙය කරන්න කියලා අපි ජනාධිපතිතුමාගෙනුත්, අගමැතිතුමාගෙනුත් ඉල්ලීමක් කළා. පක්ෂයෙන් මධ්‍යම රජයේ ප්‍රතිපත්තිය මොකක්ද කියලා. මොකද පසුගිය රජයේ හිටපු ගරු අග්‍රාමාත්‍ය දි.මු. ජයරත්න මැතිතුමා අපට ලියුමකින් එවලා තිබුණා, කරන්න කියලා. අපි ඒ සම්බන්ධව කටයුතු කරගෙන ගියා. නමුත් වර්තමානයේ අපි ඒක වෙනස් කරන්න යනවා නම්, සහයෝගයෙන් කටයුතු කළ යුතු නිසා පාර්ලිමේන්තුවෙන් විමසීමක් කරලා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා නොදැනුවත් හෝ මේ වනතුරු ඒ ගැන කටයුතු කළේ නැහැයි කියන එක දැනුවත් කිරීමට මේ කියන්නේ. ප්‍රඥප්ති පවා මේ වනකොට සකස් වෙලා තිබෙනවා. ඒ පිළිබඳව මධ්‍යම රජයේ ප්‍රතිචාර ලැබුු වහාම ඒ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනවයි කියන එක දැනුවත් කරනවා.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

බොහාම ස්තූතියි, ගරු මහ ඇමැතිතුමා දැනුවත් කිරීම සම්බන්ධව. වයඹ පළාත් සභාවේ එය දැනට ක්‍රියාත්මක වෙනවා නේ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මේක බස්නාහිර නේ. උතුරේ ඊට වඩා දේවල් වෙනවා නේ ගරු මන්ත්‍රීතුමා. ගරු සභාපතිතුමනි, මේක පළාත් නවයක්. ඒ ඒ පළාත්වල එක එක විධියට කටයුතු කරනවා. උතුරේ මහ ඇමැතිතුමා එක විධියකට කටයුතු කරනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

එල්.ටී.ටී.ඊ. කොඩිය උස්සනවා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔව්. ඉතින් අපි එහෙම කරන්නේ නැහැ නේ මේකේ.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඔබතුමන්ලා ජාතික කොඩිය විකෘති කරලා නේ උස්සන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විවාදයකට යන්න දෙන්න බැහැ. ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකර වාඩි වෙන්න.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඔබතුමන්ලා ජාතික කොඩිය විකෘති කරනවා.

## පෞද්ගලික පැහැදිලි කිරීම්
## PERSONAL EXPLANATIONS

**ගරු සිසිර ජයකොඩි** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ගරු සභාපතිතුමනි, අපේ රටේ ඉතිහාසයේ මහ බැංකුව විසින් සිදු කරන ලද දැවැන්තම මූල්‍ය මගඩිය මේවන විට සිදු වෙමින් පවතිනවා. මහ බැංකුවේ අධිපතිවරයා, සිංගප්පූරු ජාතික අර්ජුන් මහේන්ද්‍රන් සෘජුව මැදිහත්වීමෙන් සිදු කරන ලද බැඳුම්කර මගඩිය හේතුවෙන් දැනටමත් රුපියල් කෝටි 4300 ක පමණ දැවැන්ත පාඩුවක් රජයට සිදු වෙලා තිබෙනවා කියලා ඇස්තමේන්තු කරලා තිබෙනවා. එහෙමනම් මේක මූල්‍ය අපරාධයක්. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ මූල්‍ය අපරාධ සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත් විය යුත්තේ විශේෂ මූල්‍ය අපරාධ කොට්ඨාශයයි. ඒ හැර අගමැතිවරයාගේ අන්තේවාසිකයින් විසින් සිදු කරන පරීක්ෂණයක් කිසිසේත් පිළිගන්න බැහැ. ඔවුන් කියනවා නම්, සෘජුව මහ බැංකුවේ අධිපතිවරයා සම්බන්ධ නැති බව. එසේ නම්, මූල්‍ය පාලනය පිළිබඳ ප්‍රතිපාදන යටතේ මුදල් අමාත්‍යවරයා මේ මහ මුදල් වංචාව, බැඳුම්කර නිකුතුවේ සිදු වූ මුදල් වංචාව සම්බන්ධයෙන් වගකිව යුතුයි. ඒ නිසා අපි ඉතා ඕනෑකමින් කියා සිටිනවා. මූල්‍ය අපරාධ කොට්ඨාශයට මේ මහ බැංකු අධිපතිවරයා, ඒ වාගේම මුදල් අමාත්‍යවරයා, ඒ වාගේම අග්‍රාමාත්‍යවරයා පැමිණ විය යුතුයි කියන කාරණය අපි ඉතා ඕනෑකමින් ප්‍රකාශ කර සිටිනවා.

ඒ වාගේම මෙවැනි බරපතළ මූල්‍ය වංචාවක් පැවැතියේදී මූල්‍ය අපරාධ කොට්ඨාශයට මෙවැනි කටයුත්තක් ඉදිරියට නොගෙනමින් අද කොටි සංවිධානයේ උවමනාවන් ඉෂ්ට කිරීම සඳහා රජය කටයුතු කරමින් සිටින බව පේනවා. විශේෂයෙන්ම කොටින්ගේ අවශ්‍යතාවය ඉෂ්ට කිරීම තමයි

[ගරු සිසිර ජයකොඩි - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා]

අද වන විට සිද්ධ වෙන්නේ. මහින්ද රාජපක්ෂ, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන්ලා අල්ලස් කොමිසමට ගෙන එන්නේ එතැනින් නවත්වන්න නොවෙයි. ඊට පස්සේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගෙනි යන්න, අත්අඩංගුවට ගන්න, සිර භාරයට ගන්න අවසානයේ යුරෝපා හවුලට ගෙන යන්න සිදු කරන කුමන්ත්‍රණයක පියවර තමයි මේ සිදු කෙරෙන්නේ. ඒ නිසා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව සෘජුව කොටි සංවිධානයෙන් රට මුදාගත් සැබෑ ජාතික වීරයන්ට එරෙහිව, ඔවුන්ව සිරභාරයට ගැනීම සඳහා -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ෆොන්සේකාව කුදලගෙන ගියේ කොහොමද?

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

අපි ප්‍රකාශ කළ පරිදි කටයුතු කරමින් තිබෙන බව පේනවා. ඒ නිසා මේ මහා මූල්‍ය අපරාධය -

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

හොරකම් කරපු අයද ජාතික වීරයෝ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

රාජපක්ෂලා විතරද ජාතික වීරයෝ?

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

හොරු.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

රෙදි ඇඳන්ද ඉන්නේ.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

සරත් ෆොන්සේකාව කුදලගෙන යන කොට කොහොමද?

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ගරු සභාපතිතුමනි, මුදල් අමාත්‍යවරයාට තමයි ලංකාවේ විදේශ විනිමයේ ලොකුම වංචාව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කථාව අවසන් කරන්න ගරු සංවිධායකතුමා.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ඒ ගැන පරීක්ෂණ පවත්වන්නය කියන ඉල්ලීම කරනවා.

[සභාවේ ඝෝෂා ]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, අපි දන්නවා ජනවාරි මාසයේ 08 වැනිදාට ප්‍රථම ජනාධිපති මැතිවරණයක් තියන්න කලින් -

[සභාවේ ඝෝෂා ]

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, මයික් එක ඔන් කරගෙන කෑ ගහනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. අපි දන්නවා ජනවාරි මාසයේ 08 වැනිදා පැවැති ජනාධිපති මැතිවරණයට කලින් ප්‍රධාන අපේක්ෂකයන් සියලු දෙනා ප්‍රතිපත්ති ප්‍රකාශන ඉදිරිපත් කරනු ලැබුවා. ඒ අනුව මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා යහපාලනයක් පිළිබඳ වූ ප්‍රතිපත්ති ප්‍රකාශන ඉදිරිපත් කරද්දී

එතුමාගේ ප්‍රතිත්ති ප්‍රකාශනයේ ඉතාම පැහැදිලිව කිව්වා. මේ රටේ අධ්‍යාපනය සඳහා ජාතික අයවැයෙන් 6% ක ප්‍රමාණයක් වෙන් කිරීම තමන්ගේ රජය බලයට පත් වුණාට පස්සේ කරනවා කියලා. ඒ අනුව අද වන විට අපට පෙනෙනවා, 6% ක් වෙන් කරලා තිබෙනවාද නැද්ද කියලා. 6% වෙන් කරනවා වෙනුවට අධ්‍යාපනයේ තිබෙන සම්පත් කපා දමමින් අධ්‍යාපනයේ අයිතිවාසිකම් උදුර ගනිමින් ඉන්නා බව අපට පැහැදිලිව පෙනෙනවා. ගරු සභාපතිතුමනි, අධ්‍යාපනය පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයේ තුන්වැනි පරිශිෂ්ටයට අනුව පළාත් අධ්‍යාපනය පිළිබඳ විවිධ නීතිමය තත්ත්වයන් ලියා තිබෙනවා. ඒ අනුව අධ්‍යාපනයට අදාළ ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් පත් කිරීම සහ විනය පාලනය පිළිබඳ කටයුතු කිරීමට අධ්‍යපාන අමාත්‍යාංශයට නීතිමය අවසරය තිබුණත් පළාත් පාසල් සම්බන්ධයෙන් කටයුතු කරද්දී, එය පළාතක අධ්‍යාපන ඇමැතිවරයා විමසා කටයුතු කළ යුතුයි කියන කාරණය මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ලිඛිතව සඳහන් කරලා තිබෙනවා. නමුත් අද වන විට අධ්‍යාපන අමාත්‍යාංශයට පත් වුණු පුංචි බාබා මේ රීති එකක්වත් සලකන්නේ නැතිව අධ්‍යාපනය කප්පාදු කිරීම, අධ්‍යාපනය විනාශ කිරිම සිද්ධ කරමින් තිබෙනවා. අධ්‍යාපනයට දෙනවා කියපු 6% තියා 2% ක්වත් නොදෙන තත්ත්වයක් තමයි තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, මීට ආසන්නම උදාහරණය තමයි පසුගිය දවස්වල විදුහල්පතිවරුන්ට උසස්වීම් දෙනු ලැබුවා. මේ විදුහල්පතිවරුන්ට උසස්වීම් දෙද්දී බස්නාහිර පළාතේ හිටිය පළමු ශ්‍රේණියේ විදුහල්පතිවරු උසස්වීම් ලබපු අය අතිවිශාල සංඛ්‍යාවක් ඉසුරුපායේ කඩදාසියකින් ජාතික පාසල්වලට මුදා හැරීම සිද්ධ කරලා තිබෙනවා. මේක සම්පූර්ණයෙන්ම පළාත් අධ්‍යාපනය කඩා බිඳ දැමීම සඳහා කරන ලද ක්‍රියාදාමයක්. මේකට එක උදාහරණයක් විධියට මට කියන්න පුළුවන්. ගරු සභාපතිතුමනි, පාදුක්ක සිරිපියරතන මධ්‍ය මහා විද්‍යාලය බස්නාහිර පළාතේ තිබෙන ජනප්‍රියම සහ ඉතාම හොඳ පාසලක් විධියට තිබෙන පාසලක්. මේ පාසලේ සේවය කරපු විදුහල්පතිවරයා පළමු ශ්‍රේණියේ විදුහල්පති පත්වීමක් ගත්තාට පස්සේ මහින්ද රාජපක්ෂ ජාතික පාසලේ සහකාර විදුහල්පතිවරයෙක් විධියට පත් කරලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, මහින්ද රාජපක්ෂ විද්‍යාලය ඇතුළේ අධ්‍යාපන පරිපාලන සේවයේ විදුහල්පතිවරු පස් දෙනෙක් ඉන්නවා. ඒ වාගේම ශ්‍රේණිධාරී විදුහල්පතිවරු පස් දෙනෙකුට වැඩිය ඉන්නවා. විදුහල්තිපතිවරු දහ දෙනෙකුට වැඩිය ඉන්න පාසලකට පළාත් පාසලේ විදුහල්පතිවරයා නැවත පත් කරන්නේ අධ්‍යාපනය සංවර්ධනය කරන්නද කියන ප්‍රශ්නය අපට මතු වෙනවා.

ගරු සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි. පසුගිය කාලය පුරාම මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව තිබෙන කාලයේ අයවැයෙන් වෙන් කරන ලද මුදල් අතිවිශාල ප්‍රමාණයක් අපේ පළාත් සභාවට දෙන්න තිබෙන මුදල්වලට අමතරව පළාත් පාසල් සංවර්ධනය සඳහා ලබා දුන්නා. අඩක් නිම කළ පාසල්වලට මිලියන 450 ක් වාර්ෂිකව දුන්නා. ළමා මිතුරු පාසල්වලට වෙනම මුදල් දුන්නා. වැසිකිළි කැසිකිළි හදන්න වෙනම මුදල් දුන්නා. මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර හදලා දුන්නා. එක විද්‍යාගාරයකට ලක්ෂ 750 ක් වියදම් කරලා තිබුණා. මේ දැවැන්ත මුදලක් අධ්‍යාපනයට දෙද්දී අද එක ගොඩනැගිල්ලක් හදාගන්න පුළුවන්කමක් නැහැ, අධියාපන අමාත්‍යාංශයට. ඒ සියල්ල එහෙම තිබෙද්දී විදුහල්පති ශ්‍රේණිධාරීන් අද ජාතික පාසල්වලට උදුර ගනිමින් ඉන්නවා. මේකේ අධ්‍යාපනය සංවර්ධනය කරන්න තමන්ගේ ළඟ තිබෙන කුහකකම - අපි දන්නවා, මේ රටේ අධ්‍යාපන ධවල පත්‍රිකාව ගෙනාවේ කවුද කියලා. අධ්‍යාපන ඇමැතිවරයාව ඉද්දී අධ්‍යාපන ධවල පත්‍රිකාව ගෙනැල්ලා මේ රටේ අහිංසක දරුවන්ගේ අධ්‍යාපන අයිතිවාසිකම් උදුරගන්න කටයුතු කරපු නායකයා අද මේ රටේ -

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

අගමැතිවරයා බවට පත් වෙලා තිබෙනවා. මහජන බලය නැති අගමැතිවරයා බවට පත් වෙලා තිබෙනවා. ඒ අගමැතිවරයාගේ නායකත්වය යටතේ තමයි මේ පුංචි බබා, මේ අහිංසක බබා, මේ සූප්පු බබා අධ්‍යාපන ඇමැතිවරයා බවට පත් වෙලා තිබෙන්නේ.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඒක ඉල්ලා අස් කරගන්න කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා අනවශ්‍ය ප්‍රකාශවලට යන්න එපා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඉල්ලා අස් කරගන්න කියන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

අධ්‍යාපන ඇමැතිවරයා බවට පත් වෙලා ඉන්න වේලාවේ අධ්‍යාපනයේ අයිතිවාසිකම් උදුර ගනිමින් ඉන්නවා. ඒ නිසා පළාත් පාසල්වල විදුහල්පතිවරු ජාතික පාසල්වලට අනුයුක්ත කිරීම අධ්‍යාපනයට කරන කුහකකමක්. මේ රටේ අහිංසක දරුවන්ට අධ්‍යාපනය ලබන්න තිබෙන අයිතිය උදුරා ගැනීමක්. ඒ නිසා පළාත් පාසල්වල ඉන්න විදුහල්පතිවරු බලහත්කාරයෙන් අධ්‍යාපනයේ ක්‍රමවේදයන්ට අනුකූල නැතිව මහ ඇමැතිතුමාට කියන්නේ නැතිව, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාට කියන්නේ නැතිව -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

මේ කම්බ හොරු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රකාශය -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ලේකම්තුමාට දැනුම් දෙන්නේ නැතුව පළාත් පාසල්වල ඉන්න විදුහල්පතිවරු උදුරා ගැනීම ඉතාම අසාධාරණ, ඉතාම වැරැදි , ඉතාම නින්දා සහගත -

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ ඒ අසභ්‍ය වචනයක් රටේ අග්‍රාමාත්‍යවරයාට -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඉතිහාස ක්‍රියාවක් බව කියමින්, ඒ ක්‍රියාව හෙළා දකිමින් ඔබතුමාට ස්තුවන්ත වෙමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

අපහස වන නිසා එය වහාම ඉල්ලා අස් කරගත යුතුයි කියලා කියනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒක හඬ පටය බලලා ඉවත් කරන්නම්.

[සභාවේ ඝෝෂා ]

පානදුර නගර සභාවේ සභාපතිවරයාට සහ -

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මෙතුමාගේ ප්‍රකාශ සම්බන්ධව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක මම හඬ පටිය බලලා ඉවත් කරන්නම්. පානදුර නගර සභාවේ සභාපතිවරයාට සහ මන්ත්‍රීවරුන්ට තර්ජනය කර පහරදීම පිළිබඳව ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමාට විනාඩි 03 ක කාලයක් තිබෙනවා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, පාර්ලිමේන්තුවේ ගරු කථානායකතුමා, ඒ වාගේම පළාත් සභාවේ ගරු සභාපතිතුමා, නගර සභාවේ හෝ ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා කියන්නේ ඒ සභාව මෙහෙයවන සභාවේ අධිකාරි බලයක් හිමිකොටගෙන ව්‍යවස්ථාපිත බලයක් ඇති තැනැත්තෙක්. පසුගිය කාලයේ අපි දැක්කා, පසුගිය ජනවාරි මාසයේ 30 වැනිදා වත්තල ප්‍රාදේශීය සභාවේ වුණු සිද්ධිය පිළිබඳව. වත්තල මාබෝලේ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමාට දැඩි ලෙස කරන ලද පහර දීමක් සම්බන්ධව මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා මේ සභාවේ කරුණු හෙළිදරව් කළා. ඒ පිළිබඳව පරීක්ෂණයක් වෙනවාද නැද්ද කියන කාරණාව පිළිබඳව මම දන්නේ නැහැ. නමුත් පසුගිය අප්‍රියෙල් මාසයේ 08 වැනිදා පෙ.ව. 11.00 ට පමණ පානදුර නගර සභාවේ නාගරික මන්ත්‍රීවරුන් හතර දෙනෙක්

විශේෂ සභාවක් පවත්වන අවස්ථාවේදී ඊට ඇතුල් වුණු සභාවේ රැකියාවේ නියුක්ත පිරිසක් විසින් සභාපතිතුමාට පහර දීමට උත්සාහ කරපු අවස්ථාවේ සභාපතිතුමා ඒ ස්ථානයෙන් ඉවත් කරලා මේ ප්‍රශ්නයට මුහුණ දීපු මහේෂ් ප්‍රනාන්දු කියන ගරු මන්ත්‍රීතුමාට දැඩි ලෙස පහර දීලා ඔහු නාගොඩ මහ රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබනවා. ඊට මාසයකට කලින් සභාවට ඇතුල් වුණු සභාවේම සේවකයෙක් සභාපතිතුමාට සහ - ගරු සභාපතිතුමනි, මේ කතන්දරය මේ සභාවටත් එන්න පුළුවන්. ඒ පහර දීම එක්සත් ජාතික පක්ෂයද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයද? ජනතා විමුක්ති පෙරමුණද? කියන කාරණාව නොවෙයි. සභා ගර්භයකට ඇතුල් වෙලා පහර දෙනවයි කියන එක සමස්ත සමාජයම පිළිකුල් කරන කාරණාවක්. (බාධා කිරීමක්) ගැහැණු ප්‍රශ්නය හරි, පිරිමි ප්‍රශ්නය හරි, නපුංසක ප්‍රශ්නය හරි - නපුංසක ප්‍රශ්න තිබෙනවා නේ? ඒ ප්‍රශ්න ඕනෑ එකක් විසඳගන්න පුළුවන්. ඒ සුදුසු තැනකදී. ගැළපෙන තැනකදී. සභා ගර්භයෙන් එළියේ. නමුත් සභා ගර්භයකට ඇතුල් වෙලා මහජන නියෝජිතයෙකුට පහරදීමක් සිද්ධ වෙනවා කියන එක පිළිබඳව ආයතන සංග්‍රහයේ කරුණු පැහැදිලි කිරීමක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, නගර සභාවල්වල රීති සකස් කරලා නැහැ. ගරු ඔබතුමා මෙහෙයවන මේ සභාවේ රීති පැහැදිලි කිරීම් තිබෙනවා. රීති අංක 14(1).

*"සභා ගර්භය තුළ පිට අය උදෙසා වෙන් කරන ලද ස්ථානවල සභාපතිවරයා විසින් පනවන නීතිරීතිවලට අනුව ඒ අයට සිටිය හැක."*

සභාපතිවරයාගේ අධිකාරි බලයට යටත්ව තමයි මේ සභාවේ ඕනෑ පුද්ගලයෙකුට, පිටස්තර පුද්ගලයෙකුට ඇවිල්ලා අසුන් ගන්න පුළුවන්. හැසිරෙන්න පුළුවන්. ක්‍රියා කරන්න පුළුවන්. ඒක ඉතා පැහැදිලියි. කථානායකවරයාගේ අධිකාරි බලය පාර්ලිමේන්තුව තුළත් එහෙමයි. ප්‍රාදේශීය සභා සහ පාළාත් පාලන ආයතන ඇතුළත් එහෙමයි. රීතිවල පළාත් පාලන ආයතන පිළිබඳ මහපෙන්වීමක් නැහැ. 1952 අංක 6 දරන පළාත් පාලන මණ්ඩල ආදර්ශ උප නීති පිළිබඳව පනතේ 4 වැනි වගන්තියේ සඳහන් වන්නෙත් ඒ ආකාරයටයි. මේක තමයි දැනට නගර සභාව සලකන රීතිය. මේ රීතිය අනුවත් සභාපතිවරයාගේ අධිකාරී බලයට පටහැනිව සභා ගර්භයට පිටස්තර කිසි කෙනෙකුට ඇතුල් වෙන්න විධියක් නැහැ. ගරු ඔබතුමා මගින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය යොමු කරනවා. මේ පිළිබඳව ආයතන සංග්‍රහයේ 58 වැනි පරිච්ඡේදයේ පැහැදිලි කිරීම් තිබෙනවා. තුන්වැනි ඡේදයේ. විනය කටයුතු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් අනුගමනය කෙරෙන කාර්ය පටිපාටිය. පැහැදිලි කිරීම් තිබෙනවා. ගරු සභාපතිතුමනි, 3(1)

*උක්ත 2.1 වැනි උප වගන්තියේ සඳහන් කර ඇති නිලධාරියෙකුට විරුද්ධව විනයානුකූලව ක්‍රියා කිරීමට අදහස් කර ඇති විට අදාළ අමාත්‍යාංශයේ ලේකම් විසින් අවශ්‍ය මූලික විමර්ශන කර විය යුතුය.*

කලින් මේ නගර සභාවේ සභාපතිවරයාගේ රියැදුරාට පහර දෙන්න ගිහිල්ලා, සභාපතිවරයාට මරණීය තර්ජන කරලා මේ සභාව තුළම ඉන්න සේවකයෙක් ඒ පිළිබඳව මේ සභාවේ ලේකම්වරියට කියනවා, පරීක්ෂණයක් කරන්න කියලා. මේ ලේකම්වරිය පරීක්ෂණය කළාද? සහකාර පළාත් පාලන කොමසාරිස්වරයාට ඒ පිළිබඳව දැනුම් දුන්නාද? සහකාර පළාත් පාලන කොමසාරිස්වරයාටත් මේ පිළිබඳව කටයුතු කරන්න බැරි නම් පළාත් පාලන කොමසාරිස්වරයාට දැනුම් දුන්නාද? ඒ පිළිබඳව ගත්ත විනය ක්‍රියාමාර්ගය කුමක්ද කියන එක පිළිබඳව ගරු සභාපතිතුමනි, තවමත් අපට කරුණු පැහැදිලා නැහැ. ඒ අනුව තමයි මේ සභාපතිවරයා මේ විශේෂ සභා වාරය කැඳවන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, මට තව විනාඩියක් දෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි පළාත් පාලන ආයතන ටික විසුරෝලා දෙන්නම්. එතකොට හරි නේ. විසුරුවාට පස්සෙ ප්‍රශ්නයක් වෙන්නේ නැහැ නේ?

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලයට මේ පිළිබඳව කටයුතු කිරීමට හැකි බවට

[ගරු ජගත් අංගගේ]

මේ ආයතන සංග්‍රහයේ පැහැදිලිව පැහැදිලි කිරීම් තිබෙනවා. 3.2 වගන්තියෙන් කියනවා.

*"එම නිලධාරියාට විරුද්ධව චෝදනා නැඟීමට තරම් බැලූ බැල්මට පෙනෙන ආකාරයේ හේතු සාධක ඇති බව එම මූලික විමර්ශනය මගින් හෙළිදරව් වුවහොත් ලේකම්වරයා විසින් චෝදනා පත්‍රයක් එම නිලධාරියා වෙත විධිමත්ව නිකුත් කළ යුතුයි."*

කියලා පැහැදිලිව මේ ආයතන සංග්‍රහයේ මග පෙන්වීම් තිබෙනවා. දැන් මේ මග පෙන්වීම්, මේ පොත්වල ලියලා තිබුණාට පසුගිය ඉතිහාසය පුරා නගර සභාවල්වල වුණු සිදුවීම්වලට කිසිම විනය ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ. වත්තල මාබොලේ සිද්ධියට විනය ක්‍රියාමාර්ගයක් අරගෙන තිබෙනවාද කියලා මම දන්නේ නැහැ. දෙවැනි කාරණාව. සභාපතිවරයාගේ අධිකාරී බලයට තර්ජනය කරමින් මේ සිද්ධීන්ට අදාළ අයට පරීක්ෂණ කරන්න කිව්වාම ඒ අයගේ වැඩ තාවකාලිකව තහනම් කරන්න කිව්වාම, ඒ නිලධාරියාට මරණ තර්ජනය කරනවා. මේ සිද්ධිය ආරංචි වෙලා මම ඒ ස්ථානයට ගිය වේලාවේ දුරකථනයකින් ඉතාම සැහැසි විධියට මට මරණ තර්ජනය කළා. ඉතින් මේ ආකාරයට මේ රටේ මේ ක්‍රමය පවත්වාගෙන යන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථාව අවසන් කරන්න.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ අධිකාරී බලයටත් හෙට අනිද්දාට කවුරු හරි මෙතැනට ඇවිල්ලා කියයි. සභාපතිතුමාට අල්ලගෙන ගහයි. ඒ තත්ත්වයට මේ රට ඇවිල්ලා තිබෙන්නේ. ඉතින් මෙහෙම තව ඉස්සරහාට යන්න බැහැ. මේකට විනය ක්‍රියා මාර්ගයක් ගන්නේ නැත්නම් කොහොමද කරන්නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒ නිසා තමයි වෙනස් කළේ.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ඒ වෙනස තමයි අපි මේ දකින්නේ. මේ වෙනස් වුණාට පස්සේ තමයි සේරම මඟුල්. ගරු සභාපතිතුමනි, මේවාට කර බාගෙන දිගින් දිගට ඉන්න බැහැ. මෙහෙම හිටියොත් එහෙම මේ ආයතන පවත්වන්න බැහැ. ගරු ඔබතුමා මගින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් කරුණාවෙන් ඉල්ලනවා. කරුණාකර මේවායේ පරීක්ෂණ පවත්වන්න. නිලධාරීන්ට තර්ජනය කරන එක වළක්වන්න. ඒ පිළිබඳව ආරක්ෂක අමාත්‍යාංශයෙන් හැකි නිලධාරියෙකුට මේ පිළිබඳව පැමිණිලි කරලා ඒ නිලධාරීන්ගේ ආරක්ෂාව සංවිධානය කරලා දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

එහෙම නැත්නම් කොහොමද - අපි මෙතැන ඇවිල්ලා බොරුවට කෑ ගැහුවට වැඩක් නැහැ. දවස් ගණන් තිස්සේ ඇවිල්ලා කියෝනවා. කියෝනවා. වෙන කිසි දෙයක් වෙන්නේ නැත්නම් ඒ ආයතය පවත්වාගෙන යන්න බැරි නම් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම දන්නවා, ඔබතුමාට ලොකු හිතේ වේදනාවක් තිබෙනවා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

තමන්ගේ ආයතනවල සේවය කරන්න බැරි නම් මේ රටේ තිබෙන නිදහස මොකක්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. ඔව්. ගරු මන්ත්‍රීතුමා ඔබතුමා ඉස්සෙල්ලා හිටිය සභාපතිවරයෙක් නේ. කරුණාකර මූලාසනයට අවනත වෙන්න.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මම සභාපතිවරයෙක් හැටියට, මම කරුණාවෙන් ඉල්ලා සිටිනවා. ලබන සභාව වන විට මේ පිළිබඳව අපට යම් විධියක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වේදනාව හරි. මූලාසනයට ගරු කරලා කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

අවස්ථාවක් සලසා දෙන්න කියලා දැන ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට වැඩිපුරත් කාලය දුන්නා. පෞද්ගලික පැහැදිලි කිරීම්වල කාලය සීමිතව තිබෙන්නේ. ආණ්ඩු පක්ෂයටත්. විපක්ෂයටත්. ඒ නිසා මම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම නියමිත වේලාවට අවසන් කරන්න. නැත්නම් ප්‍රශ්නයක් වෙනවා.

ඒ.ඩී. ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා. දිනූ ජනතාවගේ අරමුදල් එ.ජා.ප හිතවතුන්ට බෙදා දීමේ යහපාලන දින 100 වික්‍රමයන් පිළිබඳව අදහස් දැක්වීමට ඔබතුමාට විනාඩි 03 ක කාලයක් තිබෙනවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, යහපාලන ආණ්ඩුව ආරම්භ වෙලා දින 100 ඉක්ම යන මොහොත වන විට මේ රටේ විවිධ ක්ෂේත්‍ර මට්ටමින් ගැටලු මතු වෙලා තිබෙනවා. ඒ ගැටලුවලට ප්‍රධාන වශයෙන්ම මූලික වෙලා තිබෙන්නේ, මේ ආණ්ඩුව ලබා ගැනීම සඳහා මේ රටේ ජනතාවට අතිවිශාල පට්ටපල් කෙප්ප ඉදිරිපත් කරලා, බොරු කියලා, ජනතාව රවට්ටලා තමයි ආණ්ඩුව ආවේ. ඒ ඇවිල්ලා අද වන විට ඔවුන් කියපු දෙයට හාත්පසින්ම වෙනස්ව -

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

සමෘද්ධිය දෙගුණ වෙලා තිබෙනවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

අපට පැහැදිලියි. ඒ නිසා විශේෂයෙන්ම මම මේ වේලාවේ මතක් කරනවා. මේ රටේ දුප්පත් ජනතාව ගැන සජිත් ප්‍රේමදාස අමාත්‍යවරයා පසුගිය කාලයේ ප්‍රකාශ කළා. කථා කළා. හැබැයි, එහෙම ප්‍රකාශ කරමින් ඒ වාගේම තමුන්නාන්සේලාගේ යහපාලන ආණ්ඩුව පසුගිය ආණ්ඩුව ඇතුළේ අඩුපාඩු, වැරදි වුණා කියලා හිටපු අමාත්‍යවරු අද දණ්ගෙඩියට ගෙන යන්න, එහෙම නැත්නම් බන්ධනාගාර ගත කරන්න කටයුතු කරලා තිබෙනවා. හැබැයි,

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒ හොරු නේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඊට වඩා හොරකම් තමුන්නාන්සේලාගේ නියෝජ්‍ය නායකතුමා කරනවා. තමුන්නාන්සේලාගේ නියෝජ්‍ය නායකතුමා අමු අමුවේ දුප්පත් මිනිස්සුන්ගේ සල්ලි හොරකම් කරනවා. ඒකයි මම මේ කියන්නේ. පසුගිය කාල පරිච්ඡේදය තුළ -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමන්ලා තමයි හොරකම් කළේ. බොරු කියන්නේ නැතිව ඉන්න. දැන් ඒවා අල්ලද්දී හය වෙලා. මෙතුමාවත් අල්ලන් යයි කියලා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මේ රටේ දුප්පත් ජනතාව රුපියල් පහ, දහය එකතු කරලා හදපු සමෘද්ධි බැංකු ව්‍යාපාරය (බාධා කිරීමක්) දුප්පත් ජනතාව එකතු කළා. අද සජිත් ප්‍රේමදාස ඇමැතිතුමා -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

සමෘද්ධිය දේශපාලනය කළේ ඔබතුමා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

සමෘද්ධිය කෑවේ ඔබතුමන්ලා තමයි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මෙතුමා තමයි සමෘද්ධිය දේශපාලනය කළේ. මෙතුමා ඒකට වග කියන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ලිත් 50,000 ක් ගහලා තිබෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමා වගකියන්න ඕනෑ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, මගේ විනාඩි 03 ගන්නේ අනික් අය.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

බොරු කථා කියන්න එපා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

අහගෙන ඉන්න. අහගෙන ඉන්නවා. තමුන්නාන්සේලාගේ නායකයන් හොරකම් කරනවා. නායකයෝ අමු හොරු.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ලිත් 50,000 යි.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

(බාධා කිරීම්) ඕනෑ නම් ඇවිල්ලා සජිත් ප්‍රේමදාසට මුහුණ දෙන්න කියන්න. අපි අභියෝග කරනවා. දූප්පත් මිනිස්සු -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

සජිත් ප්‍රේමදාස ඔබතුමාට භය වෙන්න ඕනෑ නැහැ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මුදල් අද අතිවිශාල ප්‍රමාණයක් එක්සත් ජාතික පක්ෂිකයන්ගේ අවශ්‍යතා සඳහා යොදනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා දිගින් දිගටම බාධා කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මෙතුමා අපේ නියෝජ්‍ය නායකතුමාට චෝදනා කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න. ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට කාලය දෙන්න බැහැ. කරුණාකර වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

සජිත් ප්‍රේමදාස කියලා නම කියන්න -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මේ සභාව පිස්සන්ගේ කෝලම් මඩුවක් වෙලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

සජිත් ප්‍රේමදාස කියලා හොරකම් කරනවා කියලා කිව්වේ. වහාම ඒක ඉල්ලා අස් කරගන්න කියන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔව්. අමු අමුවේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක වහාම ඉල්ලා අස් කරගන්න කියන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

හොරකම් කරනවා. පැහැදිලිවම.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හොරා කියලා කියන්නේ අපේ නියෝජ්‍ය නායකතුමාට. සජිත් ප්‍රේමදාස හොරා කියලා කියන්න එතුමාට බැහැ නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමා හොරා කියලා උසාවි තීන්දුවක් දීලා තිබෙනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකර වාඩි වෙන්න. එතුමාට පුංචි කාලයක් තිබෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මොකක්ද තිබෙන චෝදනාව? චෝදනාවක් තිබෙනවාද? චෝදනාවක් නැහැ. බොරුවට නිකන් හොර රාජපක්ෂලා ආරක්ෂා කරන්න සජිත් ප්‍රේමදාසට එක එක ඒවා කියන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා අනවශ්‍ය විවාදවලට යන්න එපා. අවශ්‍ය නම් කාලය දෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හොරකම් ටික අල්ලයි කියන භයේ අද සජිත් ප්‍රේමදාසට එක එක ඒවා කියනවා. ඒකයි වෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හොරකම් ටික අල්ලයි කියලා ඔය භය වෙලා ඉන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දිගින් දිගටම බාධා කිරීම් කළා නේ. ගරු මන්ත්‍රීතුමා, කථා කරන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, ආණ්ඩුව එනකොට කිව්වේ සමෘද්ධි ලාභීන්ගේ සහනාධාරය 200% කින් වැඩි කරනවා කියලා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වැඩි කරලා තිබෙන්නේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

වැඩි කරලා තිබෙන්නේ හඳේද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ලබන මාසේ ඉඳන් හම්බ වෙනවා. භය වෙන්න එපා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා වැඩි කරපු මුදලට ඇර එක රුපියලක් මේ ආණ්ඩුව වැඩි කරලා නැහැ. එතුමා 3000 දක්වා අයවැයෙන් වැඩි කළා නම් මේ ගොල්ලෝ ඒක 9000 දක්වා වැඩි කරන්න ඕනෑ. හැබැයි, ගරු මන්ත්‍රීතුමා අද වෙන කොට එක රුපියලක්වත් වැඩි කරලා නැහැ. (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට කථා කරන්න අවස්ථාව ලබා දෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

බොරු නේ කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකර නිශ්ශබ්ද වන්න. දිගින් දිගට බාධා කිරීම් කරන්න එපා. බොරු නම් ඔබතුමා කියන්න. කාලය දෙන්නම්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරුන්ගේ නම් කිය කියා-

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර බාධා කිරීම් කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ නම් කිය කිය අපහාස කරනවා. බොරු කියනවා. වහාම ඒවා ඉල්ලා අස් කරගන්න කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා දිගින් දිගට බාධා කිරීම් කරන්න එපා. ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වහාම ඉල්ලා අස් කරගන්න කියන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, මේ වචන අහගෙන ඉන්න බැරි එක ගැන මම කනගාටු වෙනවා. හැබැයි, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන්නේ. යහපාලනය නම් ඇහුම්කන් දෙන්න ඕනෑ. මේ කියන දේවල්වලට ඇහුම්කන් දෙන්න ඕනෑ. ඇහුම්කන් දෙන්නේ නැතිව බොරුවට දඟලන්න ලැහැස්ති වෙන්න එපා. සහනාධාර ලාභීන්ගේ එක රුපියලකින්වත් මුදල් වැඩි කළේ නැහැ. හැබැයි, දුප්පත් මිනිස්සු වසර 20 ක් තිස්සේ රුපියල් 5, 10 ය ආදී වශයෙන් රුපියල් බිලියන ගණන් එකතු කළා. මෙන්න මගේ ළඟ ලියුම් තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයේ සංවිධායක. එ.ජා.ප ජන සුවය සමිතිය, කරඹකැටිය, බෙලිඅත්ත. මේ ගොල්ලෝ කියනවා මේ සියලුමදෙනා එක්සත් ජාතික පක්ෂයේ ජයග්‍රහණය වෙනුවෙන් කැප වුණු අය. මේ අයට සමෘද්ධි ණය දෙන්න කියලා. මොකක්ද මේ අයට ණය ගන්න තිබෙන අයිතිය. එක්සත් ජාතික පක්ෂයට සමාජික වුණු එක, ඡන්දය දුන්න එක, කඩේ ගිය එක විතරයි. දුප්පත් මිනිස්සු -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඔබතුමන්ලා කොහොමද කළේ? ප්‍රාදේශීය සභාවන්වලට බයිසිකල් බෙදනකොට.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

කරුණු ඇතිව ඔප්පු කරනවා. බිලියන ගණනක් එක්සත් ජාතික පක්ෂය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කාලය ඉවරයි.

[සභාවේ ඝෝෂා ]

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

බැසිල් රාජපක්ෂ ගරු ඇමැතිතුමාට වඩා බරපතළ චෝදනාවක් සජිත් ප්‍රේමදාසට තිබෙනවා.

[සභාවේ ඝෝෂා ]

ඒ නිසා අපි පැහැදිලිව කියනවා. යහපාලන කාලපරිච්ඡේදය දුප්පත් මිනිස්සුන්ව කබලෙන් ලිපට ඇදලා දැම්මා.

[සභාවේ ඝෝෂා ]

ඒ නිසා තමුන්නාන්සේලාට කිසිදු සදාචාරයක් නැහැ, දුප්පත් මිනිස්සුන්ගේ සල්ලි හොරකම් කරලා -

[සභාවේ ඝෝෂා ]

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

වාඩි වෙන්න. වාඩි වෙන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගත්තා නම් කමක් නැහැ. නිධන් භාරපුවා දුන්නාට කමක් නැහැ.

[සභාවේ ඝෝෂා ]

නමුත් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කොටින්ට සල්ලි දුන්න ඒවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාත් වාඩි වෙන්න. ගරු මන්ත්‍රීතුමා, කරුණාකර වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා ]

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. පෞද්ගලික පැහැදිලි කිරීම්වලට එපමණ කාලයක් නැහැ. විනාඩි තුන හතරයි තිබෙන්නේ.

දේශපාලන පළිගැනීම් තුළ රජයේ සේවය අකර්මණ්‍යය පිළිබඳව නිමල් ලන්සා ගරු ඇමැතිතුමාට විනාඩි තුනක කාලයක් තිබෙනවා.

**ගරු නිමල් ලාන්සා** (ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදා හැරීම, සමුපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Nimal Lansa (Minister of Transport, Sports and Youth Affairs, Women's Affairs, Food Supplies and Distribution Affairs, Cooperative Development, Domestic Economic Promotion, Fisheries, Rural Development, Tourism, Investment Promotion Coordination and Animal Production and Development)

ගරු සභාපතිතුමනි, -

[සභාවේ ඝෝෂා ]

ගරු සභාපතිතුමා සභාව නිශ්ශබ්ද කරලා දෙන්න.

[සභාවේ ඝෝෂා ]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ගරු මන්ත්‍රීතුමන්ලා නිශ්ශබ්ද වන්න. පෞද්ගලික පැහැදිලි කිරීම් සඳහා මන්ත්‍රීවරයෙකුට විනාඩි තුනයි, හතරයි තිබෙන්නේ. ඒ අවස්ථාව ගන්න එපා. අපරාදේ.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, මම මේ සභාවට පෙන්වලා දෙන්න යන්නේ විශේෂයෙන් රාජ්‍ය සේවාවේ නිලධාරීන් මම හිතන්නේ අප්‍රේල් මාසයේ 22 වැනිදා පෙට්ටියට තියලා ඇණ ගැහුවා කියලා කිව්වා නම් ඒක නිවැරැදියි කියලා මම හිතන්නේ. මොකද, කැබිනට් එකේ සාමූහික තීන්දුවක් මත ගත්තු තීන්දු ක්‍රියාත්මක කරන්න යෑමේදී රාජ්‍ය නිලධාරීන්ට අපරාධ කොට්ඨාශයට එන්න කියලා අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා සමඟ කඩුවෙල මහේස්ත්‍රාත් උසාවියට දාලා රිමාන්ඩ්ගත කිරීම සිද්ධිය ගත්තාම - අද අපට හිතෙනවා, මේ රාජ්‍ය සේවාව මේ කොහාටද ගෙනි යන්න හදන්නේ කියලා. කැබිනට් එකෙන් ගත්තු තීන්දුවක් ක්‍රියාත්මක කරපු නිලධාරීන් ඉතාමත් කීර්තිමත් නිලධාරීන් තුන් දෙනෙක් අද වෙද්දී රිමාන්ඩ් ගත කරලා තිබෙනවා. චෝදනාව මොකක්ද? (බාධා කිරීමක්) මේක ඔබතුමා ලස්සනට අහගන්න කෝ. පාරිතෝෂික මුදල්, ගෙවිය යුතු මුදල් ගෙවීම පිළිබඳව. භාණ්ඩාගාරයෙන් මුදල් එන්න ඉස්සෙල්ලා. ඕක නේ චෝදනාව. එක. මම චෝදනා තුන කියන්නම්. දෙක, -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මේ උසාවියේ තිබෙන දෙයක් කථා කරන්නේ.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

තමුන්නාන්සේගේ වැඩක් බලාගෙන ඉන්නවා කෝ. මෝඩයෙක් වාගේ කථා කරන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නැහැ. නැහැ. මෙතන කථා කරන්නේ. උසාවියේ තිබෙන එකක් නොවෙයි.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මේ පිස්සෙක් නේ. හැම එකකටම පනින්නේ. මොකෙක්ද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක උසාවි නියෝගයක් -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

තාත්තා ගැන කිව්වේ නැහැ. කට වහගෙන ඉන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා උසාවි නඩුකාරයා වෙන්න හදන්න එපා. ඒකට උසාවිය තීන්දුවක් දෙයි.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, මේක තවමත් උසාවි දාලා නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, -

[සභාවේ ඝෝෂා ]

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න කෝ. මගේ මතය ප්‍රකාශ කරන්න. මටත් මතයක් තිබෙනවා නේ ප්‍රකාශ කරන්න. කරුණාකර නිශ්ශබ්ද වන්න කෝ. ගරු ඇමැතිතුමා, ඔබතුමා මගෙන් ඉල්ලා සිටියේ දේශපාලන පළිගැනීම් තුළ රාජ්‍ය සේවය අකර්මණ්‍ය පිළිබඳව වන කාරණාව.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

ඒක තමයි මම කියන්න හදන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මේ උසාවියේ නඩු -

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, මගේ අදහස් ටිකවත් ප්‍රකාශ කරන්න ඉඩ දෙනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. අපි අවස්ථාව දෙන්නම්. නමුත් ඔබතුමා අධිකරණයේ විභාග වන ඒවාට යන්න එපා. ඔබතුමා වෙන වෙන කාරණා කියනවා නේ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, මම පැහැදිලිවම කිව්වේ රාජ්‍ය සේවාව පෙට්ටියට තියලා ඇණ ගහලා තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේ බලන්න. අපේ ගම්වල පාරක් හැදෙන්නේ නැහැ. කිසිම සංවර්ධනයක් නැහැ. ඇයි ඒ. රාජ්‍ය සේවාවට ඒ කැබිනට් එකෙන් ගත්ත තීන්දුව ක්‍රියාත්මක කිරීමේදී හිරේ යන්න සිදු වෙනවා නම්, මේ අයව හිරේ අච්චු කරනවා නම් ඉස්සරහාට මේ රාජ්‍ය සේවාව මේ විධියට යන්න බැහැ. ගරු මන්ත්‍රීතුමා මේකේ ප්‍රශ්නය A ද B ද C ද නොවෙයි. මෙය පැහැදිලිව තේරුම් ගන්න. මේක කවුරු ඇමති වුණත්, කවුරු නිලධාරීන් වුණත් මේක පැහැදිලිව තේරුම් ගන්න. මේ ක්‍රමයට මේ රට සංවර්ධනය කරන්න බැහැ. ජනාධිපතිතුමා හෙට උපදෙසක් දුන්නත්, අගමැතිතුමා හෙට උපදෙසක් දුන්නත් මේ නිලධාරීන් (බාධා කිරීම්) - මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා තමුන්නාන්සේ කථා කරද්දී මම බාධා කරන්නේ නැහැ. තමුන්නාන්සේ මට බාධා කිරීම් කරන්න එන්නත් එපා. මම කියන දේ පැහැදිලිව අහගන්න. මම කථා කරන්නේ මේක A ද B ද C ද නොවෙයි. මේ සාමූහිකව ගත්තු තීන්දුවක් ක්‍රියාත්මක කිරීමේදී නිලධාරීන්ට හිරේ යන්න සිදු වෙනවා නම් මම හිතන්නේ නැහැ, ගරු සභාපතිතුමනි මේ රට ඉදිරියට යයි කියලා. ඒ නිසා මම පැහැදිලිවම මේ සභාවෙන් ඉල්ලා සිටින්නේ. මේ වෙනුවෙන් අපි - පුද්ගලයා අදාළ නැහැ. නිලධාරියා අදාළ නැහැ. කවුද කළේ කියන එක මේ වෙනුවෙන් සාධාරණව කල්පනා කරන්න ඕනෑ කාලයක් ඇවිල්ලා තිබෙනවා. ඉතින් මෙතුමන්ලා විශේෂයෙන් මම දැක්කා කිව්වා, දෙවැනි චෝදනාව දුප්පත් පවුල්වලට රුපියල් 2500/- ක් ලබා දීලා තිබෙනවා. මේක වැරැදිද? දුප්පත් පවුලකට රුපියල් 2500/- ක් ලබා දීම වැරැදිද? කොයි අමාත්‍යාංශයද ලිත් ගහන්නේ නැත්තේ? කොයි අමාත්‍යාංශයද ඩයිරි ගහන්නේ නැත්තේ. 2004 රනිල් වික්‍රමසිංහ මහත්මයාත් ලිත් ගහලා තිබෙනවා. අපි ගාව ඒ ලේඛන තිබෙනවා. මම ඒක වැරැදියි කියන්නේ නැහැ. මම කොහෙවත් වැරැදියි කියන්නේ නැහැ. මම දන්නවා, අමාත්‍යාංශවල වැඩ කරද්දී, දෙපාර්තමේන්තුවල වැඩ කරද්දී ඒ ඇමැතිවරු, ඒ නිලධාරීන් වැඩ කරන ආකාරය. මේකේ කවුරු හරි හොරකම් කරලා තිබෙනවා, සමෘද්ධි සල්ලි මේ නිලධාරීන් හොරකම් කරලා තිබෙනවා නම්, මේ පාරිතෝෂිකය අදාළ නිලධාරියාට ගෙවන්නේ නැතිව හොරකම් කරලා තිබෙනවා නම් අන්න හිරේ ඇරියාට කමක් නැහැ. මේ හිරේ අරින්නේ ඇයි? වෙලා තිබෙන වරද මොකක්ද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

හය වෙලා.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

අපි හය නැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා හිරේ ඇරීමක් නොවෙයි. රිමාන්ඩ් කිරීමක් තිබෙන්නේ. කවුරු හරි නිලධාරී වෙන්න පුළුවන්. තවම හිරේ දාලා නැහැ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

රිමාන්ඩ් ගත කරලා තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඉස්පිරිතාලේ ඉන්නේ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඉතාමත් කරුණාවෙන් අහගන්න. ඔය ආණ්ඩුවේ කාලය දැන් ඉවරයි. දවස් 100 ඉවරයි. ආණ්ඩුව ඉල්ලා අස් වෙන්න කියන්න. ගරු සභාපතිතුමනි, මම මේක පැහැදිලිව කියන්නේ හොරකම් කරලා තිබෙනවා නම් නිලධාරීන් හිරේ ඇරියාට කමක් නැහැ. අනුන්ගේ මුදල් වංචා කරලා තිබෙනවා නම් හිරේ ඇරියාට කමක් නැහැ. මේ විධියට බොරු චෝදනා දාලා - මොකද රාජ්‍ය සේවාව තුළ තිබෙනවා වරදක් කරලා තිබෙනවා නම් අනුගමනය

[ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා]

කරන්න ඕනෑ ක්‍රියාමාර්ග. අභ්‍යන්තර විගණනය තිබෙනවා. රාජ්‍ය විගණනය තිබෙනවා. ඊට පස්සේ කෝප් එකට දාන්න පුළුවන්. එතැනින් කථානායකතුමා හරහා පොලිසියට දැනුම් දෙන්න පුළුවන්. මේ ක්‍රමවේදය මොකක්ද? මේ ක්‍රමවේදයෙන් වෙන්නේ රාජ්‍ය සේවාව කඩාගෙන වැටෙනවා. රටේ සංවර්ධනය කඩාගෙන වැටෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම පැහැදිලිව ඉල්ලා සිටිනවා. මේ පිළිබඳව අපි සියලු දෙනා පුද්ගලයන් A ද B ද C ද කියලා නැහැ. මේවා සියල්ලම අමතක කරලා කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිමින්, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් අපි ස්තුතිවන්ත වෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

සරත් ෆොන්සේකාට කරන කොට හොඳයි.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

තමුන්නාන්සේ කට වහගෙන ඉන්න කෝ.

[සභාවේ ඝෝෂා ]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නීතිය ක්‍රියාත්මක කිරීමේදී බලපෑම් සිදු කිරීම හා ජනමාධ්‍ය කාර්ය භාරය පිළිබඳව රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රිතුමියට විනාඩි 03 ක කාලයක් තිබෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, ස්තුතිවන්ත වෙනවා අවස්ථාව ලබා දීම පිළිබඳව. ඇත්ත වශයෙන්ම මේ සභාවේදී ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා කථා කළා. ජගත් අංගගේ හිටපු අමාත්‍යතුමා. ඇත්ත වශයෙන්ම නීතිය ක්‍රියාත්මක කිරීමේදී යම්කිසි ක්‍රමවේදයක්, පිළිවෙලක් තිබෙන්න ඕනෑ කියන එක පිළිබඳව. ඒ ඔබතුමන්ලාගේ අදහසට අපිත් එකඟ වෙනවා. දැන් තමුන්නාන්සේලා සියලු දෙනාටම අවශ්‍ය වෙන්නේ මේ රටේ ජනතාව වෙනුවෙන් යම්කිසි සේවයක් කරන්න. ඒ වාගේ යම්කිසි වැදගත් කාර්ය භාරයක් ඉටු කරන ඕනෑම පුද්ගලයෙකුට විරුද්ධව යම්කිසි නීති ක්‍රියා මාර්ගයක් ගන්න කොට හරියට ගන්න ඕනෑ. ඒකට අපි සියයට සියයක් එකඟයි. දැන් මම සභාවේ අවධානය යොමු කරනවා, ඇත්ත වශයෙන්ම මේ රටේ යම්කිසි වැරැද්දක්, අකටයුත්තක් වෙලා තිබෙනවා නම් ඒ සම්බන්ධව ප්‍රකාශයක් ලබා ගන්න යම් පුද්ගලයෙකුට එන්න කිව්වාම අපේ උත්තරීතර පාර්ලිමේන්තුවේ කටයුතු අවසන් කරලා තියෙද්දී, බිම දිගා වෙලා ඒවාට විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. එතකොට මේ මෙතුමන්ලා ඉල්ලන නීතියම තමයි, ඒක එහෙම කරන්න එපා කියලා අනෙක් පැත්තට වාඩි වෙන්නේ. අපි කියන්නේ, මේ දෙකම වැරැදියි. එහෙම නම් ඇමැරිකාවේ ජනාධිපතිට වුණත් ප්‍රකාශයක් ගන්න එන්න කිව්වොත් එයා බිම නිදාගන්න යන්නේ නැහැ. එයා ප්‍රකාශයක් කරනවා. මීට වැඩිය විශාල රාජ්‍යවල. නමුත් අපේ රටේ ප්‍රකාශයක් ගන්න බැහැ. එහෙම නම් මෙතැන ඉන්න ඕනෑම කෙනෙකුට නීතිය ක්‍රියාත්මක වීමේදී බලපාන ඒ ක්‍රමවේදය හරියට තියෙන්න ඕනෑ. යම්කිසි ප්‍රකාශයක් ලබා ගන්න බැරිකමක් නැහැ. අපි කියන්නේ ඔබතුමන්ලා නීතිය හරියට ක්‍රියාත්මක කරන්න කියනවා නම් අපිත් සියයට සියයක් ඒකට එකඟයි. ඒක නිසා තමයි සමහර වැරැදි කළා කියන අමාත්‍යවරු ලංකාවට ගොඩ බහිනකොට ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගේ ගෞරවණීය අවධානයට යොමු කරනවා. හොරකම් කළා කියන සමහර ඇමැතිවරු ලංකාවට ගොඩ බහිනකොට අපි කිසිම විරුද්ධත්වයක් ප්‍රකාශ කළේ නැහැ. එක කාලයක් තිබුණා එයාර් පෝට් එකෙන් බහිනකොට පාරවල් හරස් කරනවා. අපි ඒවා කළේ නැහැ. අපි නීතියට ඉඩ දීලා බලාගෙන හිටියා. නීතිය හරියට ක්‍රියාත්මක කරන්න දීලා බලාගෙන හිටියා. නමුත් මේ නීතිය ක්‍රියාත්මක කරන්න කියන මේ මන්ත්‍රීවරුම තමයි, මේ අයගේ කණ්ඩායමක් තමයි පාර්ලිමේන්තුවේ දිගා වෙලා ඒ ප්‍රකාශය ගන්න එපා කිව්වේ. එතකොට මොකක්ද, කථානායකවරයා කවුද? ඒ ප්‍රකාශය ගන්න තැනැත්තාගේ නැකම මොකක්ද? එතකොට බලපෑම තියෙන්නේ කොහේද? එහෙම නම් මේ සියලු ක්‍රියා මාර්ග නිවැරදි වෙන්න ඕනෑ. මේ එක පැත්තක් ගැන කියන කථාවක් නොවෙයි. කොයි පැත්තත් නිවැරදි වෙන්න ඕනෑ. එම නිසා අපි සමෘද්ධි ගැන කථා කළත්, කොයි දේවල් ගැන කථා කළත් ගරු සභාපතිතුමනි, මම අවධානය යොමු කරන්නේ මේ කබරගොයා තලගොයා කර ගන්න අපි කවුරුත් උත්සාහ ගන්න ඕනෑ නැහැ. එහෙම නම් මේ රටේ උත්තරීතර නීතිය හදන තැනක් මේ විධියට ක්‍රියාත්මක වෙනවා නම් ඇත්ත වශයෙන්ම අපි ඒ ගැන කනගාටු වෙනවා. මේ තත්ත්වය නිවැරදි කර ගන්න අපි සියලු දෙනාට යුතුකමක් තිබෙනවා. අපට වුණත්, මේ මහ

ඇමැතිතුමාට වුණත්, ඔබතුමාට වුණත් ප්‍රකාශයක් කරන්න එන්න කිව්වා නම් අපට ගිහිල්ලා ප්‍රකාශයක් කරන්න පුළුවන්. ඒකට යම්කිසි නීති පද්ධතියක් තිබෙනවා. අඩු වශයෙන් කවුරු හරි වැරැදියට ක්‍රියාත්මක කරනවා නම් නීතිඥවරු ඉන්නවා කථා කරන්න. ඒ සඳහා යුක්තිය ඉෂ්ට කර ගන්න ක්‍රමවේදයක් තිබෙනවා. මේ විධියට ගියොත් මේක විහිළුවක් බවට පත් වෙනවා. ඒ නිසා අපි සියලු දෙනාම අවධානය යොමු කරන්න ඕනෑ.

විශේෂයෙන්ම ජනමාධ්‍ය සම්බන්ධයෙනුත් යමක් කියන්න ඕනෑ. මොකද, සමහර ජනමාධ්‍ය එක එක පක්ෂවලට ගැතිව කටයුතු කරනවා. අද අපි ජනමාධ්‍ය නිදහස දීලා තිබෙනවා වාගේම ඒකත් අයුතු විධියට ප්‍රයෝජනයට ගන්නවා. නමුත් අපි කියන්නේ මේ සියලු දෙනාම නීත්‍යානුකූලව හරියට වැඩ කළොත් තමයි මේ රට ඉස්සරහාට ගෙනියන්න පුළුවන් වෙන්නේ කියමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, මම පළමුකොට සිසිර ජයකොඩි ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමාටයි, මහේෂ් අල්මේදා මන්ත්‍රීතුමාටයි මගේ කථාව නවත්වලා කාලය දෙනවා Treasure Bond ගනුදෙනුව මේ සභාවට විස්තර කරන්න පුළුවන් නම් කොහොමද Bit කරන්නේ? කොහොමද ගන්නේ? කවුරු හරහාද එන්නේ? මේක මේ සභාව දැනුවත් කරන්න පුළුවන් නම් ඔය පුටු දෙකෙන් නැඟිටලා මම මගේ කාලය දෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ලොබි එකේදී හම්බ වෙන්න. පාඩම කියලා දෙන්නම්.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, මෙතැන ඉන්නවා පක්ෂ කාර්යාල විකුණපු අය. පක්ෂ කාර්යාල ටවුන්වල විකුණලා සල්ලි ගත්තු අයියලා. ඒ ඉතිහාසය අපි අමතක කරමු. ගරු සභාපතිතුමනි, මගේ ප්‍රශ්නය තිබෙන්නේ මගේ මිත්‍ර උදය ගම්මන්පිල මැතිතුමා දෙරණ රූපවාහිනියට ඇවිල්ලා කිව්වා, එතුමා කරපු - පන්සිල් පද පහම නොකඩන පවුලක් වෙනුවෙන් කරපු උද්ඝෝෂණයක එතුමා එක්තරා කොඩියක් අතේ තියාගෙන හිටියා. මම ඒක ජාතික කොඩිය කියලා පාවිච්චි කරන්නේ නැහැ. මම ඒකට කියන්නේ කුඩ කොඩියක් කියලා. එතුමා කිව්වා, ඒ කොඩිය එතුමාට දුන්නේ NGO එකකින් කියලා. මගේ මිත්‍රයා. මම දෙරණ රූපවාහිනියේ දැක්කා. ඒ නිසා මම කනගාටු වෙනවා මගේ මිත්‍රයා, සැබෑ සිංහල බෞද්ධයා NGO ආශ්‍රය කිරීම පිළිබඳව. NGO ආශ්‍රය කිරීම පිළිබඳව. හැබැයි එතුමා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සභාවෙන් පැනලා ගියාද?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

නැහැ, සභාවේ - ඒ නිසා එතුමා ගරු සභාපතිතුමනි, -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්. ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ අවධානය යොමු කරනවා රීති අංක 36 (7) පිළිබඳව. සභාවේ මන්ත්‍රීවරයෙක් සභාවේ නොමැති වෙලාවක එම මන්ත්‍රීවරයා ගැන වැරැදි දෙයක් ආරෝපණය වන විධියට ප්‍රකාශයක් කරන්න බැහැ. සභා රීතිවලට අනුව මෙතුමාට මේ කාරණාව කථා කරන්න දෙන්න බැහැ. සභා රීතිය ගැන අවධානය යොමු කරන්න. 36 (7).

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, මම මතු කරන්නේ රටේ සිදු වුණු සිදුවීමක් සම්බන්ධයෙන් සහ මේ රටේ මාධ්‍යයෙන් ප්‍රචාරය කරපු සිදුවීමක් සම්බන්ධයෙන්. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම මගේ මිත්‍රයාගෙන් ඉල්ලා සිටිනවා කරුණාකරලා ළඟම පොලීසියට ගිහිල්ලා - එතුමා කියනවා නම්, NGO එකකින් දුන්නා කියලා. එතුමා ඒ NGO එකේ නම දැනගන්න ඕනෑ. කවුද දුන්න NGO එක කියලා. ඒ නිසා කරුණාකරලා -

**ගරු සුනිල් ජයමිණි**
Hon. Sunil Jayamini

ගරු සභාපතිතුමනි, වැරැදි ප්‍රකාශයක් කරන්නේ. මේ කොඩිය පිළිගන්නේ නැති කොඩියක්ද?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඉන්නකෝ? ඉවර නැහැ නේ කියලා.

**ගරු සුනිල් ජයමිණි**
Hon. Sunil Jayamini

පිළිගන්නේ නැති කොඩියක්ද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔය Photo Copy එකක්.

**ගරු සුනිල් ජයමිණි**
Hon. Sunil Jayamini

මේක Photo Copy යක් නොවෙයි. ලංකාවම පිළිගත්තු කොඩියක්. මුද්දර කාර්යාංශයෙන් නිකුත් කරපු කොඩිය මේක.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, මම මේ අවස්ථාවේ මගේ මිත්‍රයාට කියන්නේ මම ජාතික කොඩිය කියලා කිව්වාද? ඔබතුමා ඇහට ගන්න එපා. ඔබතුමාත් ගියා එකේ. ඔබතුමාත් ඉන්නවා. ඔබතුමාත් අධිකරණ නඩු තීන්දුවේ ඉන්නවා. පොඩ්ඩක් ඉන්න කෝ? ගරු සභාපතිතුමනි, මේකයි කාරණය. ඔය කොඩියම නුවරට ගෙන ගියා. ඔය කොඩියම නුගේගොඩ හන්දියට ගෙනාවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ රටේ ජනතාව දැන ගන්න ඕනෑ මේ කොඩිය කවුද නිෂ්පාදනය කළේ? කොයි සමාගමද? චීනයෙන්ද ගෙනාවේ? ආනයනය කරපු පුද්ගලයා කවුද? එහෙම නම් මේ කොඩිය ලංකාවේ නිෂ්පාදනය - මේ උත්සවයට විතරක් පාවිච්චි කරන සුවිශේෂ කොඩිය කොහෙන්ද? මේවා අපි දැන ගන්න -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඒ පිළිබඳව -

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, ඊට අමතරව මේ රටේ ජාතික කොඩියක් තිබෙනවා. ඒකේ වර්ණ දෙකක් ඉවත් කරලා, මේ හදන්නේ 56 ජාතික ගීය වෙනස් කළා වාගේ අලුත් ක්‍රීඩාවක් හදාගෙන, මිය ගිය අප්පච්චිගේ නීත්‍යානුකූල කොඩියද මේ ගේන්නේ කියන කාරණය අපි අහන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම මගේ මිත්‍රයාගෙන් ඉල්ලා සිටිනවා. උගතෙක්, නීතිඥයෙක්, කොඩියක් අතට ගන්න කොට එතුමා අපට ජාතික කොඩියක් දුන්නා.

**ගරු සිසිර ජයකොඩි** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දිගින් දිගටම මන්ත්‍රීවරුන්ගේ නම කියලා ද්වේශ සහගත ලෙස කථා කරන්න එපා. ඒක මේ රීතිවල තිබෙනවා. 36 (7)

**ගරු සිසිර ජයකොඩි** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

හරි, හරි. දෙන්න, දෙන්න. මේ මහ බැංකුවේ ඩීල් එක.

**ගරු සිසිර ජයකොඩි** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

අපේ සභා රීති සංග්‍රහයේ 67 (7) රීතියේ තිබෙනවා, "*කිසියම් මන්ත්‍රීවරයෙකු අධිකරණයක විනිශ්චයට භාජනය වී ඇති කරුණක් සම්බන්ධයෙන් හෝ අධිකරණ තීන්දුවක් අපේක්ෂා කරන කරුණක් සම්බන්ධයෙන් හෝ සාකච්ඡා කිරීම හෝ හැඟවීම් කිරීම නොකළ යුතුය.*" ඔය කරුණ සම්බන්ධයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමා -

[සභාවේ ඝෝෂා]

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

නිමල් ලාන්සා ඇමතිතුමාටත් කියන්න තිබුණා නේ?

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

කරුණාකරලා නවත්වන්න කියන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඇයි නිමල් ලාන්සා ගරු ඇමැතිතුමාට කිව්වේ නැත්තේ?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, මම ගියපාරත් කිව්වා මම නිතීඥයෙක් නොවීම ගැන සතුටු වෙනවා කියලා. මේ නීතිඥ මහත්මයාට මම කියනවා අධිකරණයේ ඇති කරලා තිබෙන නඩු විත්තකේ ජාතික කොඩියක් නැහැ. ඒකේ තියෙන්නේ අධිකරණයට අපහාස කිරීම. ඔබතුමා දන්නේ නැත්නම් - ඔබතුමා අලුත්කඩේද ගියේ, එහෙම නැත්නම් පරණකඩේද ගියේ? ඔබතුමා අලුත්කඩේද ගියේ? පරණකඩේද ගියේ? මෙතුමා තවම පරණකඩේ -

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

පැමිණිල්ලක් ඉදිරිපත් කරලා තිබෙනවා. සිතාසි භාර දීලා තිබෙනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඒ දීලා තියෙන්නේ අධිකරණයට අපහාස කිරීම. ගරු සභාපතිතුමනි, ඩලස් අලහප්පෙරුම මහත්මයා සමාව ගන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා සමාව ගන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා ද්වේශ සහගත ප්‍රකාශ කරන්න එපා. ඒක සභා රීතිවල තිබෙනවා. ඔබතුමාගේ කාලයත් අවසන්.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඇහෙන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මෙතුමන්ලා කථා කරන්න දුන්නේ නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථා කළා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

නැහැ, නැහැ. අඩු කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම Time Out නැහැ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

Half Time නැද්ද? ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා සමාව ගන්නවා. එතුමා මේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා දිගින් දිගටම සභාවේ මන්ත්‍රීවරුන්ට වැරදි සහගත, ද්වේශ සහගත ප්‍රකාශ කරන්න එපා. ඒක සභා රීතිවල තිබෙනවා. දැන් ඔබතුමාගේ කාලයත් අවසන්.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

නැහැ ඉතින් මේගොල්ලෝ කථා කරන්න -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. ඔබතුමා කථා කළා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

නැහැ. අඩු තරමේ හාෆ් ටයිම් එක්ක දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම මුකුත් නැහැ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

එහෙම නම් තර්ඩ් අම්පයර්ට දාන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කරුණාකරලා වාඩි වෙන්න. මම පැහැදිලිව කියනවා, -

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මගේ කථාව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. නැහැ. ඔබතුමා කථා කළා, විනාඩි තුනක් අරන්. ඊට වැඩිය කථා කරන්න බැහැ.

ඒ වාගේම මම ඉතාමත් ගෞරවයෙන් ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා, 67(8) රීතිය යටතේ වැරදි සහගත, ද්වේෂ සහගතව ගරු මන්ත්‍රීවරුන්ට යම් යම් ප්‍රකාශ කරන්න එපා. ඒක කරන එක හොඳ නැහැ. ඒක රීතිවල පැහැදිලිව තිබෙනවා. මීළඟට නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ගරු සභාපතිතුමනි, අපි කවුරුත් මේ පවතින 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අනුගමනය කිරීම සඳහා බැඳී සිටිනවා. ඒ නිසා මේ පළාත් සභාවට පත් වන ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනාම හතර වන උප ලේඛනය අනුව ශ්‍රී ලංකා ජනරජයට පක්ෂපාත වන බවට ද, මගේ උපරිම ශක්ති ප්‍රමාණයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කොට අනුගමනය කරන බවට ද ගෞරව බහුමානයෙන් යුක්තව ප්‍රකාශ කොට ප්‍රතිඥා දෙමි හෝ දිවුරුම් දෙමි කියලා අපි දිවුරලා ප්‍රතිඥා දීලා තමයි මෙතැනට ආවේ. දැන් ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 6 වන ව්‍යවස්ථාව හැටියට ගරු සභාපතිතුමනි, ජාතික කොඩිය, ශ්‍රී ලංකා ජනරජයේ ජාතික කොඩිය දෙවන උපලේඛනයෙහි නිරූපිත සිංහ කොඩිය වන්නේය කියලා ව්‍යවස්ථාවටම මේ කොඩිය ඇතුළත් කරලා තිබෙනවා. ඔබතුමා දන්නවා. සාමාන්‍යයෙන් අපේ රටේ පුරවැසියන් මේ ව්‍යවස්ථාවට බැඳීම සඳහා ඔවුන් දිවුරුම් නොදුන්නත්, ඒ නිසාම මේ ව්‍යවස්ථාව ජනතාව කියෙව්වේ නැති වුණත් ඔවුන්ට දැනුවත් භාවයක් ලබා දීම සඳහා පාසල්වල තුනේ පන්තියේ ඉඳලා ජාතික කොඩිය පිළිබඳව උගන්වනවා. තුනේ පන්තියේ ඉඳලා දරුවාගේ ඔලුවට යවනවා ජාතික කොඩිය කියන්නේ මොකක්ද කියලා.

ඒ නිසා මේ ජාතික කොඩිය කියලා කියන්නේ ජාතියේ අනන්‍යතාවයේ සංකේතය. ව්‍යවස්ථාවට ඇතුළත් කරලා තිබෙන්නේ ඒකයි. මේ ජාතික කොඩියේ තිබෙන කිසිම දෙයක් විකෘති කරන්න කාටවත් අයිතියක් නැහැ. මේ තිබෙන බෝ කොළ හතරෙන්, සිංහයාගෙන්, මේ තිබෙන පාටවලින් විශේෂ දේවල් නිරූපණය වෙනවා. ඒ විතරක් නොවෙයි ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමැතියි, මේ සිංහයාගේ වලිගයේ තිබෙන නැමුම් අටෙන් පවා යම් අර්ථ නිරූපනයක් දීලා තමයි මේ ජාතික කොඩිය සකස් කරලා තිබෙන්නේ. හැබැයි, පසුගිය අප්‍රේල් 23 වැනිදා අල්ලස් කොමිසම ඉස්සරහා, ගෝඨාභය රාජපක්ෂ හිටපු ආරක්ෂක ලේකම්වරයාව සාක්කි දෙන්නය කියලා කැඳෙව්වාට පස්සේදී වෙනත් වර්ගයේ කොඩියක් ලෙළ දෙමින් තිබුණා. එහි අපේ රටේ දෙමළ ජනතාව නිරූපනය කරන මේ තැඹිලි පාට හා මුස්ලිම් ජනතාව නිරූපණය කරන කොළ පාට තීරු

තිබුණේ නැහැ. එතකොට ගරු සභාපතිතුමනි, මේකේ තිබෙන ප්‍රශ්නය තමයි -

[සභාවේ ඝෝෂා]

ඒ කොඩිය අත දරාගෙන හිටපු බහුතරයක් මේ පළාත් සභාව නියෝජනය කළා. හිටපු අමාත්‍යවරු, දැන් ඉන්න අමාත්‍යවරු, හිටපු සභා නායකවරු, නියෝජ්‍ය සභාපතිවරයා ඇතුළු මන්ත්‍රීවරු ගණනාවක් ඒ කොඩිය අත දරා ගෙන හිටියා. තමුන්නාන්සේට පෙන්වන්න පුළුවන්. මේක කළාට පස්සේ ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ හිටපු සංස්කෘතික ඇමතිවරයෙක් අපේ රටේ වෙනත් විකෘති කරන ලද ජාතික කොඩියක් අතේ තියා ගෙන ඉන්නවා නම් මොකක්ද මේ බස්නාහිර පළාත් සභාවේ ගරුත්වය. ඒ විතරක් නොවෙයි. ඒකෙන් පස්සේ ඒ ඇමතිවරයා කියනවා, ඒ හිටපු ඇමතිවරයා කියනවා -

[සභාවේ ඝෝෂා]

ඉන්න. අහගන්න පොඩ්ඩක්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එදා ජාතික කොඩි ගෙන ගියේ නැහැ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ඉන්න. අහගන්න පොඩ්ඩක්. බස්නාහිර පළාත් සභාවේ හිටපු සංස්කෘතික ඇමතිවරයා ඊට පස්සේ මාධ්‍යවලට කියනවා, අප අවංකව විශ්වාස කළේ (බාධා කිරීම්) ජාතික කොඩිය බව -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒක නිකම් කොඩියක්. ජාතික කොඩිය නොවෙයි ඔය.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒක නිකම් සිංහ කොඩියක්. ඒක සිංහයෙක් ඉන්න කොඩියක්.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ගරු සභාපතිතුමනි, මේකට සොරි කියලා හරියන්නේ නැහැ.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, මමයි හිටපු සංස්කෘතික ඇමතිවරයා. මම එහෙම ප්‍රකාශයක් කළා කියලා කොහේ හරි මාධ්‍යයක හෝ පත්තරයක හෝ ජාතික කොඩියක් එක්ක එහෙමම්ම ඒ ස්ථානයේ හිටියා කියලා ඔප්පු කළොත් මම මේ ඇමතිකමෙනුත් අස් වෙනවා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

අපෝ අස් වෙන්න එපා.

[සභාවේ ඝෝෂා]

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, සාකච්ඡාවකට යන්න තිබුණු නිසා මම -

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු සභාපතිතුමනි, අර වෙන පුටුවලට ගිහිල්ලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කොහේද ඉන්නේ?

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ගරු සභාපතිතුමනි, අපට පෙන්වන්න පුළුවන්. ඡායාරූප තිබෙනවා. ඒ නිසා -

[සභාවේ ඝෝෂා]

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මේ තිබෙන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අර වෙන පුටුවලට ගිහිල්ලා පින්තූර -

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඉල්ලා අස් වෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, මේ පෞද්ගලික ප්‍රකාශවලදී ඔබතුමා යම් යම් ප්‍රකාශ කරන්න එපා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, කවුරු අස් වුණත් අපට ප්‍රශ්නයක් නැහැ. කොඩිකාර ඇමතිතුමාට අස් වෙන්න දෙන්න එපා කියන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මේ ඉන්නේ. දැන් ඉල්ලා අස් වෙන්න ඔබතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා, කොහේද ඉන්නේ ඔය.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

මම හිටපු එක ඇත්ත නේ? මම හිටියා. (බාධා කිරීම්)

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඉල්ලා අස් වෙන්න.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

මම හිටපු එක ඇත්ත. මම කියන්නේ, මම ජාතික කොඩියක් උස්සා ගෙන හිටියේ නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

හරි. දැන් මගේ වෙලාව දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, කරුණාකර වාඩි වෙන්න. අනවශ්‍ය දේවල්වලට යන්න එපා.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, මට දැන් චෝදනාවක් දැම්මාම මාධ්‍යවලින් මේක ලියනවා නේ? මම නිවැරදි වෙන්න එපැයි.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න. හරි. අනික් අය ඔක්කොටම කිව්වා නේ කතන්දරය. ඔබතුමාට විතරක් නොවෙයි.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

දැන් නියෝජ්‍ය සභාපතිතුමා හිටියා නේ? හිටපු සභානායකතුමා හිටියා නේ? ගරු සභාපතිතුමනි, මම කියන්නේ -

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

මේ ජේ.වී.පී. කාරයෝ වාගේ අපි මේ රටේ දේපළ ගිනි තිබ්බේ නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, කරුණාකරලා වාඩි වෙන්න. මේ සභාව යන්න බැහැ මේ විධියට.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා. එතුමා ඉන්නේ එතුමාගේ ආසනයේ නොවෙයි. එතුමා නිමල් ලාන්සා ඇමතිතුමාගේ ආසනයේ ඉඳගෙන කථා කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. එතැන මයික් එකේ ප්‍රශ්නයක් තිබෙනවා. ඒකයි එතුමා එතැනට ගියේ.

[සභාවේ ඝෝෂා]

ගරු මන්ත්‍රීතුමා, බාධා කිරීම් නිසා මම ඔබතුමාට තව විනාඩියක් දෙන්නම්. කථාව අවසන් කරන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

බොහොම ස්තූතියි. ජාතිය ගැන හැඟීමක් තිබෙන සභාපතිතුමා. දැන් ගම්මන්පිල මන්ත්‍රීතුමා කියනවා, අප අවංකව විශ්වාස කළේ එය සැබෑ ජාතික කොඩිය බවයි. දේශප්‍රේමීත්වයෙන් උදය ගම්මන්පිල. එක අවස්ථාවක් නීතිඥයකු හැටියට මේ ව්‍යවස්ථාව රකිනවා කියලා දිවුරුම් දීලා, අනික් හරිය පළාත් සභා මන්ත්‍රීවරු හැටියට ව්‍යවස්ථාව රකිනවාය කියලා දිවුරුම් දීලා, මේ ව්‍යවස්ථාව උල්ලංඝනය කරන්න මේ සභාවේ ඉන්න මේ කිසිම කෙනෙකුට අයිතියක් නැහැ ගරු සභාපතිතුමනි. ඒ නිසා නිකම් කකුල පෑගුණාම සොරි කියනවා වාගේ, නිකම් කනගාටුයි, සොරි කියලා හරි යන්නේ නැහැ. මේකට මහ ඇමතිවරයා ඇතුළු මේ කණ්ඩායම ජාතියෙන් සමාව ගන්න ඕනෑ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

හීනෙන්ද? හීනයක් දැක්කාද?

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ජාතික කොඩිය උල්ලංඝනය කළාට - ගරු සභාපතිතුමනි, අපි යෝජනා කරනවා -

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඒ කාලේ මරපුවා.

[සභාවේ ඝෝෂා]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

රාජ්‍ය දේපළ ගිනි තිබ්බේ. හැඳුනුම්පත් එකතු කරලා මිනිස්සු මැරුවේ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

හරි. ඉවර කරන්න යන්නේ. වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණේ කට්ටිය ජාතියෙන් සමාව ගන්න ඕනෑ කියලා හැන්සාඩ් එකට ඇතුළත් කරන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ගරු සභාපතිතුමනි, මම ඔබතුමා මාර්ගයෙන් විශේෂයෙන් ඉල්ලීමක් කරනවා, අපේ රටේ මේ ජාතික වස්තූන්ට, ජාතික අනන්‍යතාවයට නිග්‍රහ කරන්නේ නැතිව රාජපක්ෂ වහල් බලකායට තමන්ගේ කොඩියක් නිර්මාණය කර ගන්න ඕනෑ නම් ඒක වෙනම -

[සභාවේ ඝෝෂා]

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

තවමත් රාජපක්ෂට භයයි.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

වහල්ලු.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

කොහොමත් වහල්ලු කැමැති නැහැ වහල් බවෙන් මිදෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වන්න. තවම තේ විවේකයට ගියෙත් නැහැ. දැන් 10.45 යි වෙලාව.

[සභාවේ ඝෝෂා]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අනුර කුමාරගේ කොන්ත්‍රාත් බලකාය. කෝ සල්ලි?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

රනිල්ගේ වහල්ලු. ජේ.වී.පී. එකේ ඉන්නේ. රනිල්ගේ වහල්ලු ටික. මහ බැංකුවෙන් හොරකම් කරපුවා, ජේ.වී.පී. එකටත් ගියා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වන්න. දිගින් දිගටම බාධා කරන්න එපා. මට න්‍යාය පත්‍රයට යන්න තිබෙනවා. තවමත් පෞද්ගලික පැහැදිලි කිරීම් අවසන් නැහැ. කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. මීළඟට එස්.එම්. මරික්කාර් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ගරු සභාපතිතුමනි, අද මේ රටේ ඓතිහාසික දවසක්. සැබෑ දේශප්‍රේමීන් කවුද? සැබෑ දේශද්‍රෝහීන් කවුද කියලා තීරණය වන දවසක්. දැන් මේ පසුගිය අවුරුදු හයක් තිස්සේ දේශප්‍රේමය, දේශමාමකත්වය, රට, ජාතිය ඉස්සරහාට දා ගෙන පෞද්ගලික න්‍යාය පත්‍රවලට දේශපාලනය කරපු අයට මේ ආණ්ඩුව යටතේ සැබෑ යහපාලනය ස්ථාපිත කිරීම සඳහා කොමිෂන් සභා ටික ගෙනැල්ලා, යහපාලනය ස්ථාපිත කරලා, සර්ව සාධාරණ සමාජයක් නිර්මාණය කිරීමේ අයිතියට, එය ක්‍රියාත්මක වීමට ඡන්දය දෙනවාද නැද්ද කියන එක තුළ ඔවුන් දේශද්‍රෝහීන් ද, දේශප්‍රේමීන් ද කියලා අපට හිතාගන්න පුළුවන් වෙයි. හැබැයි, අපට පොඩි සැකයක් තිබෙනවා. මේ දේශප්‍රේමීන් තමයි මෙන්න මේ ආකාරයට අපේ රටේ ජාතික කොඩිය විකෘති කළේ. හරියට කියනවා නම්, අර භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර මරපු කෙනා මට මතක නැහැ කිව්වා වාගේ. වෙලේ සුදා කුඩු ගෙනැල්ලා මම දන්නේ නැහැ ඒ කුඩු කියලා කිව්වා වාගේ තමයි මේ ජාතික කොඩිය විකෘති කිරීම. දැන් මෙකේ පැහැදිලිව තිබෙනවා, සංවිධානාත්මකව කොඩි ගෙනැල්ලා තිබෙන්නේ. එන්.ජී.ඕ නඩය ප්‍රතික්ෂේප කරපු අය, එන්.ජී.ඕ. එකත් එක්ක ඉඳගෙන මේ රටේ නැවත ජාතිවාදයේ, බෙදුම්වාදයේ තෝතැන්නක් බවට පත් කරලා, තමන්ගේ පෞද්ගලික දේශපාලන න්‍යාය පත්‍රය ඉදිරියට ගෙනියනවා කියලා අපට සැකයක් තිබෙනවා.

විශේෂයෙන්ම කේ.පී. ව, කරුණා අම්මාන්ව තුරුළු කර ගෙන හිටපු කණ්ඩායම නැවත වතාවක් මේ වාගේ පසුගිය ජනාධිපතිවරණයේදී දෙමළ ජනතාවගේත්, මුස්ලිම් ජනතාවගේත් ප්‍රතික්ෂේප වුණු මේ ජනතාව ඒකේ පළිය ගන්න, ඒකට විරෝධය ප්‍රකාශ කරන්න තමයි මේ කොළ පාට සහ ඒ දෙමළ ජනතාව නියෝජනය කරන පාට අයින් කරලා, මේ විකෘතිය ගෙනාවේ. සමාජයට නැවත වතාවක් අන්තවාදය, ජාතිවාදය වපුරලා, අර මිය ගිය අප්පච්චිට පණ දෙන්න පුළුවන්ද කියලා බලන්න. මැරුණු කෙනා කොහෙන් ගේන්නද? වළෙන් නැගිටලා ගෙනාවත් බැහැ. (බාධා කිරීම්)

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

රනිල් මැරිලා හිටියේ. ඔය ගෙනාවේ.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

දැන් අපි ජනමාධ්‍යවලින් දැක්කා, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අගුණකොලපැලැස්සට ගියාම එක්තරා මන්ත්‍රීවරයෙකුගේ ආරක්ෂකයෙක් ආයුධයක් සහිතව ජනාධිපතිතුමා ළඟට ඇවිත් තිබෙනවා. පුළුවන් නම් මෛත්‍රීපාල මරලා හරි අපි බලය ගන්නවා. පුළුවන් නම් ජාතිවාදය අවුස්සලා හරි අපි බලය ගන්නවා. පුළුවන් නම් කොටින් එක්ක එකතු වෙලා හරි අපි බලය ගන්නවා කියන තැන ඉඳන් තමයි කටයුතු කරන්නේ. (බාධා කිරීම්) ඒ නිසා ගරු සභාපතිතුමනි, හැට දෙලක්ෂ පනස් දාහක් ජනතාව මේ රටේ යහපාලනය ස්ථාපිත කරන්න, -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

දැන් ඊළඟට බලයේ ඉන්නේ අගමැති නේ? ඔය කුමන්ත්‍රණය ඕගොල්ලෝ ගාව ඇත්තේ. ජනාධිපතිට විරුද්ධව කුමන්ත්‍රණය ඕගොල්ලොන්ට ඇත්තේ.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

යහපාලනය රජයන සමාජයක් නිර්මාණය කරන්න වාගේම අර අප්පච්චිට ඡන්දය දුන්න පනස් දෙලක්ෂයක් - (බාධා කිරීම්) එහෙම නම් ලක්ෂ එකසිය විස්සක් ජනතාව මේ රටේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න ඡන්දය දීලා තිබෙනවා. හැබැයි, මේ දේශපාලන අනාථයෝ කණ්ඩායමක් ඉන්නවා. ඊළඟ මහ මැතිවරණයේදී මේ දියවන්නාව මැද ඉන්න විශාල ප්‍රමාණයක් එළියට යන කොට තමන්ට ඇතුළට යන්න බැරි වෙයි. ආයිත් එන්න බැරි වෙයි කියලා හිතන කණ්ඩායම තමන්ගේ පාර කපා ගැනීම උදෙසා දේශප්‍රේමය ඉස්සරහාට දා ගෙන, දේශමාමකත්වය ඉස්සරහාට දා ගෙන කොටින් එක්ක එකතු වෙලා මේ රට නැවත විකෘති කරලා, මේ රටේ නැවත -

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අද කොටි ඡන්දේ දෙන හැටි බලමු කෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වන්න. මීළඟට පියල් නිශාන්ත ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ මයික්‍රෝෆෝනයේ පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා ඔබතුමා මෙහා ආසනයට එන්න.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

මම මෙහාට ආවා. ගරු සභාපතිතුමනි, මම මේ සභාවට ආපු වෙලාවේ ඉඳලා කිසිම බාධාවක් කළේ නැහැ. ඒ නිසා මම හිතනවා, මගේ සහෝදර මන්ත්‍රීවරු බාධාවකින් තොරව මේ කථාව අහගෙන ඉඳියි කියලා. විශේෂයෙන්ම අද සභාව තුළ මම කථා කරන්න ඉන්න මාතෘකාව පිළිබඳව මම හිතන්නේ, දිගින් දිගටම කථා කළා. ඒ නිසා මම විශේෂයෙන්ම කියනවා. මේ සිංහලේ කොඩිය පිළිබඳව දිගින් දිගටම කථා කළා. ගරු සභාපතිතුමනි, 1815 වන තෙක් අපේ ජාතික කොඩිය හැටියට මම අද අන්තර්ජාලය හරහා ගත්ත පිටපත සභාගත කරනවා. මේක තමයි කොඩිය හැටියට සැලකුවේ. නමුත් මම දන්නේ නැහැ. මේ බංකොලොත් වුණු සමහර දේශපාලන නායකයින් මොනවා කථා කරනවාද කියලා. මේ කොඩිය පිළිබඳව බොහොම වැරදි සහගත ලෙස කථා කරනවා. හැබැයි, අපේ ජාතික උත්සවවලදී, උතුරේ ජාතික නායකයෝ ඊළාම් කොඩිය උස්සන කොට මේ කථා කරන එක නායකයෙකුට මේ සභාව තුළ කථා කරන්න බැරි වුණා. ඊළාම් කොඩිය, ඒ ත්‍රස්තවාදී කොඩිය මේ රට විනාශ කරපු, මේ රට අනාථ කරපු, මේ රට නන්නත්තාර කරපු ඒ අසික්කිත වැඩ පිළිවෙළ පිළිබඳව, ඒ නායකත්වය දුන්න නායකයෝ නිර්මාණය කරපු කොඩිය ඉහළට ඔසවන කොට මේ නායකයෝ එක්කෙනෙකුටවත් කථා කරන්න බැරි වුණා. ඊළඟට මේගොල්ලෝ බොහොම උජාරුවට කථා කරනවා, ජාතික ගීය පිළිබඳව. මේ කොඩිය විකෘති කළා කියලා නේ මේ කථා කරන්නේ. මේක කොඩිය විකෘති කිරීමක් නොවෙයි. මේක අපේ සිංහලේ කොඩිය. එක එක ජාතීන්ට සමහර විට තමන්ගේ අනන්‍යතාවය ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ නිසා සිංහලයින් හැටියට යම්කිසි කොඩියක් නිර්මාණය වෙලා තිබෙනවා නම්, ඒ කොඩිය ඉස්සුවා කියන එක සම්බන්ධ කර ගෙන මහ ලොකුවට කථා කරලා ජාතික වීරයන් හැටියට, මේ දේශපාලන වීරයන් හැටියට පත් වෙන්න උත්සාහ ගන්නවා නම්, මාධ්‍යට ලකුණු දා ගන්න උත්සාහ ගන්නවා නම් මම හිතන්නේ, ඉතාම වැරදියි. ඒ වාගේම මේ ක්‍රියාව පිළිබඳව -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඇයි එහෙම නම් සමාව ගත්තේ?

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ඉන්න කෝ මම කියනකම්.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

සමාව ගත්තේ ඇයි?

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ඒක තමයි මම මේ කියන්න හදන්නේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

දැන් වීරයා මරලා හොරු රජ වෙන්න නේ යන්නේ.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

මේ සිද්ධිය සම්බන්ධව නිවැරදි කරන්න උත්සාහ ගන්නවා නොවෙයි. මේ අපේ සිංහලේ කොඩිය උස්සපු එක සම්බන්ධව නිවැරදි කරන්න හදනවා නොවෙයි. අනන්‍යතාවයක් තිබෙන කොඩියක්. එහෙම නැත්නම් සංකේතයක්. ඒ සඳහා තැන් තිබෙනවා උස්සලා ප්‍රදර්ශනය කරන්න. ඒ නිසා අපි සමහර අවස්ථාවලදී -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, මේ අශෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමා ඇඳගෙන ඉන්න ඇඳුම මේ සභාවට ඇඳගෙන එන්න බැහැ. කරුණාකර එතුමාව එළියට දාන්න. සභාවේ රීතිවල තිබෙනවා. ලැජ්ජයි. ෂර්ට් එකක් ඇඳගෙන ඉන්නේ. කොඩිය ගැන කථා කරනවා. ඇඳුම ගැන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා, ගරු මන්ත්‍රීමා මට මෙතැන ඇඳුම පේන්නේ නැහැ. ඔබතුමාට ෂර්ට් එකක් නම් අඳින්න බැහැ. ඔබතුමා ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක්. ඔබතුමා පැරණි මන්ත්‍රීවරයෙක්.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, මම ඇඳගෙන ඉන්න ඇඳුම ඉතාමත් විනීතව ඇඳගෙන ඉන්නවා. ඒ වාගේම සභාවේ නීති රීතිවලට යටත්ව ටියුනික් කොලර් එක දාලා තිබෙනවා. මේ සම්බන්ධව මොකක් හරි ගැටළුවක් තිබෙනවා නම් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔය කොලර් එක දාලා අඳින්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක්. නමුත් අපේ සභා රීතිවල තිබෙන්නේ ටියුනික් කොලරය සහිත ඇඳුමක් සහ එහෙම නැත්නම් යුරෝපීය ඇඳුමක්. එහෙමයි තිබෙන්නේ. නමුත් මේ ෂර්ට් එකක්. ඔබතුමා ඒක පිළිගන්න. සභාව රවට්ටන්න බැහැ. මමත් රැවටෙන්නේ නැහැ. මට පේනවා නේ? ඒ නිසා අදට ප්‍රශ්නයක් නැහැ. නමුත් ඔබතුමා වැරදි ක්‍රියාවක් කරන්නේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඇඳුම හරියට අඳින්නේ නැතිව, ජාතික කොඩිය ගැන කථාව.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, සභා රීතිවල තිබෙනවා. නැත්නම් මේක යන්න බැහැ නේ? සභා රීතිවල පැහැදිලිව ඒ ගැන සඳහන් කරලා තිබෙනවා. ඔබතුමා පිළිගන්න ඒක. ඔබතුමා වැරැද්දක් කරලා තිබෙන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සභාවේ ඉන්නත් බැහැ නේ? සභාවට අපහාස කරන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අපි ඇඳුම් ගලවා ගෙන -

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ගලවන්න. කොහොමත් ගලවලා තිබෙන්නේ දැන්. අමුතුවෙන් ගලවන්න දෙයක් නැහැ. පුළුවන් නම් ගලවන්න.

**ගරු සුනිල් ජයමිණි**
Hon. Sunil Jayamini

ගරු සභාපතිතුමනි, වැරදි පූර්වාදර්ශයක් කර ගන්න එපා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ජාතියට අපහාස කළාට පස්සේ මේ සභාවට අපහාස කරන එක වැඩක් නොවෙයි. ජාතියට අපහාස කරලා තිබෙන්නේ. ඒවා අපි හදා ගන්නම්. මේක කථා කරන්න ඉස්සෙල්ලා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. පියල් නිශාන්ත ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කථා කරන්න.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු සභාපතිතුමනි, මේ සිංහලේ කොඩිය -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. දිගින් දිගටම කෑ ගහන්න යන්න එපා. සභා රීතිවල අපේ ඇඳුම පිළිබඳව තිබෙනවා. හැබැයි, මට එහෙම බලන්න ගියොත් නොයෙකුත් ප්‍රශ්න තිබෙනවා. ගොඩක් මන්ත්‍රීවරු උඩ බොත්තම දා ගෙන සභා ගර්භයේ ඉන්නෙත් නැහැ. මම ඒවා කියන්න යන්නේ නැහැ. මට පේනවා. ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු සභාපතිතුමනි, මේ සිංහලයේ කොඩිය අවස්ථා කිහිපයකදී, ස්ථාන කිහිපයකදීම ප්‍රදර්ශනය කරලා තිබෙනවා. මේ ස්වර්ණ හංස පදනම කියන පදනම මුල් කර ගෙන. ඒ නිසා අපි අපේ හෘද සාක්ෂියට එකඟව වැරදි දේ වැරදි විධියට දකින්න ඕනෑ. ඒක අරගෙන බොහොම අවස්ථාවාදී ලෙස බංකොලොත් දේශපාලඥයින්, ඒ වාගේම අවස්ථාවාදී දේශපාලඥයින් අන්තවාදීන් හැටියට සිංහල, මුස්ලිම්, ද්‍රවිඩ මේ අපේ ජාතීන් අතර ගැටළු ඇති කරන්න, ගැටුම් ඇති කරන්න උත්සාහ ගන්න සහ පහත් ලෙස සුළු ජාතීන්ගේ ඡන්ද දිනාගෙන ඉන්න මේ සමහර නායකයින් මේ කථා කරන දේවල් දැක්කාට පස්සේ අපට හිතෙන්නේ හරියට මේ හීනයක් දැකලා භය වෙලා මේ ක්ෂණිකව නැගිට්ටා වාගේ කියලා. අන්න ඒ තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

අපි විශේෂයෙන්ම නැවතත් කියනවා. මේ සිද්ධිය විතරක් නොවෙයි. අපේ රටේ කොටි කොඩිය ඔසවන විටත් අපි මේ විරෝධතාවය ප්‍රකාශ කරන්න ඕනෑ. අපේ ජාතික ගීය වෙනස් කරන කොට අපි මේ සම්බන්ධව අපේ හෘද සාක්ෂියට එකඟව අපි කටයුතු කරන්න ඕනෑ. ඒ වාගේම තමයි විශේෂයෙන්ම කියන්න ඕනෑ ගරු සභාපතිතුමනි, මේ සමහර නායකයින් මේ වන විට ජාතිවාදය අවුස්සමින්, තමන්ගේ ඡන්ද පදනම වැඩි කර ගන්න උත්සාහ ගන්නවා. ඒ නිසා මේ කුහක වැඩ පිළිවෙළ දිගටම දියත් කරන්න එපා. ඒකේ ප්‍රතිඵල වින්ද මිනිහෙක් මම. අපි බේරුවල ආසනයේ සිදු වුණු සිංහල, මුස්ලිම් ගැටුමට සම්බන්ධ වෙලා, අද වන කොට ඒ සිද්ධියත් එක්ක බලන කොට ඉතාමත්ම කනගාටුදායක සිද්ධීන් රාශියකට මුහුණ දෙන්න සිදු වුණා. දකින්න සිදු වුණා. ඒ නිසා මේ දේශපාලන නායකයින් මේ විධියට හැසිරෙන කොට අපට ඉතාමත් කනගාටුදායක තත්ත්වයක් හෙට දවස තුළ නිර්මාණය වෙනවා. ඒක වළක්වන්න බැහැ. ඒ නිසා මම විශේෂයෙන්ම කියනවා, එදා මේ බේරුවල සිද්ධියේදී ජාතිවාදය අවුස්සපු, ජාතිවාදයට උඩ ගෙඩි දීපු අය අද අපි දන්නවා කොයි පැත්තේද ඉන්නේ කියලා. කොයි පැත්තේද ඉන්නේ කියන එක අපි දන්නවා. ඒ නිසා මේක මහා දැවැන්ත කුමන්ත්‍රණයක්. ඒ කුමන්ත්‍රණය සිදු වුණේ අද ඊයේ නොවෙයි. මේ සිංහලේ කොඩිය ඔසවන වෙලාවේ විතරක් නොවෙයි. දැනට වසර ගණනාවකට ඉස්සර ඉඳලා

[ගරු පියල් නිශාන්ත]

මේ කුමන්ත්‍රණය සිද්ධ වෙනවා. ඒ නිසා අපි පැහැදිලිවම දන්නවා. මහින්ද රාජපක්ෂට භයයි. මේ නායකයෝ භයයි. අපේ නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා, ඒ වාගේම අපේ - (බාධා කිරීම්)

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හොරකම් කරනවාට භයයි. මිනී මරනවාට භයයි.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

අපි භයයි සුදු වෑන්වලට.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

මේ අය හැසිරීම පිළිබඳව අපි කනගාටු වෙනවා. ඒ නිසා මම විශේෂයෙන්ම මේ සභාවේ අපේ සහෝදර මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. මෙවැනි සිද්ධි මහා ලොකුවට අර ගෙන ගිහිල්ලා, ජාතීන් අතර ප්‍රශ්න ඇති කරන්න සූදානම් වෙන්න එපා. තමන්ගේ පටු දේශපාලන වාසිය සඳහා ජාතීන් අතර ප්‍රශ්න ඇති කරන්න හදන්න එපා. ඒ පිළිබඳව මතක් කරමින්, මීට වඩා බුද්ධිමත් ලෙස දේශපාලඥයින් හැටියට හැසිරෙන්නය කියන එක කියා සිටිමින්, ප්‍රකාශ කරන්නය කියා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්. මේක පැහැදිලි කර ගන්න ඕනෑ. අශෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමාට එළියට ගිහිල්ලා කොලර් එක නවලා ෂර්ට් එකේ බොත්තම දා ගෙන එන්න පුළුවන් නම් හෙට අනික් අයත් ඒ විධියට ආවොත් ඒ අයටත් ඉඩ දෙනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ටියුනික් කොලර් එක නම් ප්‍රශ්නයක් නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ටියුනික් කොලර් එකක් නොවෙයි නේ? ඒක පැහැදිලිවම ෂර්ට් එකක් නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට ඒක පේන්නේ නැහැ. මට ඒක ඇතුළ බලන්න බැහැ නේ ගරු මන්ත්‍රීතුමා. දිගින් දිගටම අනවශ්‍ය ප්‍රශ්නවලට යන්න එපා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එහෙම නම් හෙට එන කොට සියලු දෙනාම ටියුනික් කොලර් එක නැතිව ෂර්ට් එක ඇඳගෙන ඇවිල්ලා කොලර් එක ඇතුළට දාගෙන ආවොත් ඔබතුමා එහෙම ඇතුළට එන්න දෙනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අත් දිගට දාලා මට පේනවා නම් ටියුනික් කොලර් එක කියලා මම අවස්ථාව දෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ටියුනික් කොලර් එක නොවෙයි නේ? එතුමා ෂර්ට් එකක් ඇඳගෙන ඇතුළට ඇවිල්ලා, මේ සභාව නොමග යවලා, ඒ කොලර් එක නවාගෙන ඇතුළට වෙලා ඉන්නවා නම් ඒක වැරදි පූර්වාදර්ශයක්. අනික් මන්ත්‍රීවරුත් එහෙම ආවොත් ඔබතුමා ඒකට අවස්ථාව දෙනවාද?

[සභාවේ ඝෝෂා]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ටේලරින් ක්‍රමය මොකක්ද කියලා නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට පෙනෙනවා නම් එහෙම, ඒක ටියුනික් කොලර් එක කියලා මම අවසර දෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මේක ටියුනික් කොලරය සහිත ෂර්ට් එකක් නොවෙයි.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

එහෙම කොහොමද කියන්නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කොලර් එක නවා ගෙන ඉන්නේ එතුමා. එහෙම දෙන්න පුළුවන් නම් අනික් අයටත් දෙන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, එහෙම දෙන්න බැහැ. එහෙම දෙනවා නම් මේ රීතියක් වැඩක් නැහැ නේ? රීති පොතේ රීතිය තිබෙන කොට එතුමා ඒ රීති අත් හැරලා වෙනත් විධියකට ඇඳගෙන ඉන්නවා නම් ඒක සභාවට -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගැළපෙන ඇඳුමක් ඒක.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මූලාසනයට පේනවා නම් ටියුනික් කොලරය කියලා ප්‍රශ්නයක් නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ප්‍රශ්නයක් නැති වෙන්නේ කොහොමද? ෂර්ට් එකක් නේ? හෙට එන කොට අනික් අය ෂර්ට් ඇඳගෙන-

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, මට අවස්ථාවක් දෙන්න. ටියුනික් කොලර් එක විද්‍යාමාන වෙනවා නම් -

[සභාවේ ඝෝෂා]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තීරණයක් ගන්න බැහැ මේක ගැලපෙන ඇඳුමක් ද නොගැලපෙන ඇඳුමක් ද කියලා. ගරු සභාපතිතුමා තීරණය කරන්නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒක තමයි මතක් කරලා දුන්නේ.



**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

හරි දැන්. එතුමාට තීරණයක් දෙන්න අවස්ථාව දෙන්න. ඔබතුමා මේකට-

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මේ සභාවට දිවුරුම් දීලා එන කොට, සභාවට අඳින ඇඳුම කියලා තිබෙනවා.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු සභාපතිතුමනි, ලබන සභා වාරයේදී අපි ඇඳගෙන එන්නේ මේ විධියට. පුළුවන් නම් අපව ඉවත් කරන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒක ඕගොල්ලන්ගේ ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම ඉවත් කරන්න මට අවශ්‍යතාවයක් නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, මේ සභාවේ රීති තිබෙනවා නේ? ඒක වෙනස් කරන්න පුළුවන්කමක් නැහැ නේ?

[සභාවේ ඝෝෂා]

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඕගොල්ලෝ ඇඳුම් නැතිව හරි එන්න. කිසි ප්‍රශ්නයක් නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඕගොල්ලෝ දැන් ඇඳුම් නැතිවද එන්නේ?

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

හෙළුව පේන්න පටන් අරගෙන තිබෙන්නේ දැන්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඇඳුම වෙනස් කරන්න බැහැ එහෙම. ෂර්ට් එක ඇඳගෙන, ඒක යට කර ගෙන එන්න බැහැ. එහෙම රීතියක් නැහැ. එහෙම නම් රීති වැඩක් නැහැ නේ? රීති පොත අයින් කරන්න එහෙම නම්. එළියට ගිහිල්ලා කොලර් එක නවා ගෙන ඇවිත් වාඩි වෙලා ඉන්නවා නම් එහෙම කරන්න බැහැ. එහෙම නම් රීති වැඩක් නැහැ. මින් පස්සේ රීති නැහැ එහෙම නම්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

දැන් ඔක්කොම හයිබ්‍රිඩ්. දෙමුහුන් දැන්. ඒකයි මේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් සභාව නිශ්ශබ්ද වන්න. මගේ මතය ප්‍රකාශ කරන්න අවස්ථාවක් දෙන්න.

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

එතුමා වරද පිළි අරගෙන ඒක හදා ගෙන ආවා නේ? ඒ නිසා සමාවක් දෙන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමාව නොමග ඇරියාට අනික් මන්ත්‍රීවරු නොමග යවන්න බැහැ. එතුමා පැහැදිලිව වැරදි වැඩක් කරලා ඇතුළේ ඉන්නේ. රීතිවල තිබෙනවා නම් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කොපමණ වැරදි වැඩ කරපු අය ඇතුළේ ඉන්නවාද එහෙම නම්.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරපු -

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කළේ ජනතා විමුක්ති පෙරමුණ. ජනතා විමුක්ති පෙරමුණ තමයි මේ රට විනාශ කළේ.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

තනිකර ජාතික කොඩිය විකෘති කරලා තිබෙන්නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, මේ සභාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැන කථා කරනවා. හැබැයි, තමුන් අඳින්න ඕනෑ ඇඳුම දන්නේ නැහැ.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, මගේ ඇඳුම පිළිබඳ ප්‍රශ්නයක් තිබුණා. මම එළියට ගිහිල්ලා ඒක වෙනස් කර ගෙන දැන් ඇවිල්ලා තිබෙනවා. මේක තමයි මම අඳින ටියුනික් කොලර් එක. හැබැයි, පැහැදිලිව කියනවා. එදා, අපි ආදර්ශයට ගන්න පාර්ලිමේන්තුවේ රෙදි පොරවා ගෙන නිදියා ගත්තේ කවුද? රෙදි පොරවා ගෙන නිදියා ගත්තේ. පාර්ලිමේන්තුව ඇතුළේ අරක්කු බිව්වේ. එදා පාර්ලිමේන්තුවේදී -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒ සභාව නොවෙයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒ සභාව විසුරුවා හැරලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පාර්ලිමේන්තුව ඇතුලේ රෙදි පොරවා ගෙන නිදිය ගත්තේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒ සභාව විසුරවා හැරලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒ සභාව කල් තැබුවාට පස්සේ.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

විස්කි බිව්වේ. බයිට් කෑවේ. පාර්ලිමේන්තුව ඇතුළේ.

[සභාවේ ඝෝෂා]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

වැරැද්ද පෙනී පෙනී තියා ගෙන කියවනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සියලුම දෙනා නිශ්ශබ්ද වන්න. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ඇඳුම සම්බන්ධව මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විරෝධයක් ප්‍රකාශ කළා. ඒ පිළිබඳව මුල් අවස්ථාවේ ඔබතුමා එළියට ගිහිල්ලා මම දන්නේ නැහැ මොකක්ද ඒ වෙලාවේ ෂර්ට් එකක් - මට පෙනුනේ නැහැ ඒක. ඔබතුමා ෂර්ට් එක ගලවලා - ඇත්ත වශයෙන්ම මට එහෙම නම් ඔබතුමාට (බාධා කිරීම්) මට පේන්නේ නැහැ කියලා නේ මම කියන්නේ. ඔබතුමන්ලාට පේනවා ඒක. මට පේන්නේ නැහැ ඒක.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමා, තීරණයක් දෙන්න මේක ගැළපෙන ඇඳුමක් ද නොගැලපෙන ඇඳුමක්ද කියලා. එතකොට හරි නේ? ඔබතුමා තීරණයක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභා රීතිවල ටියුනික් කොලර් එකක් කියලා නැහැ. සභා රීතිවල නැහැ. ගැලපෙන ඇඳුමක්. සුදුසු ඇඳුමක්. අපි පොත් පිංචක් මුද්‍රණය කරලා තිබෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, එහෙම නම් ඒක කියවන්න කෝ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි මම කියවන්නම්. අහගන්න. 68(3) මන්ත්‍රීවරු නිසි ඇඳුමින් සැරසී සිටීම. *"සභාවේ හෝ යම් කාරක සභාවක රැස්වීම්වලට සහභාගී වන විට සභාවේ සභාපතිවරයා විසින් නියම කර ඇති උපදෙස් පරිදි මන්ත්‍රීවරු නිසි ඇඳුමින් සැරසී සිටිය යුතුය."* නමුත් අපි මන්ත්‍රීවරුන්ට ලබා දීපු පොත් පිංචක් තිබෙනවා. සභාවේ අත්පොත.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒක තීරණය කරන්නේ සභාපතිතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තීරණය කරන්නේ, මෙහෙමයි. ඒක ගරු මන්ත්‍රීවරු නොවෙයි තීරණය කරන්නේ. නිසි ඇඳුම කියලා තිබෙන්නේ. දැන් රන්වල මන්ත්‍රීතුමාට ප්‍රශ්නයක් ආවා නේ?

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

රීතිය කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඔබතුමා වාඩි වෙන්න. රීතිය මම දන්නවා. කරුණාකර ඔබතුමා පොඩ්ඩක් ඉන්න. ඔබතුමා මූලාසනයේ හිටපු මන්ත්‍රීවරයෙක් නේ? දැන් නේ ඔබතුමා වීරයෙක් වෙලා තිබෙන්නේ.

[ගරු සභාපතිතුමා]

68(3) වන රීතියේ එහෙම සඳහනක් නැහැ. සභාවේ තිබෙන රීති අනුව තමයි මට සභාව මෙහෙයවන්න තිබෙන්නේ. එතුමාට මුලින් ප්‍රශ්නයක් ආවා. එතුමා එළියට ගියා. එළියට ගිහිල්ලා එතුමා නැවත සභාවට ආවා. එතුමා සභාවට ගරු කරලා වැරැද්ද පිළිගත්තා. නමුත් දැන් ඇඳුමක් ඇඳගෙන - මට පැහැදිලිව ඒක පේන්නේ නැහැ. ටියුනික් කොලරයක් ද කියලා. එහෙම නම් මට සිද්ධ වෙනවා, එතුමාත් එක්ක එළියට ගිහිල්ලා ආරක්ෂක කුටියට ගිහිල්ලා පරීක්ෂා කර බලන්න. මට මූලාසනය හැටියට ඒක කරන්න බැහැ. මම සෑහීමකට පත් වෙනවා. එතුමාගේ ඇඳුම. මම පිළිගන්නවා ඒක.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එතුමා එළියට ගිහිල්ලා අතනින් වත් එළියට යන්නේ නැතිව ෂර්ට් එක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම දන්නේ නැහැ නේ මන්ත්‍රීතුමා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අපි දැක්කා නේ? අපි දැක්ක දේ නේ සභාවේ කියන්නේ. එතකොට ඔබතුමා අපව විශ්වාස කරන්නේ නැද්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. විශ්වාස කරනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඉතින් අපි දැකපු දේ නේ කියන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු සභාපතිතුමනි, මේ බොරු දේවල් ඇදගෙන වැඩක් නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

දැන් එළියට ගිහිල්ලා පිස්තෝලයක් අර ගෙන ආවොත් කියයි මම දැක්කේ නැහැ කියලා. අපි දැක්කා නේ?

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, දැන් ප්‍රශ්නය මතු කළා නේ? මේ පිළිබඳව අවබෝධයක් තිබෙනවා. අපි ඊළඟ කටයුත්තට යමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා ඉන්නවා. බොත්තම දා ගෙන ඉන්නේ නැහැ. මට සභාපතිවරයා වශයෙන් ඒවා ඔක්කොම කියන්න බැහැ.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

හරි. සභාපතිතුමාගේ තීරණය.

[සභාවේ ඝෝෂා]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

දැන් ඒක නිවැරදි කර ගෙන ආවා නේ? ගරු සභාපතිතුමාට පේනවා නේ? කොලර් එක මහන විධියට නැහැ නේ? රීතිය කොහේද තිබෙන්නේ. හදාගෙන ආවානේ? දැන් මොනවාද කියන්නේ. මේගොල්ලන්ට ඕනෑ සභාව කඩාකප්පල් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට, මූලාසනයට ඔක්කොම කරන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීවරුන්ට අත්පොතක් තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අත්පොතේ තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අත්පොතේ පැහැදිලිව තිබෙනවා. රීතිවල නැහැ. අත්පොතේ තිබෙනවා, නිසි ඇඳුමින් සැරසී සිටිය යුතු බව. සභා රැස්වීමට සහභාගී වන ගරු මන්ත්‍රීවරුන් විසින් යුරෝපීය ඇඳුම හෝ ටියුනික් කොලරය සහිත අත් දිග කමිසය හෝ කලිසම, ජාතික ඇඳුම වැනි නිසි ඇඳුමකින් සැරසී සිටිය යුතුය.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඔබතුමා ඉස්සෙල්ලා කිව්වා නේ එහෙම එකක් නැහැ කියලා. ඔබතුමා මේ සභාව නොමග යැව්වා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පැහැදිලිව තිබෙනවා, ටියුනික් කොලරය සහිත අත් දිග කමිසය හා කලිසම හෝ ජාතික ඇඳුම වැනි නිසි ඇඳුමින් සැරසී සිටිය යුතුය.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, මේ සභාව අද - (බාධා කිරීම්) ගරු සභාපතිතුමනි, මේ පොඩි -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ සම්බන්ධව දිගින් දිගටම යන්න අවශ්‍ය නැහැ. වැදගත් ප්‍රඥප්තියක් සම්මත කර ගන්න තිබෙනවා. දැන් පෙ.ව. 11.10 යි වෙලාව. ඒ පිළිබඳව තීන්දුව මම පසුව ප්‍රකාශ කරන්නම්. දැන් මේ අවස්ථාවේදී මම මේ සභාව පෙරවරු තේ විවේකය සඳහා තාවකාලිකව කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් අ.භා. 12.05 ට යළිත් රැස් විය.***
*Sitting, accordingly suspened untill 12.05 p.m. and then resumed.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාව අත්සිටුවන අවස්ථාවේදී මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා සභාවේ නිල ඇඳුම සම්බන්ධයෙන් දිගින් දිගටම ප්‍රශ්න කළා. අපේ අශෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමාගේ ඇඳුම සම්බන්ධයෙන්. ඒ සම්බන්ධව මුලින්ම මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්න කිරීම තුළ මම එතුමාට උපදෙස් දුන්නා ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක් වශයෙන් ඔබතුමා නිසි ඇඳුමක් ඇඳ ගෙන එන්නය කියලා. ඒ අනුව එතුමා සභාවෙන් එළියට ගිහිල්ලා මට පෙනෙන විධියට ටියුනික් කොලරය සහිත ඇඳුමක් ඇඳගෙන ආවා. නමුත් නැවත වරක් මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා දිගින් දිගටම ප්‍රකාශ කළ සිටියා. ඒ කලින් ෂර්ට් එකම තමයි. කොලර් එක අනික් පැත්ත ගහගෙන ඇඳගෙන ඇවිල්ලා කියලා. ඒ නිසා ඒ වාගේ තත්ත්වයන් තුළ මේ සභාවේ ගරුත්වය මම ආරක්ෂා කරන්න ඕනෑ, සභාපතිවරයා වශයෙන්. මට තිබෙන අයිතියක් ඒක. ගොඩක් මන්ත්‍රීවරු මම දැකලා තිබෙනවා සභාවේ ඉන්න කොට ටියුනික් කොලරය සහිත ඇඳුම ඇඳගෙන ආවත් උඩ බොත්තම් ටික දා ගෙන ඉන්නේ නැහැ. ඒකත් ප්‍රශ්නයක්. මට ඒක දිගින් දිගටම මන්ත්‍රීවරු එක්කෙනා එක්කෙනා සොයලා කියන්න ගියොත් එහෙම මට ප්‍රශ්නයක්. මට එහෙම කරන්නත් බැහැ. ඊළඟට එහෙම කිව්වාම ප්‍රශ්නයක් වෙනවා. නමුත් මන්ත්‍රීවරුන්ගේ වගකීමක් තිබෙනවා. යුතුකමක් තිබෙනවා. එතුමා මන්ත්‍රීවරයෙක් වශයෙන් එතුමාගේ ගරුත්වය ආරක්ෂා කර ගන්නට ඕනෑ. එතුමා ආදර්ශවත් වෙන්නට ඕනෑ. ඇඳුම, හැසිරීම වාගේ හැම දෙයක් පිළිබඳව. හැම දෙයකින්ම මන්ත්‍රීතුමා ආදර්ශවත් වෙන්නට ඕනෑ. මොකද, ජනතා නියෝජිතයෙක්. ඒ නිසා අශෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමා ඒ වැරැද්ද පිළිගන්න. ඔබතුමා ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක් වශයෙන්. මීන් ඉදිරියට අපේ ගරු මන්ත්‍රීවරු සභා ගර්භයට පිවිසීමේදී නිසි ඇඳුමෙන් සැරසී ඉන්න. සභා රීතිවල ඒ ගැන මුකුත් කියලා නැහැ. නමුත් සභා අත්පොතේ තිබෙනවා. ගරු මන්ත්‍රීවරුන්ට අපේ සභා ලේකම් කාර්යාලය මගින් නිකුත් කළ සභා අත්පොතේ තිබෙනවා. ටියුනික් කොලරය සහිත ඇඳුමකින්, ජාතික ඇඳුමින් හෝ යුරෝපීය ඇඳුමෙන් එන්නය කියලා තමයි ඒ අත්පොතේ තිබෙන්නේ. ඒ නිසා මම සියලුම ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා, ඔබතුමා මේ සභා ගර්භයට එන කොට ඔබතුමන්ලා නිසි ඇඳුමින් ඇවිල්ලා සභාවේ ගරුත්වය ආරක්ෂා කරන්න. එහෙම වුණොත් එහෙම මට හරි පහසුයි මේ සභාව පාලනය කර ගෙන යන්නට.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, ඔබතුමාට සහයක් වශයෙන් මම කථා කරන්නේ. ඔබතුමාට සහාය දෙන්නට තමයි ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා සහ විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ඉන්නේ. එතකොට ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයාගේ කාර්යභාරය තමයි මේ සභාව හොඳට ගෙනියන්න ඔබතුමාට සහයෝගය දෙන එක. එතුමන්ලා ඒවා බලන්න ඕනෑ. විපක්ෂයත් එහෙමයි. මම මේ කියන්නේ සභාවට තිබෙන ආදරය නිසා. මෙතුමාගේ වරදකට වඩා එතුමාව දැනුවත් කරන්න. ඔබතුමාටත් වඩා ඒ සංවිධායක දෙපළ මුල් වෙන්න ඕනෑ. මම මේකේ ඉන්න වැඩිහිටියෙක් වශයෙන් කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් වශයෙන් මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඔබතුමාට මම ගරු කරනවා. ඉතින් මම කොහොමද ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට එහෙම කියන්නේ. එතුමාත් බොත්තම් දා ගෙන නොවෙයි ඉන්නේ. මට පටන් ගන්න වෙන්නේ එතැනින් එහෙම නම්. ඒ නිසා ඒ ගැන දිගින් දිගටම කථා කරන්න ගියොත් මේකේ අවසානයක් අපි දකින්නේ නැහැ. ඒ නිසා අපි ඒක එපමණ - ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා මාව දැනුවත් කිරීම සම්බන්ධයෙන්. න්‍යාය පත්‍රයට අනුව අවසාන පැහැදිලි කිරීමක් තිබුණා. අපේ ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමාට. එතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු සහ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා)
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Agrarian Development, Minor Irrigation, Industry, Environmental Affairs and Cultural and Art Affairs.)

ගරු සභාපතිතුමනි, මේ පළාත් සභාව ආරම්භයේදීම ඔබතුමාගේ යුතුකමක් හැටියට මේ පිළිබඳව සඳහනක් කළා. ඇත්තෙන්ම ගරු සභාපතිතුමනි, මම ඒ පිළිබඳව තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. නේපාලයේ කත්මන්ඩු ප්‍රදේශයේ ඇති වුණු භූචලනය පිළිබඳව ඇත්ත වශයෙන්ම අපි සියලුම දෙනාටම ලොකු කනගාටුවක්. අපට පමණක් නොවෙයි. මුළු ලෝකයේ සෑම රටවල්ම මේ වන කොට හැම අතකින්ම උදව් පදව් කරනවා, මේ ප්‍රශ්නය නිසා. මම දැක්කා, අද පුවත්පතක තිබෙනවා. ඉස්සෙල්ලාම උදව් කරන්න ආපු රටවල් තුන අතරට තුන්වන තැන ලැබිලා තිබෙන්නේ ලංකාවට. එක ඇමරිකාව. ඉන්දියාව. ලංකාව. මේ භූ චලනය පිළිබඳව මේ රටට දැනුවත් වුණු විගස අපේ ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අග්‍රාමාත්‍යතුමා ඇතුළු සියලුම දෙනා විශේෂ සාකච්ඡාවක් පවත්වලා ඒ වෙනුවෙන් කළ හැකි උපකාරය කරන්නට සියලු දෙනාම එකඟත්වය පළ කළා. ගරු සභාපතිතුමනි, මම ඊයේ දැක්කා මේ පිළිබඳව ප්‍රකාශයක් රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා කළාට පස්සේ අපේ සියලුම පක්ෂවල නායකයෝ ඒ පිළිබඳව අගය කිරීමක් කරලා තිබුණා. අපි මේ වෙලාවේ මේ රට වෙනුවෙන් යම්කිසි දෙයක් සුළු රටක් වුණත් අපට ආර්ථික අතින් ලොකු වස්තූන් නොතිබුණත්, අපේ මනුස්සකමක් හැටියට මේ නේපාල රජය වෙනුවෙන් අපේ යුතුකම ඉෂ්ට කරලා තිබෙනවා. ඒ පිළිබඳව පළමුවෙන්ම අපි සතුටු වෙනවා. ඒ වාගේම ඒ තත්ත්වය නේපාලය තුළ සිදු වීම පිළිබඳව කනගාටු වෙනවා. ඒ වාගේම ඉක්මන් තීරණයක් ගෙන ජනාධිපතිතුමා ප්‍රමුඛ සියලුම දෙනා මේ වෙනුවෙන් යම්කිසි උපකාරයක් කිරීමට අපේ රජය කටයුතු කිරීම පිළිබඳව මම මේ අවස්ථාවේදී පළාත් සභාවේ සියලුම දෙනා වෙනුවෙන් ස්තුතිවන්ත වෙනවා. ඒ නිසා අද මිය ගිය සංඛ්‍යාව -

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

අපි නම් පත්තරේ දැක්කේ අගමැතිතුමා කියලා.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

අගමැතිතුමා තමයි ඊයේ ප්‍රකාශයක් කරලා තිබුණේ. මිය ගිය සංඛ්‍යාව මේ වන කොට 4000 ඉක්මවා තිබෙනවා. සොයා ගන්න බැරි සංඛ්‍යාව 10,000 ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. මේ රට පිළිබඳව අපේ සිංහල බෞද්ධයන් හැටියට නිරන්තරයෙන්ම බෞද්ධ ජනතාව ආගමික කටයුතුවලට මේ රටට යනවා. බුදුන් උපත ලද ලුම්බිණියට කිසිම හානියක් වෙලා නැහැයි කියන එක අපට දැනට දැන ගන්නට ලැබිලා තිබෙනවා. ඒ පිළිබඳව අපි බෞද්ධයන් හැටියට අපේ සිත්වල බොහොම සංවේගයක් තිබුණා. මේ රටේ තිබුණු බෞද්ධ විහාරස්ථාන කිහිපයක් - ඒ වාගේම මිනිස්සුන්ගේ ජීවිත, ගොඩනැගිලි අලාභ හානි වුණු ඒවා කොයි තරම් ද කියන එක කියන්න පුළුවන්කමක් නැහැ.

ඊයේ වෙන කොට වෛද්‍ය ආධාර රැගත් ගුවන් යානයක් පිටත් කර යවා තිබෙනවා. හෙට වන කොට අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් යවන්නට කටයුතු කරලා තිබෙනවා. ඒ පිළිබඳව අපි මේ සභාව දැනුවත් කරන්නේ බොහොම කනගාටුවෙන්. අපේ පළාත් සභාව නියෝජනය කරන සියලුම මැති ඇමතිවරු වෙනුවෙන් අපි මේ අවස්ථාවේදී ඒ රට වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කර සිටිනවා. මේ කටයුතු කරන්නට සහයෝගය ලබා දුන් ජනාධිපතිතුමා, අගමැතිතුමා ප්‍රමුඛ අපේ රජයටත්, විශේෂයෙන්ම යුධ හමුදාව. මම හිතන්නේ ඉතිහාසයේ පළමු වන වතාවට ඒගොල්ලෝ වෙනත් රටකට මෙවැනි කණ්ඩායමක් අරගෙන ගිහිල්ලා මේ සහයෝගය ලබා දීමට කටයුතු කරලා තිබෙන්නේ. ඒ නිසා මම ඒ අවස්ථාවේදී කාලය වැඩියෙන් ගන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. අපේ සංවේගය, කනගාටුව ප්‍රකාශ කරමින් රජයට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

## පළාත් සභාවේ රැස්වීම - I
PROVINCIAL COUNCIL MEETING - I

**ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා** [ගරු සභා කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Gamini Thilakasiri - Minister [On Behalf of Minister of Council Affairs]

ගරු සභාපතිතුමනි, *"මීත් පෙර කිනම් තීරණයක් ගෙන තිබුණද, ඒ කිසිත් නොතකා 2015.04.08 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලද එකඟතාවයට අනුව, අද දින (2015.04.28 දින) විසිර යෑමෙන් අනතුරුව, මෙම සභාව 2015.05.12 දින පෙ.ව. 9.30 ට රැස්විය යුතු අතර, 2015.05.05 දින සභා රැස්වීම නොපැවැත්වෙන දිනයක් විය යුතුය."* යන යෝජනාව මම සභාවට ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## පළාත් සභාවේ රැස්වීම - I
PROVINCIAL COUNCIL MEETING - I

**ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා** [ගරු සභා කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Gamini Thilakasiri - Minister [On Behalf of Minister of Council Affairs]

ගරු සභාපතිතුමනි, *"2015.04.08 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලද එකඟතාවයට අනුව, 2015.05.12 දින සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන්ව විසිර යෑමෙන් අනතුරුව, මෙම සභාව 2015.05.26 වන දින පෙ.ව. 9.30 ට රැස්විය යුතු අතර, 2015.05.19 දිනය සභා රැස්වීම නොපැවැත්වෙන දිනයක් ලෙස සලකා ක්‍රියා කළ යුතුය."* යන යෝජනාව මම සභාවට ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## 2014 අංක....... දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය: දෙවන වර කියැවීම
PAWNBROKERS' STATUTE OF THE NO. … OF 2014: SECOND READING

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, *"බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2014 අංක .... දරණ බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය"* දෙවන වර කියවීම සඳහා ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම ප්‍රඥප්තියේ පළමු වර කියවීම 2014.07.08 වන දින ඉදිරිපත් කළා. ඊට අමතරව මෙම ප්‍රඥප්තිය සම්බන්ධයෙන් ප්‍රඥප්ති හා නීති කාරක සභාව මාස ගණනාවක් ඉතාමත් දීර්ඝ ලෙස සාකච්ඡා කළා. විශේෂයෙන්ම එම කමිටුවේ ගරු සභාපති සිසිර ජයකොඩි ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ඇතුළු නීතිඥ කණ්ඩායම, ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමා, රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය, අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා ඇතුළු කණ්ඩායමක් මාස ගණනක් මේ පිළිබඳව දිගින් දිගටම සාකච්ඡා කරලා තීන්දු කිහිපයක් ගත්තා. මම විශ්වාස කරනවා, මේ සම්බන්ධයෙන් නැවත වරක් යන්න අපි - සභාව එකඟ නම් මම ලැහැස්තියි. සභාව එකඟ නම් කිසිම ප්‍රශ්නයක් නැහැ. එකින් එක කියවන්න මට පුළුවන්. එකින් එක ගන්නත් පුළුවන්.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒ පිළිබඳව ප්‍රශ්නයක් නැහැ. ගරු සභාපතිතුමනි, අපි මෙම කාරක සභාවට අප පක්ෂය නියෝජනය කළ ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් විමසුවා. අපේ කණ්ඩායම් රැස්වීමේදීත් මේ පිළිබඳව දීර්ඝව සාකච්ඡා කළා. ඒ නිසා මේ පිළිබඳව අපේ විරුද්ධත්වයක් නොමැති බව දන්වනවා. කාරක සභාවේ සංශෝධනයන් සියල්ලටම යටත්ව අපි එකඟතාවය පළ කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේක කාරක සභා අවස්ථාවට යොමු කරලා ඒ තීරණය ගනිමු.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, ප්‍රඥප්ති හා නීති කාරක සභාව සංශෝධන ඉදිරිපත් කළා. ඒ සංශෝධනවලට යටත්ව අනුමැතියටයි ඉදිරිපත් කරන්නේ.

## පූර්ණ කාරක සභාව
COMMITTEE OF THE WHOLE COUNCIL

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් මෙම අවස්ථාවේදී මෙම සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් වෙනවා.

***ඊට අනුකූලව පළාත් සභාව පූර්ණ කාරක සභාව බවට පරිවර්තනය විය.***
*Accordingly, the Provincial Council resolved itself into a Committee of the whole Council.*

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, *"බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2014 අංක .... දරණ බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය"* ප්‍රඥප්ති හා නීති කාරක සභාව විසින්[1] ඉදිරිපත් කරන ලද සංශෝධනයන්ට යටත්ව සහා සම්මත කරන ලෙස යළිත් යෝජනා කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එසේ නම් බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2014 අංක .... දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය පිළිබඳව මම හිතන්නේ සභාවේ කිසිම ගැටළුවක් නැහැ. ඒකට එකඟයි. ඒ නිසා මම මේ අවස්ථාවේදී එම ප්‍රඥප්තිය සංශෝධනවලට යටත්ව සභා සම්මත වූ බව ප්‍රකාශ කරනවා.

***ඊට අනුකූලව ප්‍රඥප්ති කෙටුම්පත පිළිබඳ ප්‍රශ්නය සංශෝධිතාකාරයෙන් විමසන ලදුව, සභා සම්මත විය.***

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ වාගේම විශේෂයෙන්ම මම නැවත වරක් ස්තුතිවන්ත වෙනවා ප්‍රඥප්ති හා නීති කාරක සභාවේදී එහි සභාපතිතුමා ඇතුළු කලින් ප්‍රකාශ කළ පරිදි නීතිඥ මන්ත්‍රීවරු පිරිසකුත් සහභාගී වුණා. එතුමන්ලා බොහොම මහන්සි වුණා. ඇත්ත වශයෙන්ම මම පෞද්ගලිකව දන්නවා. මාස තුනක් තිස්සේ බොහොම මහන්සි වෙලා තමයි යම් යම් සංශෝධනවලට ඇවිල්ලා මෙම ප්‍රඥප්තිය සකස් කළේ. ඒ නිසා මේ අවස්ථාවේදී විශේෂ ස්තුතියක් කරනවා කාරක සභාවේ ගරු සභාපති, සිසිර ජයකොඩි මැතිතුමා ඇතුළු ඒ කාරක සභාවේ සියලුම මන්ත්‍රීවරුන්ට හා නිලධාරීන්ට ස්තුතිවන්ත වෙනවා මේ සඳහා ලබා දුන් සහයෝගයට.

## 2015 අංක....... දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය: තෙවන වර කියැවීම
PAWNBROKERS' STATUTE OF THE NO. … OF 2015: THIRD READING

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, *"බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2014 අංක .... දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය"* තෙවන වර කියවීම සඳහා ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය සංශෝධිතාකාරයෙන් විමසන ලදින්, සභා සම්මත විය.***
*Question, as amended was put and adopted*

[1] 2015.04.28 වන දින න්‍යාය පත්‍රය සමඟ අමුණන ලද ප්‍රඥප්ති පිටපත වැඩ කටයුතු අවසානයේ පළ කර ඇත.

***පූර්ණ කාරක සභාව නැවත පළාත් සභා තත්ත්වයට පත් කිරීම.***
*THE PROVINCIAL COUNCIL RESUMED.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී පූර්ණ කාරක සභාව සභා තත්ත්වයට පත් වෙනවා.

***ඊට අනුකූලව අ.භා. 12.17 ට පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් විය.***
*Accordingly at 12.17 p.m. the Provincial Council resolved it self in to a committee of the whole Council.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය පූර්ණ කාරක සභා අවස්ථාවේ දෙවන වර කියැවීමේදීත්, තෙවන වර කියැවීමේදීත් ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත වූ බව පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය ලෙස ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රය අනුව මීළඟට පෞද්ගලික මන්ත්‍රී කටයුතු තිබෙන්නේ. නමුත් මට මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා රීති අත්හිටුවීමේ යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ නිසා එම යෝජනාව ඉදිරිපත් කරන ලෙස එතුමාට ආරාධනා කරනවා.

# රීති අංක 107 යටතේ යෝජනාව
## MOTION UNDER RULE NO : 107

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, *"පොදු වැදගත්කමකින් යුක්ත වූද, හදිසි වූද, පහත සඳහන් යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්ය පටිපාටි රීති 107 යටතේ සලසා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව හා ඊට අනුශාංගිකව කාර්ය පටිපාටි රීති 8(5), 8(6), 15(2), 15(5), 53(2), 53(3), 57(3) හා 57(5) යන රීතීන් අත්හිටුවිය යුතු යැයි යෝජනා කරමි."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ගරු සභාපතිතුමනි, නැවත වරක් මම මේ සභාවේ යෝජනා කරනවා 67(8) වගන්තිය සම්බන්ධයෙන්. මෙම කරුණ සම්බන්ධයෙන් චෝදනා ලබලා තිබෙනවා. ඒ වාගේම විවිධ පාර්ශව විසින් පැමිණිලි ගණනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නිසා මේ අධිකරණයේ ඉදිරි දින කිහිපය තුළ ප්‍රශ්න ගත වන ගැටළුවක්. අපේ රීති සංග්‍රහයේ පැහැදිලිව සඳහන් වෙනවා, *"කිසියම් මන්ත්‍රීවරයකු අධිකරණයේ විනිශ්චයට භාජනය වී ඇති කරුණක් සම්බන්ධයෙන් හෝ අධිකරණමය තීන්දුවක් අපේක්ෂා කරන ..."* - මේ වන විට පැමිණිල්ලක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නිසා මේ සභාව ඉස්සරහා දිගින් දිගටම මේ කාරණය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සුදුසු නැහැයි කියන යෝජනාව තමයි මම මේ සභාවට ඉදිරිපත් කරන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමාගේ අදහස -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා පොඩ්ඩක් ඉන්න. එතුමාට අවස්ථාව දෙන්න. කලබල වෙන්න එපා.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

රීති අපි ඉදිරිපත් කරන්නේ. රීත්‍යානුකූලව මේ සභාවේ දිගින් දිගටම මේ පිළිබඳව විවාදයක් පවත්වන්න බැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා මේ යෝජනාව අපි විශ්වාස කරන්නේ නැහැ හදිසි වැදගත්කමක් තිබෙන යෝජනාවක් කියලා. බරපතළ නීතිමය ගැටළු රාශියකට මැදිහත් වුණු ප්‍රශ්නයක්. විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව අර්ථ නිරූපන ඉදිරිපත් වන අවස්ථාවක්. ඒ නිසා මේ වෙලාවේ මේ විවාදයට භාජනය වන අධිකරණ කටයුත්තක් හා

[ගරු සිසිර ජයකොඩි - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා]

සම්බන්ධ පැමිණිලි ඉදිරිපත් වී තිබෙන නිසා සාකච්ඡා නොකළ යුතුයි කියන යෝජනාව අපි ඉදිරිපත් කරනවා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, මම මේ යෝජනාව කරන මන්ත්‍රීවරයා හැටියට අදහස් ඉදිරිපත් කරන්නේ. දැන් මේ 67(8) තිබෙන්නේ, "*කිසියම් මන්ත්‍රීවරයකු අධිකරණයේ විනිශ්චයට භාජනය වී ඇති කරුණක් සම්බන්ධයෙන් හෝ අධිකරණමය තීන්දුවක් අපේක්ෂා කරන*" කියලා. මම මේ ඉදිරිපත් කරන යෝජනාව අධිකරණ තීන්දුවක් අපේක්ෂාවෙන් ඉදිරිපත් කරපු යෝජනාවක් නොවෙයි. මේ යෝජනාව දේශපාලනිකව ඉදිරිපත් කරපු යෝජනාවක්. ඒ නිසා අධිකරණයේ ක්‍රියාදාමය තිබෙන්නේ නීතිය හා ව්‍යවස්ථාව උල්ලංඝනය පිළිබඳව -

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

පොලීසියේ පැමිණිල්ලක් දීලා තිබෙනවාද නැද්ද කියන්න. පොලීසියේ පැමිණිල්ලක් තිබෙනවා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

මේ සභාවේ මම සාකච්ඡා කරන කරුණ ඇවිල්ලා අධිකරණයේ සම්බන්ධයක් නැහැ. එතුමා මතු කරපු කාරණාවත් එක්ක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් ප්‍රශ්නයක් තිබෙනවා ගරු මන්ත්‍රීතුමා. දැන් ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා -

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඔව්. ඒක තමයි. මම ඒක විග්‍රහ කරන්නම්. ගරු සභාපතිතුමනි, -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නැහැ. ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. ඔබතුමා ඉන්න කෝ කලබල වෙන්නේ නැතිව. මෙතුමා කථා කරනවා නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නැහැ. මටත් අවස්ථාවක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඉන්න කෝ කලබල වෙන්නේ නැතිව.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මටත් අයිතියක් තිබෙනවා කථා කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙනවා ඉතින්. ඔබතුමා හැම තිස්සේම කලබල වෙනවා නේ. කරුණාකර වාඩි වෙන්න.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, මම මේ ඉදිරිපත් කරලා තිබෙන යෝජනාව කිසිම අධිකරණයක -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අධිකරණයක නඩුවක් තිබෙන කාරණාවක් නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වන්න. යෝජනාව ගෙනාවේ එතුමා නේ. ඒ නිසා අපි එතුමාට අවස්ථාව දෙමු.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

මේ යෝජනාව ඇවිල්ලා අධිකරණයට සම්බන්ධ වුණු හෝ අධිකරණ තීන්දුවක් සම්බන්ධයෙන් බලපෑම් කිරීම හෝ මේ යෝජනාවේ නැහැ. මේ යෝජනාවේ තිබෙන්නේ යම්කිසි ක්‍රියාදාමයක් පිළිබඳ දේශපාලනිකව ක්‍රියාදාමයක්

සිද්ධ වෙනවා. ඒ ක්‍රියාදාමය පිළිබඳව පළාත් සභාව තුළ සාකච්ඡා කිරීම හා විවාදයක් කිරීම විතරයි මේ යෝජනාව තුළ තිබෙන්නේ. ඒ නිසා මෙය අධිකරණයට බලපෑම් කරන්න හෝ මේක නඩුවක් තිබෙනවා කියලා මේ යෝජනාව නොගත යුතුයි කියලා කොහේවත් රීතිවල නැහැ. ඒ නිසා මේක විවාදයට ගැනීම තුළ කිසිම අධිකරණය සම්බන්ධයෙන් බලපෑමක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මගේ කිසි ප්‍රශ්නයක් නැහැ. නමුත් ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විරෝධයක් පළ කළා. මම එකඟයි මේ පිළිබඳව විවාදයකට යන්න. මම අවස්ථාව දෙනවා. නමුත් මට දැන් මේ අවස්ථාවේ ඒක කරන්න බැහැ. මට සභාවේ එකඟතාවය ගන්න සිද්ධ වෙනවා. සභාවේ කැමැත්ත ගන්න වෙනවා. නැතිව මෙය ගන්න දෙන්න බැහැ නේ? මම ඔබතුමාගේ යෝජනාවට විරුද්ධ නැහැ. නමුත් එතුමා පොඩි විරෝධතාවයක් ඉදිරිපත් කළා. ඒ නිසා මට සභාවේ කැමැත්ත ගන්න ඕනෑ. කැමැත්ත අරන් අපි යමු. ප්‍රශ්නයක් නැහැ. කරුණාකර සීනුව නාද කරන්න. පැහැදිලිවම අපට ඡන්දයකට යන්න වෙනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

තවම යෝජනාව කියවලත් නැහැ. ඉස්සෙල්ලා යෝජනාව කියවලා බලන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා රීති අත්හිටුවීමේ යෝජනාවට නේ විරෝධය පළ කළේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

රීති අත්හිටුවීමේ යෝජනාව ඉදිරිපත් කළේ නැහැ තවම.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා රීති අත්හිටුවීමේ යෝජනාවට තමයි විරෝධය පළ කළේ. මේක වැදගත්කමක් නැති යෝජනාවක් වශයෙන් සලකනවා කියලා. එතැනට එතුමා ගෙනාවේ. යෝජනාවට නොවෙයි.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

යෝජනාව මම දාන්නම්. ඔබතුමා තීරණය කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, එතුමා -

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

යෝජනාව කියවන්න දෙන්න කෝ.

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, දැන් මෙතුමා ඒකට විරෝධතාවය - ඔබතුමා ඒකේ තීරණය ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඇත්ත වශයෙන්ම මට සිද්ධ වෙනවා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වැරදි තර්කයක් නේ ගෙනාවේ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

මම යෝජනාව කියවන්නම්. ඊට පස්සේ තීන්දුවක් ගන්න. "ශ්‍රී ලංකාවේ ජාතික කොඩිය හා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

යෝජනාව කියවන්න එපා. පොඩ්ඩක් ඉන්න. එතුමා මුලින්ම විරෝධතාවය ගෙනාවේ රීති අතිහිටුවලා ගෙනාවේ. ඒ නිසා දැන් ඒ සම්බන්ධව ඉස්සෙල්ලාම සභාවේ තීන්දුවක් ගනිමු.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, මම මේ කරන යෝජනාව එතුමා මතු කරන ප්‍රශ්නයත් එක්ක සම්බන්ධයක් තිබෙනවාද නැද්ද කියලා ඔබතුමා කියන්න. මම යෝජනාව ඉදිරිපත් කරන්නම්. ඔබතුමා කියන්න. එතුමා කියනවා නම්.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

රීති අත්හිටුවනවාද නැද්ද කියලා සලකා බලන්නයි මුලින්ම තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට සිද්ධ වෙනවා, ඉස්සෙල්ලා ඒකට සභාවේ එකඟතාවය විමසන්න.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. (බාධා කිරීම්) රීති අත්හිටුවීමේ - (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වරප්‍රසාද ප්‍රශ්නයක් නේ? එතුමාට අවස්ථාව දෙන්න. එතුමා වරප්‍රසාද කඩ කළාට අපි එතුමාට අවස්ථාව දෙනවා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, රීති අත්හිටුවීම සම්බන්ධ ගැටළුවේදී ආණ්ඩු පක්ෂය පැත්තෙන් මතු වුණා රීති අත්හිටුවීම අධිකරණයට සම්බන්ධ ක්‍රියාවලියක් සම්බන්ධවයි කියලා. එතුමා දැනුවත් වෙලා ඉන්නවා. නමුත් දැන් ඔබතුමා උත්සාහ කරනවා, සභාවේ අදහස් විමසන්න. හැබැයි, මන්ත්‍රීවරු විධියට අපි දන්නේ නැහැ මොකකටද මේ අදහස් විමසන්නේ කියලා. එතුමා දන්නවා යෝජනාව සම්බන්ධයෙන්. හැබැයි, අපි දන්නේ නැහැ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඉතින් ඔබතුමා යෝජනාව දන්නවා නේ?

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඒක තමයි යෝජනාව ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්න.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

මම යෝජනාව කියවන්නම්. "ශ්‍රී ලංකාවේ ජාතික කොඩිය - (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ යෝජනාව මම කණ්ඩායම් නායකයින්ට ලබා දුන්නා. නැහැයි කියන්න බැහැ. කිසි කෙනෙකුට දුන්නේ නැහැයි කියන්න එපා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

අපට යෝජනාවක් දීලා නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පක්ෂ නායකයින්ට ලබා දීලා තිබෙන්නේ. කිසිම කෙනෙකුට නැහැයි කියන්න බැහැ ඒක.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

කණ්ඩායම් නායකයින් සියලු දෙනාටම දීලා තිබෙනවා.

**ගරු සුනිල් ජයමිණී**
Hon. Sunil Jayamini

ඔබතුමා ඡන්දය විමසන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

අපේ මේ න්‍යාය පත්‍රයේ හැමදාම තිබෙන වැදගත් යෝජනා තිබෙනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, සභාවේ අවධානය යොමු කරනවා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, මේක මේ ජාතික කොඩිය ගැන සාකච්ඡාවක්. ඇයි භය වෙන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, කාර්ය පටිපාටි රීතිවල අපි අවධානය යොමු කරනවා. ඔබතුමාගේ අවධානය මේ කාර්ය පටිපාටි රීති 107(1). මේ රීති අත්හිටුවීම ගැන තිබෙන රීතිය මම කියවන්න යන්නේ. *"හදිසියේ කළ යුතුව ඇති අත්‍යවශ්‍ය කටයුත්තක් සඳහා කාර්ය පටිපාටි රීති එකක් හෝ කිහිපයක් හෝ බාධාවක් බව පෙනෙන කල්හි ඕනෑම අමාත්‍යවරයකුට එම රීතිවල අංක සඳහන් කරමින් ඒවා අත්හිටුවීමට යෝජනා කළ හැකි විය යුතුය."*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ අමාත්‍යවරයකුට.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

හරි. ඒක හරි. ඉන්න මම කියනකම්. රීති ටික කියන්න එපැයි. ඊට පස්සේ රීති අත්හිටුවීමට හේතු වන කාරණාව කෙටියෙන් සඳහන් විය යුතුය. ඊළඟට (2) යටතේ කියනවා, මන්ත්‍රීවරයකු විසින් ද එවැනි යෝජනාවක් ඉදිරිපත් කළ හැකිය. මන්ත්‍රීවරයකුගේ එබඳු යෝජනාවක් තවත් මන්ත්‍රීවරයකු විසින් ස්ථිර කළ යුතුය. ඊට පස්සේ අමාත්‍යවරයකු විසින් ඉදිරිපත් කරනු ලබන විට හැර යෝජනාවට පක්ෂ වන මන්ත්‍රීවරුන් ගණන ගණ පූරණයට අවශ්‍ය ගණනට අඩු වන්නේ නම් එම යෝජනාව සම්මත නොවූ ලෙස සැලකිය යුතුය. එතකොට යෝජනාව කියවන්නේ නැතිව, මේක කරන්න බැහැ. මේ රීතිවල තිබෙන විධියට. මේකේ තිබෙන්නේ එහෙමයි.

[සභාවේ ඝෝෂා]

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

යෝජනාව මොකක්ද කියලා දැන ගන්න එපැයි. ඒක තමයි මම කිව්වේ යෝජනාව කියවන්නම් කියලා. ගරු සභාපතිතුමනි, මම යෝජනාව කියවන්නම්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කියවන්න ඕනෑ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

නැහැ. රීති අත්හිටුවන්න යෝජනාව ගේන්න ඕනෑ. යෝජනාව පස්සේ ගේන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය ඉදිරිපත් කරපු 107 (1) රීතිය යටතේ තුන්වැනි ඡේදයේ තිබෙන්නේ, මන්ත්‍රීවරු ඉදිරිපත් කරනවා නම් ගණපූරණය හා සමාන වෙන්න ඕනෑ කියලා. එහෙම නම් ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන පක්ෂයේ 33 ක් නොවෙයි අපේ සභාවේ 35 ක් වෙන්න ඕනෑ. ඒ සංඛ්‍යාව ඉන්නවා නම් ගන්න පුළුවන්. මට පේන හැටියට ඒ සංඛ්‍යාව මේ සභාවේ මේ පක්ෂයේ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මට රීති ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, මගේ වරප්‍රසාද ප්‍රශ්නයට පිළිතුරු ලැබුණේ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මට විනාඩියක් දෙන්න. අපේ සිසිර ජයකොඩි ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, රීති අනුව -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නැහැ, නැහැ. සිසිර ජයකොඩි ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා මෙතැනට ගෙනාපු තර්කය තමයි මේක උසාවියේ විභාගයට භාජනය වුණු කරුණක් කියලා. මේ යෝජනාවේ එහෙම කිසිම දෙයක් නැහැ. ඉතින් ඒක සලකන්න ඔබතුමාට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දිගින් දිගටම මේක විවාද කරන්න බැහැ. මොකද මම -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක වෙනම දෙයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට උදේ මේ යෝජනාව 09.25 ට ලැබුණු නිසා මම ලේකම්තුමාට උපදෙස් දුන්නා සියලුම පක්ෂ නායකයින්ට මේ යෝජනාවේ පිටපත් දෙන්න කියලා. මම ඒක මුලින්ම කළා. ලැබුණේ නැහැ කියලා කියන්න බැහැ.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

අපට ලැබුණේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම දන්නේ නැහැ. ඒ නිසා මට ඉන් එහාට යන්න බැහැ. කරුණාකර සීනුව නාද කරන්න.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඔබතුමා පක්ෂ නායකයාගෙන් ඉල්ල ගන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පක්ෂ නායකයාගෙන් ඉල්ල ගන්න.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

පක්ෂ නායකයා One man show JVP එකේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මටත් ලැබිලා නැහැ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, ඇයි ජාතික කොඩිය ගැන කථා කරන්න බය? ඇයි බය? බය වෙන්න එපා.

[සභාවේ ඝෝෂා]

උතුරේ මහ ඇමැති එල්.ටී.ටී.ඊ. කොඩිය ඉස්සුවේ. ඇයි ඒවා කථා කරන්නේ නැත්තේ?

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඒකත් අපි කථා කරමු.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

උතුරේ එල්.ටී.ටී.ඊ. කොඩිය ඉස්සුවේ. ඇයි ඒවා කථා කරන්නේ නැත්තේ?

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඒකත් අපි කථා කරමු.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

එල්.ටී.ටී.ඊ. කොඩිය උස්සපු එක ගැන වෙනම ගේමු.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඒ යෝජනාවත් ගේන්න.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

කොන්ද පණ නැහැ. ඔබතුමන්ලාගේ නායකයාට ඊට වඩා කොන්දක් තිබ්බා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

යෝජනාවත් ගේන්න.

[සභාවේ සෝෂා]

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

උතුරේ මහ ඇමැතිට රනිල් බැන්නා. තනතුරට නොගැළපෙන සේ කටයුතු කරනවා කියලා කිව්වේ සිංහ කොඩිය උස්සපු නිසා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයකට ඉඩක් නැද්ද? දැන් මේ රීතිවල තියෙන්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි දැන් සභා රීතිවලට අනුව - දැන් මේ ප්‍රශ්නයක් තිබෙනවා නේ? සීනුව නාද කරලා තියෙන්නේ. ඒ නිසා මේ අවස්ථාවේදී සභාවේ එකඟතාවය ගන්න සිද්ධ වෙනවා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

මොකටද ගන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අත්හිටුවීමේ යෝජනාවට සභාවේ එකඟතාව ගන්න වෙනවා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

යෝජනාව ඉදිරිපත් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අත්හිටුවීමේ යෝජනාවට නේ ප්‍රශ්නය ආවේ. ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා, ඔබතුමා මට මුලින්ම ඉදිරිපත් කළේ, රීති අත්හිටුවීමේ යෝජනාවට විරෝධය ප්‍රකාශ කරලා. ඒ නිසා මට සිද්ධ වෙනවා රීති අනුව ඒ සඳහා එකඟතාව විමසන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේගොල්ලෝ රටේ ජාතික කොඩිය විකෘති කරනවාට කැමැති අය.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

උතුරේ එල්.ටී.ටී.ඊ. කොඩිය ඉස්සුවා. ඒ ගැන කතා කළාද?

[සභාවේ සෝෂා]

ජාතික කොඩිය ගැන කථා කරන්න යනකොට මේ අය ඒකට අකුල් හෙලනවා. ලැජ්ජ වෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා සෝෂා කිරීම් කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ජාතික කොඩිය බාල්දු කරන්න බලාගෙන ඉන්න කට්ටිය. ජාතිවාදය අවුස්සලා රටේ ප්‍රශ්නයක් ඇති කරන්න බලාගෙන ඉන්න කට්ටිය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා අද උදේ 09.25 ට මට රීති අත්හිටුවීමේ යෝජනාවක් ඉදිරිපත් කළා. මම ඒ වෙලාවේම

[ගරු සභාපතිතුමා]

ලේකම්තුමාට උපදෙස් දුන්නා එම රීති අත්හිටුවීමේ යෝජනාව සහ එතුමාගේ යෝජනාව සම්බන්ධයෙන් පිටපත් සියලුම පක්ෂ නායකයින්ට සහ කණ්ඩායම් නායකයින්ට ලබා දෙන්න කියලා. ඒ අනුව සභා ලේකම්තුමා එම පිටපත් ලබා දීලා තිබෙනවා. එම නිසා ඒ ඒ පක්ෂවල කිසිම මන්ත්‍රීවරයෙකුට කියන්න බැහැ අපි දන්නේ නැහැ, අපට ලැබුණේ නැහැ කියලා. ඉන් පසුව ගරු මන්ත්‍රීතුමා විසින් රීති අත්හිටුවීමේ යෝජනාව ඉදිරිපත් කිරීමේදී සිසිර ජයකොඩි ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා රීති අත්හිටුවීම සම්බන්ධයෙන් විරෝධතාව ප්‍රකාශ කළා. ඒ නිසා මට සිද්ධ වෙනවා සභාපතිවරයා වශයෙන් රීති අනුව එම රීති අත්හිටුවීමේ යෝජනාවට සභාවේ බෙදීමක් තිබෙන නිසා එකඟතාවය විමසන්න. ඒ අනුව එම යෝජනාව ගෙන ඒමට විපක්ෂ මන්ත්‍රීවරු -

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ජාතික කොඩියට විරුද්ධ අය නැඟිටින්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ජාති ද්‍රෝහියෝ නැඟිටින්න. ජාතික කොඩියට විරුද්ධ අය නැඟිටින්න.

[සභාවේ ඝෝෂා]

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ජාතික කොඩියට විරුද්ධ අය නැඟිටින්න.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ජාතික කොඩිය විකෘති කරනවාට කැමැති අය නැඟිටින්න.

[සභාවේ ඝෝෂා]

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, රීති අත්හිටුවීමේ යෝජනාව සම්බන්ධයෙන්,මේ යෝජනාව දැනුවත් කරලා තමයි ඔබතුමා මේ යෝජනාව -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ජාතික ගීය දෙමළෙන් කියන කට්ටිය නැඟිටින්න.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ජාතික කොඩියට විරුද්ධ නම් නැඟිටින්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කෝ අර කොන්ද පණ තියෙන අය පෙන්නන්න කෝ බලන්න. මහ ඇමැතිතුමා කෝ?

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න. මට එකඟතාව ගන්න ඕනෑ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

මේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු, තමුන්නාන්සේලා කඩේ යනවා. තමුන්නාන්සේලා මෙහෙයවනවා. අද නායකත්වයක් නැහැ. අද මෙයාගේ මතයට යට වුණා. ජාතික කොඩියේ කමිටුවේ සභාපති කවුද?

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ජාතික කොඩියේ කමිටුවේ සභාපතිතුමා බණ්ඩාරනායක මහත්මයා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මූලධර්ම වාදියා. ජාතිවාදියා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න. සියලුම ගරු මන්ත්‍රීවරු වාඩි වෙන්න.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ජාතික කොඩියේ කමිටුවේ සභාපතිතුමා බණ්ඩාරනායක මහත්මයා. බණ්ඩාරනායක මහත්මයා මේ ජාතික කොඩිය හැදුවේ. මේවා විකෘති කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් නිශ්ශබ්ද වෙන්න. මට අවස්ථාව දෙන්න. කාර්ය පටිපාටි රීති අංක 107 යටතේ මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනාවක් ඉදිරිපත් කළා. ආණ්ඩු පක්ෂයෙන් එම යෝජනාව සම්බන්ධයෙන් රීති අත්හිටුවීමට විරෝධතාවයක් ආවා. ඒ නිසා සභාපතිවරයා වශයෙන් මට සිද්ධ වෙනවා සභාවේ එකඟතාවය විමසන්න.

***ප්‍රශ්නය විමසන ලදින් 61 (3) රීතිය යටතේ පළාත් සභාව පක්ෂව 24 යි, විරුද්ධව 31 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*Question put and the Council divided as per Rule No 61 (3), 24 for, 31 against and 00 decliners.*

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාට ආරාධනා කරනවා ඔබතුමාගේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාව ඉදිරිපත් කරන ලෙසට.

[සභාවේ ඝෝෂා]

කරුණාකර ගරු මන්ත්‍රීතුමන්ලා තමන්ට නියමිත අසුන්වලට යන්න. ඊළඟ යෝජනාව ඉදිරිපත් කිරීමට අවශ්‍යයි. ඒ නිසා නියමිත අසුන්වලට යන්න. කරුණාකර නියමිත අසුන්වලට යන්න.

[සභාවේ ඝෝෂා]

මම මේ අවස්ථාවේදී මෙම සභාව විනාඩි 10 කට තාවකාලිකව අත්හිටුවනවා.

***සභාවේ මන්ත්‍රීවරු පිරිසක් සභා ගර්භය මැදට පැමිණි නිසා ඇති වූ නොසන්සුන්තාවය මත ගරු සභාපතිතුමා විසින් අ.භා. 12.49 ට පළාත් සභාව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 01.02 ට යළිත් රැස්විය.***

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයට අනුව පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු යටතේ ඊළඟ තිබෙන්නේ මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් යෝජනාව ඉදිරිපත් කිරීමට. ඒ සම්බන්ධව කාලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. මොකද අපේ සභාව පස්වරු 01.30 ට අවසන් වෙනවා. මෙම යෝජනාවට අපි පැයක කාලයක් වෙන් කරලා තිබෙනවා. දැන් එම යෝජනාව ඉදිරිපත් කිරීමට අවස්ථාවක් නැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, ඇත්තට මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමාගේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් ඉන්න. තත්පරයක් ඉන්න. ඔබතුමා -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඊළඟ සභා වාරයේදී ගමු.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

යෝජනාව සම්බන්ධයෙන් නොවෙයි. මම ගියවර සභාවේදී මීරිගම මධ්‍ය මහා විද්‍යාලය ගැන ප්‍රශ්නයක් අහද්දී ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ පැත්තෙන් නිලධාරීන් සමග සාකච්ඡා කරලා මේ සභා වාරයේදී -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා පොඩ්ඩක් ඉන්න. සභාව කල් තැබුවේ නැහැ. මෙතුමාට අවස්ථාව දෙන්න. ඔබතුමාට වරප්‍රසාද ප්‍රශ්නයක්ද?

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

වරප්‍රසාද ප්‍රශ්නයක්. ඇත්තෙන්ම මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරපු රීති අත්හිටුවීමේ යෝජනාව - එවැනි යෝජනා එන සෑම අවස්ථාවකදීම පක්ෂ නායකයෙක් හැටියට මටත් ලැබෙනවා. හැබැයි, මේ මන්ත්‍රීවරු එක වෙලාවකට පැමිණෙන්නේ නැහැ. එක එක අය එක එක වෙලාවට පැමිණීම නිසා මේ යෝජනාව සමහර වෙලාවට මන්ත්‍රීවරුන්ට දෙන්න පුළුවන්කමක් නැති වෙනවා. කථා කරන්නත් බැරි තත්ත්වයක් ඇති වෙනවා. අපිත් වෙන වැඩවල නියැලිලා හිටියාම. ඒ නිසා මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි අපට අමතරව මේ පැමිණෙන අදාළ මන්ත්‍රීවරු සියලු දෙනාට මේ යෝජනාව ලබා දීමට නොහැකිකමක් තිබෙනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙන්න පුළුවන්. සාමාන්‍යයෙන් අපි සම්ප්‍රදායක් හැටියට මුලින්ම යෝජනාව ලැබුණු ගමන් කරන්නේ එම යෝජනාවේ පිටපත් පක්ෂ නායකයින්ට සහ කණ්ඩායම් නායකයින්ට ලබා දෙනවා. ඊට පස්සේ යෝජනාව ඉදිරිපත් කිරීමේදී අපි සියලුම මන්ත්‍රීවරුන්ට එම යෝජනාවේ පිටපතක් අපි -

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

නැහැ, සියලු මන්ත්‍රීවරුන්ට ලැබිලා නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා තේරුම් ගන්න. සභාවට යෝජනාව ඉදිරිපත් කළාට පස්සේ. ක්ෂණිකව අපේ කාර්ය මණ්ඩලය පිටපත් මුද්‍රණය කරලා අපි මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබනවා. ඒක තමයි ක්‍රමය.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒක හරි ගරු සභාපතිතුමනි. දැන් ඔබතුමා මෙතැන ප්‍රකාශ කිරීමත් එක්කම මාත් එක්ක අපේ පක්ෂයේ මන්ත්‍රීවරු දෙදෙනෙක් ඇවිල්ලා කථා කළා. මේ යෝජනාව සම්බන්ධයෙන් ඒ අයගේ දැනුවත්භාවයක් තිබුණේ නැහැ. මොකද, ඒක මගේ අඩුවක් වෙන්නත් පුළුවන්. ඒ පැමිණෙන අය පැමිණෙන අවස්ථාවට දැනුවත් නොකිරීම. යෝජනාව අනුමත වුණාට පස්සේ ලැබෙන එක හරි. මම කියන්නේ ඊට ප්‍රථම වුණත් මේ කරන රීති අත්හිටුවීමේ යෝජනාවක් මන්ත්‍රීවරුන්ට ලබා දෙන්න බැරිද? ඇයි බැරි?

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, රීති අත්හිටුවලා ගේන යෝජනාව සභාගත කරන්න පුළුවන්කම ලැබෙන්නේ රීති අත්හිටෙව්වාට පස්සේ. මේ යෝජනාව සම්බන්ධයෙන් මුලින් පක්ෂ නායකයින්ට හා කණ්ඩායම් නායකයින්ට භාර දෙන්නේ පක්ෂයේ නියෝජිතයින් එක්ක සාකච්ඡා කරලා මේ සම්බන්ධව විරුද්ධ වෙනවාද නැද්ද, හා කියනවාද බෑ කියනවාද කියන කාරණාව කථා කරන්න. ඒකයි ඒ අවස්ථාව දෙන්නේ. අත්හිටුවන යෝජනාවේදී අපට විරුද්ධ වෙන්නත් පුළුවන්. නොවී ඉන්නත් පුළුවන්. ඒක නිසා තමයි කණ්ඩායම් නායකයින්ට යෝජනාව භාර දෙන්නේ. ඒක අනුමත වුණොත් විතරයි මහජන නියෝජිතයෙකුට ලබා දෙන්න පුළුවන්කම ලැබෙන්නේ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

එහෙම කොහේද රීතියේ තියෙන්නේ?

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒක සම්ප්‍රදාය.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

සම්ප්‍රදාය නොවෙයි. සම්ප්‍රදාය අපට වෙනස් කරගන්න පුළුවන්.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒක ඔබතුමන්ලා සභා කටයුතු කාරක සභාවේදී සාකච්ඡා කරලා තීන්දු කරන්න. (බාධා කිරීමක්)

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඔක්කෝම මෙතැන 09.30 ට ඇවිල්ලා ඉන්නේ නැහැ නේ? ඒකනේ අපි මේ කියන්නේ. එහෙම කියන්න බැහැ. මේ මන්ත්‍රීවරු ඔක්කෝම - එහෙම නම් මීට පස්සේ අපි 09.30 ට මෙතැන රැස්වීම පටන් ගන්නකොට නැති වුණොත් ගණපූරණය නැහැයි කියලා මේ සභාව අත්හිටවනවා. හරිද? ඒ එකඟතාවයෙන් යමු. ඊට පස්සේ කියන්න එපා ගණපූරණය නැහැයි කියලා සභාව අත්හිටෙව්වා කියලා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. දැන් මම රීති අත්හිටුවීමේ යෝජනාව ගෙන එනකොට සිසිර ජයකොඩි සංවිධායකතුමා ඉදිරිපත් කළා, උසාවියේ කාරණාවක් සම්බන්ධයෙන් තිබෙනවා. ඒ නිසා මේ යෝජනාව මෙතැන සාකච්ඡා නොකළ යුතුයි කියලා. ගරු සභාපතිතුමනි, මම හිතනවා එහෙම උසාවියේ තිබෙනවා කියලා ප්‍රකාශයක් කරලා විතරක් බැහැ. එහෙම නම් නඩු අංක, උසාවිය සියලුම දේවල් සභාවට ඉදිරිපත් කළ යුතුයි. නිකම් මෙතැන නැඟිටලා එහෙම සභාව නොමඟ යන විධියට ප්‍රකාශ කරලා ඒ උඩ සභාපතිතුමා තීන්දු ගන්න යනවා නම් ඒක වැරැදියි. එතකොට නඩු අංක නැහැ. උසාවිය නැහැ. මුකුත් නැතුව එතුමා නැඟිටලා කියනවා උසාවියේ තියෙනවා කියලා. එහෙම නම් ඒක සභාවට ඉදිරිපත් කරන්න ඕනෑ. සභාවට ඉදිරිපත් කරන්නේ නැතුව නිකම් ප්‍රකාශ නිකුත් කරන්න බැහැ. ඔබතුමා නඩු අංකය කියන්න.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ගරු සභාපතිතුමනි, ඔබතුමා මේ යෝජනාව නොගන්න තීරණය කළේ ඡන්ද විමසීමෙන්. අපේ ඡන්ද වැඩි වුණා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා වගකීමක් ඇතුව සභාවට ප්‍රකාශයක් කරන්න ඕනෑ.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ඡන්ද විමසීමකදී - අධිකරණමය ප්‍රශ්න ගැන අපි අතර බෙදීමක් තිබුණා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

අධිකරණයේ ක්‍රියා මාර්ගයක් තිබෙනවා නම් අපි දන්නේ නැහැ, මේක තවම අධිකරණයේ තියෙනවාද කියලා. එතුමා විතරයි දන්නේ මේක අධිකරණයේ තියෙනවා කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු සභාපතිතුමනි, එතුමා නීතිඥයෙක්. ප්‍රශ්නයක් නැහැ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

එහෙම නම් එතුමා ඉදිරිපත් කරන්න ඕනෑ.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

අධිකරණ කටයුත්තක අපි අතර මත දෙකක් තිබුණා. ඔබතුමා කිව්වා ඡන්ද විමසුම කියලා. මේ සභාවේ රීති අත්හිටුවනවාද නැද්ද කියලා තීරණය කළේ ඡන්ද විමසීමෙන්. තමුන්නාන්සේලාගේ ඡන්ද අඩුයි.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, ඔබතුමා අපි ගේන හැම රීති අත්හිටුවීමේ යෝජනාවකටම ඡන්දයකටම යනවා නම් - (බාධා කිරීමක්) නමුත් මෙතුමා කිව්ව කාරණය පදනම් කරගෙන ඡන්ද විමසීමට විරුද්ධය ප්‍රකාශ කළේ. ඒක වරප්‍රසාද උල්ලංඝණය කිරීමක්. මොකද, මෙතුමා සභාව නොමඟ යවලා තිබෙනවා. කිසිම සාධක ඉදිරිපත් කරන්නෙ නැතුව, නඩු අංක ඉදිරිපත් කරන්නේ නැතුව -

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

මේ අවුරුදු 20 ක් පළාත් සභාවේ තිබුණු සම්ප්‍රදායක්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න. යම් කාරණයක් මතු කරලා පෙන්වන්න. මේකට අදාළව නොවෙයි. මේක මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නයක්. මොකද, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කරලා තිබෙනවා ඕනෑම කෙනෙකුට තමන් කැමැති ආගමක් අදහන්න පුළුවන්. තමන් කැමැති දේශපාලන මතයක් දරන්න පුළුවන්. මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා කථා කරමින් ඉදිද්දී අපේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක සිසිර ජයකොඩි මැතිතුමා එක අවස්ථාවකදී අන්තවාදියා, අල්කයිඩා කියලා වචන පාවිච්චි කළා. එක වෙලාවක එතුමා කිව්වා තම්බි කියලා. කරුණාකරලා ඒ වාගේ වචන පාවිච්චි කරන්න එපා කියන්න. ජාතිය පදනම් කරගෙන, ආගම පදනම් කරගෙන -

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ගරු සභාපතිතුමනි -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමාට නැහැ කියන්න බැහැ. මගේ කණට ඇහුණු එක මම කියන්නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ජාතිවාදය අවුස්සන්න එපා.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

එතුමා මෙතැනට ඇවිල්ලා කියද්දී කිව්වා. මම එතුමාට සභාවේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වාඩි වෙන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, සභාව කල් තියපු වෙලාවේ.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ගරු සභාපතිතුමනි, මගේ වරප්‍රසාද කඩ වෙනවා. ළඟට ඇවිල්ලා අත පය උස්සගෙන එනකොට කිව්වා, අන්තවාදියා කියලා. නැත්නම් මේ සභාව -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සභාව කල් තියපු වෙලාවේ.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

සභාව කල් තියපු වෙලාවේ මගේ ළඟට ආවාම මම කිව්වා අන්තවාදියෙක් කියලා. ඒ ඇරෙන්න මේ සභාවේ ප්‍රකාශ කළේ නැහැ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඔබතුමා තමයි කිව්වේ තම්බියා කියලා.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

පුද්ගලිකව. මෙතැනට ඇවිල්ලා -

[සභාවේ ඝෝෂා]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එහෙම කිව්වේ නැහැ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ජාතික කොඩිය පිළිගන්න එකේ මොකක්ද තියෙන අන්තවාදීකම?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න.

**ගරු මොහොමඩ් මුජිබූර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ජාතික කොඩිය පිළිගන්න එකේ මොකක්ද තියෙන අන්තවාදීකම? ඔබතුමා තමයි අන්තවාදියා. ඔබතුමා ජාතික කොඩිය පිළිගන්නේ නැහැ.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

දෙන්නම අන්තවාදියා කිව්වා. ඒක ප්‍රශ්නයක් නොවෙයි නේ?

**ගරු මොහොමඩ් මුජිබූර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ජාතික කොඩිය පිළිගන්නේ නැහැ. ඔබතුමා තමයි අන්තවාදියා. මම නොවෙයි. ඔබතුමා තමයි අන්තවාදියා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

එතුමාත් කිව්වා. එතුමා කියනවා ඇහුනේ නැද්ද?

**ගරු මොහොමඩ් මුජිබූර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඔබතුමන්ලා තමයි ප්‍රභාකරන්ගේ බාප්පලා. ඔබතුමන්ලා තමයි ප්‍රභාකරන් හැදුවේ.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

එළියට ගිහිල්ලා ඉවර වෙලා කරට අත දාගෙන යාළුවෝ වාගේ ගෙදර යයි. මේගොල්ලෝ බොරුවාට කෑගහනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා මෙතුමාට අවස්ථාව දෙන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මේ යෝජනාවක් පරාජයට පත් කිරීමට ඡන්ද කොපමණ ඕනෑද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇත්ත වශයෙන්ම ගරු විපක්ෂ නායකතුමා රීති අනුව නම් මේ යෝජනාව සභා සම්මත වෙන්නෙත් නැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

අන්න හරි. ඒක තමයි මම මේ කියන්න හදන්නේ. රීති අනුව මේ යෝජනාව සභා සම්මත වෙන්න බැහැ. ඔබතුමා ඒක පිළිගන්නවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අනුව මම පිළිගන්නවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

පිළිගන්නවා. ඇයි හේතුව ඔබතුමන්ලාගේ මේ යෝජනාවට විරුද්ධව ඡන්ද 31 යි ලැබිලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පක්ෂය 24 යි.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

හරි, හරි. ඒක හරි. නමුත් මේ රීති අනුව අඩු ගාණේ ඡන්ද 35 ක් තියෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ යෝජනාව ඉදිරිපත් කරපු පක්ෂයෙන්.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒ වුණාට අනෙක් පැත්තෙන් විපක්ෂව වුණත් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඉදිරිපත් වූ ගණනත් එක්ක 2/3 ක්.

[සභාවේ ඝෝෂා]

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

පොඩ්ඩක් ඉන්න. එහෙම නම් මෝඩ කථා කියන්නේ සභාපතිතුමා වෙන්න ඕනෑ. ඇයි එතුමා කියනවා -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාගේ මතය ප්‍රකාශ කරන්න අවස්ථාව දෙන්න කෝ?

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මම අහපු ප්‍රශ්නයට ඔබතුමා උත්තරයක් දුන්නා. ඒක සභාව පිළිගන්නේ නැහැ කියලා. ඔබතුමා නොපිළිගන්න හේතුව මට පැහැදිලි කරන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ඔබතුමා ඒවා ගෙදර ගිහිල්ලා තියා ගන්න. හරියට සභාව මෙහෙයවන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා -

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඔබතුමා කට වහගෙන ඉන්න අනේ. හැම රෙද්දකටම කථා කරනවා පණ්ඩිතයා වාගේ. මිනිහා මරලා ජීප් එකත් ගෙනැල්ලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාව පොඩ්ඩක් නිශ්ශබ්ද වෙන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, අපි යනවා. අපට මේ විපක්ෂ නායකතුමාගේ මෝඩ පැහැදිලි කිරීම් අහගෙන ඉන්න බැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඔබතුමා යන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අපට මෝඩ කථා අහගෙන ඉන්න බැහැ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඔබතුමා යන්න නීලකාන්ති ළඟට.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

අපි කියන දේ ඔබතුමාට අහගෙන ඉන්න බැහැ තමයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නීලකාන්ති බලාගෙන ඉන්නවා. ඔබතුමා යන්න.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු සභාපතිතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. රීති අත්හිටුවීමේ යෝජනාව අපි ගත්තාට පස්සේ පක්ෂ විපක්ෂය ඡන්දය දුන්නා. ඒ නිසා මේ අවස්ථාවේදී මාධ්‍යයට වැරැදි අර්ථකථනයක් සිදු වෙන්න පුළුවන්. ඔබතුමා පැහැදිලි කිරීමක් කරලා දුන්නා නම් හොඳයි. මොකද, මේ අන්තවාදීන් -

[සභාවේ ඝෝෂා]

සමාවෙලා පොඩ්ඩක් ඉඩ දෙන්න. ගොන් පාට් දාන්නේ නැතුව සමාවෙලා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දැන් බය වෙලා.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ජාතිවාදීන් කවුද කියලා සොයා ගන්න පුළුවන්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා ජාතියෙන් සමාව ගන්නද හදන්නේ.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ඉතිහාසය බැලුවාම දන්නවා කවුද ජාතිවාදීන්? කවුද අන්තවාදීන් කියලා. ඒක නිසා මේ එහා පැත්තේ ඉන්න ගොන් පාට්ලා ගොන් පාට් දානවාට අපට ප්‍රශ්නයක් නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඇති, ඇති. දැන් හැම තිස්සේම ජාතියෙන් සමාව ගන්නේ නැහැ ඔයගොල්ලන්ට. එක පාරක් -

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

අපි ඡන්දය පාවිච්චි කළේ මේ කියන අසික්කිත මට්ටමේ දේශපාලන කටයුත්තකට නොවෙයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කරන හැම කුපාඩි වැඩකටම සිංහල ජාතිය සමාව දෙන්නේ නැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, කාර්ය පටිපාටි රීති අත්හිටුවීම යටතේ 107 (3) අමාත්‍යවරයෙක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම කලින් කිව්වා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඉතින් ඒක තමයි. (බාධා කිරීමක්) 35 ට වැඩිය අඩුයි. 31 යි ඉන්නේ. ඒ යෝජනාව සම්මත නොවූ එකක් හැටියට සැලකිය යුතුයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ සම්බන්ධයෙන් අපි ගොඩක් දුරට සාකච්ඡා කළා.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු සභාපතිතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ගියවර රැස්වීමේදී මම කථා කරලා කිව්වා, මේ සභාවේ රීති අත්හිටුවීම සහ මේ තිබෙන රීති පිළිබඳව අපට අවබෝධයක් නැහැ. අපට වැඩමුළුවක් තියන්න කියලා. එතකොට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වැඩමුළු කියනවා. මට මේක ඉවර කර ගන්න බැරුව ඉන්නවා.

[සභාවේ ඝෝෂා]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු සභාපතිතුමනි, පොඩ්ඩක් ඇහුම්කන් දෙන්න. මම කියන්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා සමාවෙන්න එහෙම කිව්වාට. වැඩමුළු තියන්න මමත් ආසයි. මේ කට්ටියටද වැඩමුළු තියන්නේ.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

අපි එහෙම කිව්වාම විපක්ෂයේ කට්ටිය හිනා වුණාට, අද බලනකොට ඔක්කෝම කට්ටිය දන්නේ නැහැ. වැඩමුළුවක් තියන්න. කවුරුවත් ඉල්ලන්නේ නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උපුල් මහේන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු වැඩමුළු සම්බන්ධයෙන් මේ සභාව ආරම්භ කිරීමේදී අපි හලාවත හෝටලයක වැඩමුළුවක් තිබ්බා. එතැනට කී දෙනාද ආවේ? සහභාගීත්වය අඩුයි. මමත් කැමැතියි වැඩමුළුක් තියන්න. පියල් නිශාන්ත ගරු මන්ත්‍රීතුමාත් වැඩ මුළුවක් තියන්න කියලා ඉල්ලීමක් කළා. දැන් 01.30 ටත් කිට්ටුයි. සාකච්ඡාවක් නිම කිරීම සම්බන්ධයෙන් 60 (2) රීතියේ තිබෙනවා, මෙම රීතිය යටතේ,

කිසියම් යෝජනාවක් ඊට පක්ෂව ඡන්දය දෙන මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව ගණපූරණයට අවශ්‍ය සංඛ්‍යාවට වඩා අඩු නම් එම රීතිය යටතේ කිසියම් යෝජනාවක් ඊට පක්ෂව ඡන්දය දෙන, ඒ කියන්නේ ඔබතුමන්ලා පක්ෂව ඡන්දය දුන්නේ. ඡන්දය දෙන මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව ගණපූරණයට අවශ්‍ය සංඛ්‍යාවට වඩා අඩු නම් එම යෝජනාව වලංගුභාවයට පත් නොවන්නේය. එතකොට මේ යෝජනාවට පක්ෂව ඔබතුමන්ලා - එතකොට ඒ අවස්ථාවේදී ගණපූරණය නැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

නැහැ, නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් ඉන්න. ඊට පස්සේ නැවත වරක් 107 කියනවා, අමාත්‍යවරයෙකු විසින් ඉදිරිපත් කරනු ලබන විට හැර යෝජනාවට පක්ෂ වන මන්ත්‍රීවරුන් ගණන ගණපූරණයට අවශ්‍ය ගණනට අඩු වන්නේ නම් එම යෝජනාව සභා සම්මත නොවූ සේ සැලකිය යුතුය.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

හරියට හරි. අන්න ඉගෙන ගන්න.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, 60 (2) සහ 107 (3) රීති අංක යටතේ මේ වාගේ රීති අත්හිටුවලා හදිසි යෝජනාවක් ගෙන එනවා නම් ඒ යෝජනාවට පක්ෂව මේ සභාවේ ගණපූරණය තියෙන්න ඕනෑ. එතකොට මුලින්ම මේ යෝජනාවට අවශ්‍ය ගණපූරණය නැහැ. විපක්ෂ නායකතුමා කියනවා වාගේ මේ යෝජනාවට අපි ඉදිරිපත් කරපු විරෝධය සලකා බලද්දී ඒකටත් ගණපූරණය නැහැ. ඒක නිසා මේ යෝජනාව ඡන්දයකින් නොවෙයි, සභා සම්මත නොවූ යෝජනාවක් හැටියට සලකන්න ඕනෑ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒක තමයි අපි කිව්වේ. බොරුවට සිංහ කොඩිය උස්සගෙන කෑගහන්න එපා කියලා.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

මේ යෝජනාව සම්බන්ධව විවාදයක් හෝ කථාවක්වත් නැහැ. එතුමාගේ යෝජනාව සභා සම්මත නොවූ යෝජනාවක් හැටියට සලකලා කටයුතු කරන්නයි වෙන්නේ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මීට කලින් සභාවට යෝජනාව ගෙන එනකොට ඕක තිබුණේ නැහැ. ඡන්ද විමසීමට තමයි ගණපූරණය බැලුවේ. ඒක හරි. සභාවේ මේ යෝජනාව ගෙනැල්ලා සාකච්ඡා වනකොට ගණපූරණය නැහැ. අපි ඒක පිළිගත්තා. ඊට පස්සේ තමයි 107 (3) ට අපේ අවබෝධය ගියේ. සභා සම්මත වුණත් ඒකට ගණපූරණය නැත්නම් ඒක සභා සම්මත නොවූ යෝජනාවක් විධියට යනවා කියලා. ඉතින් ඒක තමයි පැහැදිලි කළේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක හරි.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

රීති අත්හිටුවීමේ යෝජනාවක් ගෙනැල්ලා තියෙන්නේ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒක පැහැදිලියි. එහෙම නම් මම නොවෙයි. සභාපතිතුමාට පළමුවැනි වරම ගණන් කරලා අවසන් වෙලා සභාවට කියන්න තිබුණා, මේක අහෝසි වුණු යෝජනාවක් විධියට. ඒකයි මම මෙතුමාට මතක් කළේ. මේකේ වැඩේ වෙලා තියෙන්නේ මම ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයා කියලා හැමදාම සභාපතිවරයා වෙන්න යනවා හෙක්ටර් බෙත්මගේ මන්ත්‍රීතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අවසන් වශයෙන් මම ස්තූතිවන්ත වෙනවා -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මගේ ප්‍රශ්නයට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කලින් ඔබතුමා ප්‍රශ්නය ඇහුවා නේ?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

නැහැ. කලින් ඔබතුමා කිව්වා පසුව අහන්න කියලා. පසුගිය හැන්සාඩ් වාර්තාවේ 21 වැනි පිටුවේ තිබෙනවා මම අහපු ප්‍රශ්නයකට අතුරු ප්‍රශ්න අහද්දී නිලධාරීන් එක්ක සොයා බලා ඊළඟ සභාවේදී පිළිතුරු දෙන්නම් කියලා ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ පැත්තෙන් ප්‍රකාශ කරනවා. මම මතු කරන්නේ, මීට පෙර අවස්ථා කිහිපයකදීත් පසුව උත්තර දෙන්නම් කියලා කිව්වා. නමුත් මේක න්‍යාය පත්‍රයේ කොහේවත් අන්තර්ගත වෙන්නෙත් නැහැ. එවැනි පසුව උත්තර දෙන්නම් කිව්වඒවාට ඒ අදාළ කරුණු පැහැදිලි කර ගැනීම් කරන්නේ කොහොමද? පිළිතුරු බලාපොරොත්තුවෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමා, මට මතකයි මෙතුමා ගියවරත් මේ ප්‍රශ්නය යොමු කළා. ඒ සම්බන්ධයෙන් ඔබතුමාට යම් පිළිතුරක් දෙන්න පුළුවන්ද?

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මගේ ළඟ තොරතුරු නැහැ. ඒ පිළිබඳව මම අපේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ව දැනුවත් කරලා තිබෙනවා. ඒක ඔබතුමා මාර්ගයෙනුත් නිලධාරීන් දැනුවත් කරලා තිබෙනවා. ඒ තොරතුරු ලැබුණු වහාම සභාවට ඉදිරිපත් කරන්න කටයුතු කරනවා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. රීති අත්හිටුවේ යෝජනාව සාකච්ඡා කරද්දී සිසිර ජයකොඩි ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ඉදිරිපත් කළා 67 (7) වගන්තිය,

*කිසියම් මන්ත්‍රීවරයෙකු අධිකරණයක විනිශ්චයට භාජනව ඇති කරුණක් සම්බන්ධයෙන් හෝ ...*

ඒ සම්බන්ධයෙන් අපේ ගැටළුවක් නැහැ.

*අධිකරණමය තීන්දුවක් අපේක්ෂා කරන කරුණක් සම්බන්ධයෙන් ...*

දැන් අපට මේ සභාවේ, ඔබතුමා මේක පිළිගත්තොත් මම අහන්නේ මේකයි. ඔබතුමා මේ කරුණ සම්බන්ධයෙන් පොලීසියේ පැමිණිල්ලක් දාලා කියන එක, අධිකරණමය තීන්දුවක් අපේක්ෂා කරන කරුණක් කියන එක පිළිගත්තොත් මේ සභාවේ ආයෙත් යෝජනා ගේන්න වෙන්නෙ නැහැ. මොකද, මීට කලින් අලුත්ගම සම්බන්ධයෙන් රීති අත්හිටුවීමේ යෝජනාවක් සාකච්ඡා කළා. පොලිස් පැමිණිලි තිබුණා. ඔබතුමා ඒ තීන්දුව ගත්තේ ආණ්ඩු පක්ෂයෙන් ඉදිරිපත් කළා කියලා මේ කරුණ සම්බන්ධයෙන් නම් ඔබතුමා පැහැදිලි කිරීමක් කරන්න පොලීසියේ පැමිණිල්ලක් කළ පමණින් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ කරුණ සම්බන්ධයෙන් නොවෙයි.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

එහෙම නම් මේ මන්ත්‍රීතුමා කියනවා පිළිගත්තේ නැහැ කියලා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

එතුමා බොරු කළේ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

එතුමා පිළිගත්තේ නැත්නම් ඔබතුමා කියන්න පිළිගන්නේ නැහැයි කියලා. අපට ඒක පිළිගන්න පුළුවන්. හැබැයි, මේක පදනම් කරගන්න බැහැ. මේක පූර්වාදර්ශය කරගත්තොත් එහෙම මේ සභාවේ කිසිම යෝජනාවක් ගේන්න වෙන්නේ නැහැ. අල්ලස් කොමිසමට හරි, පොලිසියට හරි, සමත මණ්ඩලයට හරි පැමිණිල්ලක් කළාට පස්සේ මේක සාකච්ඡා කරන්න බැරි නම් මොකක්ද මේ තත්ත්වය? ඒ නිසා ඔබතුමා කියන්න සිසිර ජයකොඩි ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා මේකට විරුද්ධ වීම සම්බන්ධයෙන් සභාව පිළිගන්නේ නැහැ කියලා. පූර්වාදර්ශයක් වෙන්න බැහැ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. මම මතු කරන කාරණය තමයි එතුමා කිව්වේ උසාවියේ නඩුවක් තියෙනවා කියලා ප්‍රකාශයක් විතරයි. නඩු අංකයක් නැහැ. උසාවිය නැහැ. මුකුත් නැහැ. එතකොට එහෙම ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා වගකීමක් දරන මන්ත්‍රීවරයෙක්. එහෙම සභාවකට ඇවිල්ලා මේකේ නඩුවක් තිබෙනවා, මේක උසාවියේ තිබෙනවා, මේක කථා කරන්න බැහැයි කිව්වාම ඔබතුමා ඒක පිළිගන්නවාද? එතුමාගේ ප්‍රකාශය පිළිබඳව ඔබතුමා ප්‍රකාශයක් කරන්න ඕනෑ. මොකද, එතුමා සභාව නොමඟ යවලා තියෙන්නේ. නඩු අංකයක් නැහැ. උසාවියක් නැහැ. එතුමා ඇවිල්ලා නිකම් කියනවා මේක උසාවියේ තියෙනවා කියලා. එහෙම කිව්වාම ඕනෑම මන්ත්‍රීවරයෙකුට යෝජනාවක් සම්බන්ධයෙන් ඇවිල්ලා කියන්න පුළුවන්. සාක්ෂියක් නැතුව, විස්තරයක් නැතුව, මේක උසාවියේ තියෙනවා. ගන්න බැහැ කියලා. එතුමා කියලා ගෙදරත් ගිහිල්ලා ඉවරයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් කථා කළා.

[සභාවේ ඝෝෂා]

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න. අපට කාලය පිළිබඳ ප්‍රශ්නයකුත් තිබෙනවා. මේ යෝජනාව සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් සාකච්ඡා කළා. විවිධ අදහස් ප්‍රකාශ කළා. විපක්ෂ නායකතුමා ඇතුළු සියලුම මන්ත්‍රී කණ්ඩායමටම ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා කියපු ප්‍රශ්නය සම්බන්ධයෙන් ඊළඟ සභාව වනකොට මම නීතිමය තත්ත්වය විමසලා බලනවා. සාමාන්‍යයෙන් අපි මේ සභාවේ ක්‍රියාත්මක කරන්නේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය. බස්නාහිර පළාත් සභාවේ ක්‍රියාත්මක වෙන්නෙ පාර්ලිමේන්තු සම්ප්‍රදාය. අපෙන් එහාට යනවා නම් අපට පුළුවන්කම තිබෙනවා සභා කටයුතු කාරක සභාවට ගිහිල්ලා සභා කටයුතු කාරක සභාවේ යෝජනා ඉදිරිපත් කරලා ඒ සම්බන්ධව රීති කාරක සභාවට ඉදිරිපත් කරලා මේ රීති පොතට දාන්න පුළුවන්. ඒ බලය අපට තිබෙනවා. මෙතෙක් අපි හැමදාම පාර්ලිමේන්තු සම්ප්‍රදාය තමයි යන්නේ. මෙතෙක් අපි හැමදාම කරන්නේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය තමයි යන්නේ. ඒකෙන් භාගේ හරි, ඒ විධියට තමයි යන්නේ. ඒ නිසා යම්කිසි ආකාරයකින් මේ යෝජනාව සම්බන්ධයෙන් ගැටළුවක් තිබුණොත් එහෙම, නොමඟ ඇරීමක් හරි මොකක් හරි සිද්ධ වෙලා තිබුණොත් ඒ සම්බන්ධයෙන් ඉදිරි සභාවට වාර්තාවක් ලබා දෙන්න මම බලාපොරොත්තු වෙනවා.

# කල් තැබීමේ යෝජනාව
## ADJOURNMENT

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, *"දැන් මෙම සභාව කල් තැබිය යුතු යැයි"* යෝජනා කරනවා.

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 01.28 ට, 2015 මැයි මස 12 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

*Accordingly, the Provincial Council was adjourned at 01.28 p.m till 09.30 a.m, on 12.05.2015.*